ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date. 2026.10.27

පැමිණිලි අංකය: HRC/SUOMOTU/05/2026

## 1. හැඳින්වීම

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මීගමුව බන්ධනාගාරය තුළ 2026 ජූලි මස 05 සහ 06 යන දිනයන්හි සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් සහ ඉන් අනතුරුව රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යැවීමේදී රැඳවියන්ට මුහුණදීමට සිදුවූ සිදුවීම් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුව තිබේද යන්න සොයා බැලීමට පැමිණිලි අංක HRC/SUOMOTU/05/2026 යටතේ මෙම ස්වයං-මෙහෙයවීම් විමර්ශනය ආරම්භ කරන ලදී.

මීගමුව බන්ධනාගාරය තුළ සිදු වූ වෙඩි තැබීම්, රැඳවියන් මියයාම සහ තුවාල ලැබීම මෙන්ම, ඉන් අනතුරුව මාරු කර යවන ලද රැඳවියන්ට අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට මුහුණ දීමට සිදු වූ බවට පළ වූ මාධ්‍ය වාර්තා සහ කොමිෂන් සභාව වෙත ලැබුණු සහ කොමිෂන් සභාව විසින් රැස්කර ගන්නා ලද තොරතුරු මෙන්ම සටහන් කරගන්නා ලද ප්‍රකාශයන් මෙම විමර්ශනයට මූලික පදනම විය.

## 2. විමර්ශනයේ අරමුණු

මෙම විමර්ශනයේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

1. මීගමුව බන්ධනාගාරය තුළ ඇති වූ ප්‍රචණ්ඩකාරී තත්ත්වය පාලනය කිරීමේදී නිලධාරීන් විසින් නීතියෙන් දක්වා ඇති කාර්යපටිපාටිය අනුව අවශ්‍ය බලය භාවිත කර ඇත්දැයි සොයා බැලීම.
2. සිද්ධියෙන් පසු රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමෙන් පසුව එම රැඳවියන් වධහිංසා වලට ලක්ව තිබේද යන්න පරීක්ෂා කිරීම.
3. සිරභාරයේ පසුවන පුද්ගලයන්ගේ වධහිංසාවන්ගෙන් තොරව සිටීමේ සහ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීමේදී බන්ධනාගාර බලධාරීන් සිය වගකීම පැහැර හැර ඇත්දැයි නිරීක්ෂණය කිරීම.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

4. රැඳවියන් දෙපාර්ශවයක් අතර ආරවුලක් හටගෙන තිබියදී, එය කලින් හඳුනාගෙන පාලනය කිරීමට පියවර නොගෙන බන්ධනාගාර බලධාරීන් සිය රාජකාරිය පැහැර හැර තිබේද නැතහොත් එම තත්ත්වය හිතාමතාම නොසලකා හැර තිබේද යන්න පිළිබඳව විමර්ශනය කිරීම.

## 3. විමර්ශන කාර්ය පටිපාටිය සහ ක්‍රමවේදය

මෙම වාර්තාව සකස් කිරීමේදී පහත සඳහන් සාක්ෂිමය කරුණු සහ ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී.

1. **ස්ථානීය පරීක්ෂණ:** සිද්ධිය වූ වහාම කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායම් මීගමුව බන්ධනාගාරය වෙත ගොස් සිදු කරන ලද නිරීක්ෂණ.
2. **ප්‍රකාශ සටහන් කර ගැනීම:** මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන්, සිද්ධිය ඇසින් දුටු රැඳවියන් සහ විවිධ බන්ධනාගාර වෙත මාරු කර යවන ලද රැඳවියන්ගෙන් ලබාගත් ප්‍රකාශ.
3. **ප්‍රාදේශීය වාර්තා කැඳවීම:** කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල හරහා දිවයිනේ අනෙකුත් බන්ධනාගාරවල වත්මන් තත්ත්වය සහ එහි රඳවා සිටින මීගමුව බන්ධනාගාරයේ සිට මාරු කළ රැඳවියන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂිත තත්ත්වයන් පිළිබඳ ලබාගත් වාර්තා.
4. **ලේඛනගත සාක්ෂි:** සිද්ධිය සම්බන්ධයෙන් පළ වූ පුවත්පත් වාර්තා, මාධ්‍ය නිවේදන, අධිකරණ වෛද්‍ය වාර්තා සහ වගඋත්තරකාර ආයතන විසින් ලබාදෙන ලද වාර්තා විශ්ලේෂණය කිරීම.

## 4. සිදුවීම පිළිබඳ සාරාංශය

මෙම සිද්ධියට මූලික වී ඇත්තේ මීගමුව බන්ධනාගාරයේ අංක 02 සහ 04 යන වාට්ටුවල රැඳවියන් අතර පැවති ආරවුලක් සහ "කාමර පාටි" ලෙස හඳුන්වන රැඳවියන් විසින් බන්ධනාගාර නිලධාරීන්ට තොරතුරු ලබා දෙන බවට අනෙක් රැඳවියන් තුළ පැවති වෛරයයි. 2026 ජූලි 05 වන දින බන්ධනාගාර නිලධාරීන්ගේ පාලනයෙන් ගිලිහී ගිය රැඳවියන් බන්ධනාගාර රෝහල සහ විනය අංශය බිඳ දමා එහි තිබූ ඖෂධ සහ මත්ද්‍රව්‍ය අධි මාත්‍රාවන්ගෙන් පරිභෝජනය කිරීම හේතුවෙන් තත්ත්වය තවදුරටත් දරුණු අතට හැරී ඇත.

2026 ජූලි 05 සහ 06 යන දෙදින පුරා පැවති මෙම ගැටුම්වලදී රැඳවියන් විසින් තවත් රැඳවියන් පිරිසක් සහ බන්ධනාගාර නිලධාරීන් කිහිප දෙනෙකු පහර දී ඝාතනය කර තිබේ. මෙම සිදුවීමෙන් බන්ධාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් 10 දෙනෙකුට සහ රැඳවියන් 22 දෙනෙකුට ජීවිත අහිමි වී ඇති අතර, නිලධාරීන් සහ රැඳවියන් ඇතුළු 100කට අධික පිරිසක් තුවාල ලබා ඇත.

සිද්ධියෙන් පසු ආරක්ෂක හේතූන් මත මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් වැලිකඩ, අඟුණුකොළපැලැස්ස, බූස්ස, දුම්බර, වාරියපොළ, කුරුවිට, යාපනය, මඩකලපුව, මොණරාගල, අනුරාධපුර සහ පොළොන්නරුව යන බන්ධනාගාර වෙත මාරු කර යවා ඇත.

# 5. ස්ථානීය පරීක්ෂණ වාර්තා

## 5.1 මීගමුව බන්ධනාගාරය තුළ සිදු කළ ස්ථානීය පරීක්ෂණය සහ සාක්ෂි විමසීම

ප්‍රධාන කාර්යාලයේ විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් 2026.07.22 වන දින මීගමුව බන්ධනාගාරය වෙත ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ප්‍රකාශයන් සටහන් කර ඇත. ඒ අනුව අනාවරණය වූ කරුණු පහත පරිදි වාර්තා කර ඇත.

එදින, බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා, ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා සහ ජේලර් ඒ.බී.සී. සී. පෙරේරා මහතා සමඟ වත්මන් තත්ත්වය පිළිබඳව සාකච්ඡා කර ඇත. පසුව කාන්තා නියාමක අචින්තා සඳරුවනි නිලධාරිනියගේ සහාය ඇතිව රැඳවුම් භාරයේ සිටි රැඳවියන් 20 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ඇත.

### *5.1.1 රැඳවියන්ගේ ප්‍රකාශ විශ්ලේෂණය*

විමර්ශන කණ්ඩායම විසින් ලබා ගන්නා ලද රැඳවියන් 20 දෙනාගේ ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය වී ඇත.

ප්‍රකාශ ලබා දුන් රැඳවියන්ගෙන් බහුතරයක් තමන් මෙම සිදුවීම් ඇසින් නොදුටු බවත්, ඒවාට සම්බන්ධ නොවූ බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් බන්ධනාගාර රෝහල කඩා එහි තිබූ ඖෂධ රැඳවියන් විසින් පානය කර සිටි බව ඔවුන් විසින් ප්‍රකාශ කර ඇත.

#### *N1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

මෙම රැඳවියාගේ ප්‍රකාශය අනුව 2026.07.05 දින 02 වන වාට්ටුවේ රැඳවියන් දෙදෙනෙකු ඝාතනය කර තිබූ අතර, ඔහු එම මළසිරුරු දැක තිබේ. එදින රැඳවියන් අතර දැඩි ගැටුමක් පැවති අතර කාන්තා රැඳවියන් වහලය මතට වී එම දර්ශන නරඹා ඇත. පිරිමි රැඳවියන් බන්ධනාගාර රෝහල කඩා ඖෂධ පානය කර මත්ව සිටි බවත්, කාන්තා රැඳවියන් දෙසට ඖෂධ බෝතල් විසි කළ බවත් ඔහු පවසා ඇත. 2026.07.06 දින නිලධාරීන් 10-15ක් පමණ පොලු සහ තුවක්කු සහිතව පැමිණි අවස්ථාවේ රැඳවියන් ඔවුන්ව වට කර පහර දී ඇත. එහිදී එක් නිලධාරියෙකු වැසිකිළිය තුළදී අමානුෂික ලෙස පහර දී මරා දැමූ බවත්, අධිකාරී කාර්යාලය තුළ සිරවූ නිලධාරීන්ද රැඳවියන් විසින් මරා දැමූ බවත් ඔහු ප්‍රකාශ කළේය. පසුව විශේෂ කාර්ය බලකා (STF) නිලධාරීන් පැමිණ වෙඩි තැබූ බව ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

#### *N2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

මෙම රැඳවියාගේ ප්‍රකාශය අනුව ගැටුම ආරම්භ වී ඇත්තේ 2026.07.05 වන දින දහවල් 1.00ට පමණ 02 වන වාට්ටුවේ රැඳවියන් දෙදෙනෙකු අතර ඇති වූ ආරවුලකිනි. 04 වන වාට්ටුවේ "කාමර පාටි" (Room Party) රැඳවියා මැදිහත් වීමෙන් පසු ගැටුම උත්සන්න වී තිබේ. 2026.07.06 වන දින

නිලධාරීන් රැඳවියන්ට පොලු වලින් පහර දුන් අතර රැඳවියන් නිලධාරීන්ව වට කරගෙන තිබේ. එහිදී නිලධාරීන් කළ වෙඩි තැබීම් වලින් රැඳවියන් දෙතුන් දෙනෙකුට වෙඩි වැදුණු බවත්, පසුව විශේෂ කාර්ය බලකා (STF) නිලධාරීන් පැමිණි බවත් ඔහු ප්‍රකාශ කර ඇත. මෙම ගැටුමට ප්‍රධාන හේතුව ලෙස ඔහු දක්වන්නේ "කාමර පාටි" රැඳවියන් විසින් නිලධාරීන්ට කේලම් කීමයි.

*N3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

බන්ධනාගාරය තුළ හෙරොයින් මත්ද්‍රව්‍යභාවිතය පිළිබඳව මෙම රැඳවියා කරුණු අනාවරණය කර ඇත. 02 වන සහ 07 වන වාට්ටුවල "කාමර පාටි" රැඳවියන් අතර පැවති වෛරය ගැටුමට මූලික වී ඇත. 2026.07.05 දින දහවල් සිට 2026.07.06 දින දහවල් වන තෙක් බන්ධනාගාරයේ සම්පූර්ණ පාලනය රැඳවියන් සතුව පැවති බවත්, නිලධාරීන් බන්ධනාගාරයෙන් බැහැරව සිටි බවත් ඔහු ප්‍රකාශ කර ඇත. රැඳවියන් රෝහලේ ඖෂධ සහ විනය අංශයේ තිබූ මත්ද්‍රව්‍යපානය කර සිහිවිකල්ලෙන් සිටි බවත්, පසුව පැමිණි විශේෂ කාර්ය බලකා (STF) නිලධාරීන් වෙඩි තැබූ බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඉහත ප්‍රකාශ සහ ස්ථානීය පරීක්ෂණ විමර්ශන කණ්ඩායම විසින් පහත නිරීක්ෂණ වාර්තා කර ඇත.

1. 2026.07.05 දින 02 සහ 04 වාට්ටුවල රැඳවියන් අතර ඇති වූ ගැටුම සහ "කාමර පාටි" රැඳවියන් පිළිබඳ පැවති ගැටලුව මෙම තත්ත්වයට මූලික වී ඇත.
2. 2026.07.05 දහවල් සිට 2026.07.06 දක්වා බන්ධනාගාරයේ අභ්‍යන්තර පාලනය බන්ධනාගාර බලධාරීන්ගෙන් ගිලිහී රැඳවියන් සතු වී තිබේ.
3. රැඳවියන් බන්ධනාගාර රෝහල සහ විනය අංශය බිඳ දමා එහි තිබූ ඖෂධ සහ මත්ද්‍රව්‍යපරිභෝජනය කර සිහිවිකල්ලෙන් හා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරී ඇත. මෙයට කාන්තා රැඳවියන්ගේ ද සම්බන්ධයක් පැවති බව නිරීක්ෂණය වේ.
4. රැඳවියන් විසින්ම තවත් රැඳවියන් පිරිසක් ඝාතනය කර ඇති අතර, 2016.07.06 වන දින බන්ධනාගාරය තුළට ඇතුළු වූ නිලධාරීන් කිහිප දෙනෙකු ද රැඳවියන්ගේ අමානුෂික පහරදීම් හමුවේ ඝාතනය වී තිබේ.
5. තත්ත්වය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකා (STF) නිලධාරීන් කැඳවා ඇත.

## 6. මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමට අදාළ තොරතුරු සහ රැඳවියන්ගේ ප්‍රකාශ

### 6.1 වැලිකඩ බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වයෙන් පසුව මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද

රැඳවියන්ගේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා 2026.07.10 වන දින සහ 2026.07.22 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් වැලිකඩ බන්ධනාගාරය වෙත ගොස් ඇත.

### *6.1.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරය වෙත රැඳවියන් 160 දෙනෙකු මාරු කර යවා ඇති අතර, එකී රැඳවියන් වැලිකඩ බන්ධනාගාරයේ වයිඕ (YO) වාට්ටුවේ රඳවා තබා ඇත.

### *6.1.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් අවස්ථා දෙකකදී එකී රැඳවියන් හමු වී ප්‍රකාශ ලබාගැනීම සිදු කර ඇත. ඒ අනුව 2026.07.10 වන දින රැඳවියන් 34 දෙනෙකුගෙන් ද, 2026.07.22 වන දින රැඳවියන් 27 දෙනෙකුගෙන් ද ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එලෙස සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

#### *W1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා මීගමුව බන්ධනාගාරයේ අංක 3 වාට්ටුවේ සිටි බවත්, එදින දහවල් කෑම පොලිමට ගිය බවත්, රැඳවියන් පැමිණ වාට්ටු වල දොරටුවල ඉබ්බෝ කැඩූ බවත්, ඔවුන් සොයා ඇත්තේ පාවා දෙන කට්ටිය බවත්, එලෙස පැමිණි රැඳවියන් විසින් කාමර පාට් හා පාට් යන රැඳවියන් සොයා සොයා ඔවුන්ට පහර දුන් බවත්, තමා සිර මැදිරියේ හිටි බවත්, 2026.07.05 දින සවස බන්ධනාගාරයේ තත්තවය සාමකාමීව තිබූ බවත් තිලංග ජයවර්ධන නම් රැඳවියා විසින් සඳහන් කර ඇත. 2026.07.06 දින උදැසන කොළඹින් පැමිණි නිලධාරීන් විසින් රැඳවියන්ට පොලු වලින් පහර දුන් නිසා රැඳවියන් විසින් ද ඔවුන්ට පහර දුන් බවත්, 2026.07.06 දින උදැසන 11.00ට තමා සිර මැදිරියේ සිටි බවත්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් (STF) ප්‍රධාන ගේට්ටුවෙන් මීගමුව බන්ධනාගාරයට ඇතුළු වී වෙඩි තැබීමට පටන් ගත් බවත්, තමා සිර මැදිරියේ සිට ඉදිරියට දුවන අවස්ථාවේ තමාට වෙඩි වැදුන බවත්, වෙඩි වැදුණු පසු තමා දෑස් පියාගෙන අත් දෙක එසවූ බවත්, අත්දෙක එසවූ විට තම දකුණු අතට වෙඩි තැබූ බවත්, ඉන් පැය භාගයකට පමණ පසු නිලධාරීන් විසින් තමා ඇඳක දමාගෙන මීගමුව රෝහල වෙත රැගෙන ආ බවත් W1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

#### *W2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා මීගමුව බන්ධනාගාරයේ වාට්ටුව ඇතුලේ සිටි බවත්, පිටත සිදු වූ සිදුවීම පිළිබඳව තමා දැනුවත් නොමැති බවත්, බන්ධනාගර පහසුකම් පිළිබඳ ප්‍රශ්න නිසා මෙම ගැටුම ආරම්භ වී ඇති බවත්, ආහාර, ඇඳුම් ආදිය සම්බන්ධ ප්‍රශ්න ඔවුන්හට තිබූ බවත්, 2026.07.06 දින උදේ ආහාරය ගැනීමෙන් අනතුරුව රැඳවියන් අතර පහර දීම් ආරම්භ වූ බවත්, පසුව තමා යකඩ ගේට්ටුව අසලට දිව ගොස් සැඟැවී සිටි බවත්, ඉන් අනතුරුව හමුදා සහ පොලිස් විශේෂ කාර්ය බලකා

නිලධාරීන් පැමිණ රැඳවියන් අතර සිදු වූ පහරදීම් වැලක්වූ බවත් W2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***W3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

බන්ධනාගර නිලධාරීන්ට කේලම් කියනවා කියා 2026.07.05 දින සවස රැඳවියන් අතර රණ්ඩුවක් ඇති වූ බවත්, 2026.07.06 වන දින මේ සිදුවීම තවත් දික් ගැස්සුනු බවත්, තමා බියෙන් වාට්ටුවේ සැඟැවී සිටි බවත්, පිරිසක් ලේ පෙරාගෙන දිව යනවා තමා දුටු බවත්, තමා හට වෙඩි ශබ්ද ඇසුණු බවත් W3 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***W4 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

2026.07.05 වන දින හේශිත සහ මිහිඳු යන කාමර පාටි රැඳවියන් දෙදෙනා අතර රණ්ඩුවක් ඇති වූ බවත්, තමා එය දුටු බවත්, තමා වාට්ටුවට වී සිටි බවත්, පහර දුන් පිරිස් වාට්ටුවල ඉබ්බන් කඩා දැමූ බවත්, 2026.07.06 දින වෙඩි හඬවල් ඇසුණ නමුත්, තමා පහර දීම් වලට සම්බන්ධ නොවුන බවත් W4 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***W5 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

2026.07.05 වන දින සිදුවීම පමණක් තමාට මතක තිබෙන බවත්, කාමර පාටි රැඳවියන් හේතුවෙන් දෙපාර්ශවයක් අතර රණ්ඩුවක් ඇති වූ බවත්, තමා ඒ පැත්තට යනවිට රැඳවියන් තමාට පහර දුන් බවත්, බන්ධනාගර නිලධාරීන් තමාව ගේට්ටුවට රැගෙන ගොස් ගිලන් රථයකට භාර දුන් බවත් W5 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***W6 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා මීගමුව බන්ධනාගරයේ විශේෂ සිර මැදිරියක රඳවා සිටි බවත්, 2026.07.05 වන දින ද තමා රැඳී සිටියේ එම සිරමැදිරියේම බවත්, එම සිරමැදිරියේ සීයකට අධික පිරිසක් රඳවා සිටි නමුත්, රැඳවීමට පහසුකම් ඇත්තේ රැඳවියන් 20ක් පමණක් බවත්, 2026.07.05 දින දිවා ආහාර වේලාවේදී විශාල කෑකො ගසන ශබ්දයක් ඇසුණු බවත්, තමා සිටි සිරමැදිරියෙන්ද පිරිසක් එළියට ගිය බවත්, ඔවුන් කෙසේ එළියට ගියා දැයි තමා නොදන්නා බවත් W-6 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත. සිර මැදිරියේ දොරේ ඉබ්බා දමා තිබූ බවත්, කාමර පාටි පැමිණි පසු ඔහු සමඟ සිර මැදිරියේ සිටි පිරිස ගොස් ඇති බව දැනගන්න ලැබුණු බවත්, ඉන්පසු සිර මැදිරියේ ඇති දොරවල් දෙකම කඩාගෙන පිරිසක් පැමිණි බවත්, ඒ පිරිස අතර අපේ සිර මැදිරියේ සිටි අය මෙන්ම පිටතින් පැමිණි අයද සිටි බවත්, එම පිරිස විසින් සිර මැදිරියේ සිටි රැඳවියෙකුට බැන වැදුනු බවත්, ‘සර්ලට මුන් පස්ස දෙනවා, කේලම් කියනවා’ වැනි දෑ ප්‍රකාශ කරමින් බැන වැදුනු බවත්, ඉන්පසු එම රැඳවියන් පිරිස තුවාල වූ රැඳවියන් සිර මැදිරියේ තබා එළියට ගිය බවත්, තවත් රැඳවියන් 100කට අධික පිරිසක් බන්ධනාගරයේ විනය අංශය, සහකාර බන්ධනාගාර අධිකාරී කාර්යාලය, ප්‍රධාන ජේලර් කාර්යාලය, බන්ධනාගාර

රෝහල කඩා දැමූ බවත්, එම කාමර වල තිබූ ඒවා රැඳවියන් පානය කළ බවත්, ජේලර් මහත්වරු කිසිවෙකු ඒ ස්ථානයට පැමිණියේ නැති බවත්, 2026.07.05 වන දින සවස බන්ධනාගාරය තුළ සාමකාමී තත්ත්වයක් පැවති බවත් W6 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

2026.07.06 වන දින උදෑසන 6ට පමණ බන්ධනාගාරයේ සියලු සිරමැදිරි විවෘත කර රැඳවියන් ගණන් කිරීම සිදු කළ බවත්, ඒ වන විට බන්ධ පොලිස් නිලධාරීන් 20ක් පමණ පැමිණ සිටි බවත්, එහිදී නිලධාරීන් සහ රැඳවියන් අතර නැවත බහින්බස්වීමක් සිදු වූ බවත්, එම නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දුන් බවත්, ලියාපදිංචි කිරීම් කටයුතු සිදු කරන කාර්යාලය සහ බන්ධනාගාර අධිකාරී කාර්යාලය මැද ඇති කුඩා වැසිකිළිය තුළ නිලධාරීන් හතර පස් දෙනෙකු හට රැඳවියන් විසින් මේස කකුල් සහ පොලු වලින් පහර දුන් බව තමා දුටු බවත්, තම සිරමැදිරියේ දොර අගුළු නොතිබූ බැවින් තමා ද පිටතට පැමිණ බන්ධනාගාර අධිකාරී කාර්යාලයට ගිය බවත්, එම ස්ථානයේ රැඳවියන් 10ක් 15ක් පමණ එක් වී ජේලර්වරයෙකුට පහරදෙන බව තමා දුටු බවත්, එම අවස්ථාවේ දී තමා කෑසමින් එම නිලදාරියාට පහරදීම නතර කරන ලෙසට ඉල්ලා සිටි බවත්, එවිට නිලධාරීන්ගේ පැත්ත ගන්නා බවට තමාට ද බැන වැදුනු බවත්, ඉන්පසු රැඳවියන් පිටව ගිය පසු තමා එකී ජේලර්වරයාගේ කරට අත දමාගෙන ඔහුව පිටතට රැගෙන එමින් සිටි අවස්ථාවේ දී ජේලර්වරයාට සහ තමාට රැඳවියන් විසින් පහර දුන් බවත්, තමාගේ හිස පැළුණු බවත්, ශරීරයේ තැලුම් තුවාල ද ඇති බවත්, තමා ජේලර්වරයා බේරාගැනීමට උත්සහ කළ නමුත්, රැඳවියන් එම ජේලර්වරයාගේ ඇඳුම් ගලවා ඔහුට පහරදුන් බවත්, ජේලර්වරයාගේ හිසට පොලු වලින් පහර දුන් බවත්, එම ජේලර්වරයා අවුරුදු 55ක පමණ අයෙකු බවත්, එකී ජේලර්වරයාව රැඳවියන් විසින් පහර දී මරා දැමූ බවත්, තමාව එම ස්ථානයේ තිබූ තණකොළ ගොඩකට දැමූ බවත්, ඉන්පසුව ගිලන් රථයකින් තමාව මීගමුව රෝහල වෙත රැගෙන ආ බවත් W6 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

### *W7 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 දින ඒ1 සහ ඒ2 වාට්ටු අතර මෙම ප්‍රශ්නය ඇති වූ බවත්, රිමාන්ඩ් භාරයේ සිටි රැඳවියන් පිරිසක් විසින් තවත් රැඳවියන් දෙදෙනෙකුට පහර දී මරණයට පත් කළ බව තමා දුටු බවත්, තමාට ද පහර දුන් බවත්, ඒ නිසා එම සිදුවීම ගැන හරියට මතකයක් නොමැති බවත්, බන්ධනාගාරයේ පරිපාලනය වෙනස් කිරීමට සුරේෂ් නම් රැඳවියා කල්ලි ගැසී මෙම ගැටුම ඇති කළ බවත් W7 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

### *W8 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

තමා කාමර පාටියේ සිටින බවත්, තමා බන්ධනාගර ගත වූයේ සොරකමට බවත්, 2026.07.05 වන දින උදේ 11:45 පමණ තමා විනය අංශය අසල සිටි බවත්, කැටුවැල්ලේගම සුරේෂ්, හලාවත ජෝජ් ඇතුළු පිරිසක් 2 වාට්ටුවේ කාමර පාටි මිහිදු යන අයට පහර දුන් බවත්, 4 වාට්ටුවේ කාමර පාටි ඉසිතට ද පහර දුන් බවත්, තමා බන්ධනාගාර අධිකාරී කාර්යාලයේ වැසිකිලියේ සැඟවී සිටි බවත්, සුරේෂ් නම් රැඳවියා

ගේ මල්ලී කෙනෙකු විසින් බන්ධනාගාර අධිකාරී කාර්යාලය කඩා තමාව එළියට ගෙන මේසයක කකුලකින් තමාගේ හිසට පහර දුන් බවත්, එලෙස පහර දෙනු ලැබුවේ කොච්චිකඩේ අමිත් සහ තවත් කිහිපදෙනෙකු විසින් බවත්, ඉන් පසුව තමාව මීගමුව රෝහලට ඇතුළත් කළ බවත්, තම හිසට මැහුම් 20ක් පමණ දමා ඇති බවත්, 2026.07.08 වන දින තමාව වැලිකඩ බන්ධනාගාරයට යොමු කළ බවත් W7 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

### *6.1.3 රැඳවියන් හට වධහිංසා පැමිණවීම පිළිබඳ නිරීක්ෂණ*

කොමිෂන් සභාව විසින් අවස්ථා දෙකකදී රැඳවියන් 61 දෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශවලදී, ඇතැම් රැඳවියන් මීගමුව සිට වැලිකඩ බන්ධනාගාරය වෙත ඇතුළත් කිරීමේදී වැලිකඩ බන්ධනාගාරයේ නිලධාරීන් විසින් ඔවුන්ට පහර දුන් බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ඔවුන්ගේ ශරීර පරීක්ෂා කිරීමේදී තැලීම් සහ තුවාල සලකුණු නිරීක්ෂණය වී ඇත. මුල් දිනයේ සිදු වූ එම පහරදීමෙන් පසුව කිසිදු බලපෑමක් සිදු නොවූ බව රැඳවියන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

2026.07.06 වන දින රාත්‍රී 9.15ට කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකු විසින් වැලිකඩ බන්ධනාගාරයේ ඒ වන විට පැවති තත්ත්වය සහ මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන්ගේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වැලිකඩ බන්ධනාගාරය වෙත ගිය අවස්ථාවේ දී වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් විසින් ඒ සඳහා අවස්ථාව ලබා දී නොමැත. රාත්‍රී කාලයේ දී කිසිදු බාහිර පාර්ශවයකට බන්ධනාගාරය තුළට ඇතුළුවීමට අවස්ථාව ලබා නොදෙන ලෙස බන්ධනාගාර අධිකාරී විසින් දැනුම් දී ඇති බැවින් කොමිෂන් සභාවේ නිලධාරීන් හට බන්ධනාගාර පරිශ්‍රය වෙත ඇතුළු වීමට ඉඩ ලබාදිය නොහැකි බව එම අවස්ථාවේ මාර්ග බාධක රාජකාරියෙහි සිටි නිලධාරියා විසින් දැනුම් දී ඇත. ඒ අනුව 2026.07.06 වන දින වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණයට අවස්ථාව නොදීම හා ඊට අදාළ අනෙකුත් කරුණු සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2026.07.14 වන දින වැලිකඩ බන්ධනාගාර අධිකාරීවරයා සහ ප්‍රධාන ජේලර්වරයා ඇතුළු වැලිකඩ බන්ධනාගාරයට අනුයුක්ත නිලධාරීන් කිහිප දෙනෙකු කොමිෂන් සභාව හමුවට කැඳවා කොමිෂන් සභාවේ සභාපතිතුමා, කොමසාරිස්වරුන්, පරීක්ෂණ සහ විමර්ශන අංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වා ඇත.

මෙම සාකච්ඡාවේදී, 2026.07.06 වන දින කොමිෂන් සභා නිලධාරීන් හට වැලිකඩ බන්ධනාගාරය තුළට ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත බරපතල හා නිදහසට හේතු නොමැති උල්ලංඝනය කිරීමක් බවත්, කොමිෂන් සභා පනත මගින් පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම වේලාවක ඕනෑම රැඳවුම් ස්ථානයකට ඇතුළු වීමට කොමිෂන් සභාව වෙත පැහැදිලිවම බලය පැවරී ඇති බවත් අවධාරණය කර ඇත. වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි පිළිබඳව චෝදනා පිළිබඳ තොරතුරු ලැබී ඇති විට, බන්ධනාගාර වල සුභසාධනය පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට කොමිෂන් සභාවට ඇති අධිකාරි බලය එම ක්‍රියාව මගින් දැඩි ලෙස අවතක්සේරු කිරීමක් වන බවත්, 2026.07.06 වන දින තීරණාත්මක අවස්ථාවක

ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම මඟින් චෝදනා පිළිබඳව එලදායි ලෙස හා අවශ්‍ය කාලරාමුව තුළ විමර්ශනය කිරීමේ අවස්ථාව අහිමි වී ඇති බවත් වැඩිදුරටත් අවධාරණය කර ඇත.

එසේම, එම සාකච්ඡාවේ දී 2026.07.06 වන දින රාත්‍රී 9.15ට පමණ සිදු කළ එම නිරීක්ෂණ සංචාරයේදී, කොමිෂන් සභා නිලධාරීන්ගේ ආරක්ෂාව සහතික කළ නොහැකි තත්ත්වයක් වැලිකඩ බන්ධනාගාරය තුළ උද්ගතව තිබූ බව බන්ධනාගාර නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇති අතර, එම අවස්ථාවේ බන්ධනාගාර නිලධාරින් හය දෙනෙකු පමණ රාජකාරියේ යෙදී සිටි බවත්, බන්ධනාගාරය තුළ රැඳවියන් අතර ඇතිවී තිබූ නොසන්සුන් තත්ත්වයක් සමඟ ඔවුන්ට කටයුතු කරමින් සිටීමට සිදුවූ බවත්, මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා අතරතුර බන්ධනාගාර නිලධාරීන් ඝාතනය කිරීමට පළිගැනීමක් ලෙස මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන්ට පහර දීමට බන්ධනාගාර නිලධාරීන් පිරිසක් සැලසුම් කර ඇති බවට නිලධාරීන්ට තොරතුරු ලැබී තිබූ බවත්, බන්ධනාගාර නිලධාරීන් අතර භේදයක් පැවති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස වැලිකඩ බන්ධනාගාරයේ තත්ත්වය අතිශය නොසන්සුන් සහගතව පැවති බවත් සාකච්ඡාව සඳහා සහභාගී වූ වැලිකඩ බන්ධනාගාරයේ නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත්, වැලිකඩ බන්ධනාගාරය වෙත පැමිණි කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත මෙම කරුණු පැහැදිලිව දැනුම් දී නොතිබූ බව ඔවුන් පිළිගන්නා ලද අතර, සන්නිවේදන දුර්වලතාවය පිළිබඳව එම නිලධාරීන් කනගාටුව පළ කරමින් අනාගතයේදී මෙවැනි සිදුවීම වළක්වා ගැනීමට වග බලා ගැනීමට පොරොන්දු වී ඇත.

කෙසේවෙතත් වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් එම අවස්ථාවේ ගනු ලැබූ තීරණ සහ හැසිරීම කොමිෂන් සභාවට පැවරී ඇති බලයට අගෞරව සහගත බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළ අතර, එම නිලධාරීන් විසින් සපයන ලද පැහැදිලි කිරීම පිළිබඳව සෑහීමකට පත් නොවන බවත්, කුමන තත්ත්වයන් යටතේ වුවද, බන්ධනාගාර පරිශ්‍රය තුළ ආරක්ෂාව දුර්වල වී ඇති බව පිළිබඳව දැනුම් දීමට අපොහොසත් වීම පිළිගත නොහැකි බවත් කොමිසන් සභාව නිරීක්ෂණය කර ඇත.

කොමිෂන් සභාව වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් සමඟ තවත් කරුණු කිහිපයක් සාකච්ඡා කර ඇත. මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන් කිහිප දෙනෙකු ඔවුන්ට වධ හිංසා පැමිණවීම සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම වැනි අයුතු සැලකිලි ඇතුළු පළිගැනීම් වලට ලක්ව ඇති බවට කොමිෂන් සභා නිලධාරීන්ට පැමිණිලි කර ඇත. සමහර රැඳවියන් තුවාල ලබා සිටින බවත්, ඒ සඳහා ඔවුන්ට එම අවස්ථාව වන විටත් වෛද්‍ය ප්‍රතිකාර ලැබී නොතිබූ බවත් නිරීක්ෂණය වූ බව කොමිෂන් සභාවේ නිලධාරීන් වාර්තා කර ඇත. බන්ධනාගාරයේ අනෙකුත් රැඳවියන්ගෙන් වෙන් වූ විට පහරදීමට ලක් වේ යැයි බියෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට මැලිකමක් දක්වන බව සමහර රැඳවියන් ප්‍රකාශ කර ඇත.

මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන් සිටින ස්ථානය ඔවුන්ගේ ළඟම ඥාතීන්ට දැනගැනීම සහතික කිරීම සඳහා ඔවුන් යොමු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් ද

කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත. 2018 අංක 5 දරන බලහත්කාර අතුරුදහන් කිරීම් වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත යටතේ, රඳවා තබා ඇති ඕනෑම පුද්ගලයෙකු සිටින ස්ථානය හෙළි කිරීමට දීර්ඝ කාලයක් තිස්සේ අපොහොසත් වීම නඩු පැවරිය හැකි වරදක් විය හැකි බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. තවද, මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද ඇතැම් රැඳවියන් ඔවුන්ගේ සිර දඬුවම් කාලය අවසන් වීමෙන් පසු නිදහස් කිරීමට නියමිතව සිටි නමුත් තවමත් නිදහස් කර නොමැති බවට කොමිෂන් සභාව වෙත තොරතුරු ලැබී තිබුණි. එවැනි සිරකරුවන් දිගටම රඳවා තබා ගැනීම නීති විරෝධී වන බවද කොමිෂන් සභාව වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි මෙන්ම අත්අඩංගුවේ සිටියදී සිදු වූ මරණ සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාරයේ හා පසුව ඇති වූ අනෙකුත් බන්ධනාගාර වල සිදුවීම් ගැන ද විමර්ශනය තවදුරටත් සිදුකරගෙන යන බව කොමිෂන් සභාව ප්‍රකාශ කළ අතර, දැනට පැවැත්වෙන විමර්ශනයට උපරිම සහයෝගය ලබා දෙන ලෙස ද වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ට පහත සඳහන් නිර්දේශ නිකුත් කර ඇති අතර, මෙම නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහතික කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රාජකාරී ආවරණය කරන) වෙතින් ඉල්ලා සිට ඇත.

1. ඕනෑම අවස්ථාවක සහ පූර්ව දැනුම්දීමකින් තොරව රැඳවුම් ස්ථාන වලට ඇතුළු වී පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිත බලය ඇති බව බන්ධනාගාර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛයක් මගින් කඩිනම් පියවර ගැනීම.
2. මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන්ට එරෙහිව කිසිඳු ආකාරයක පළිගැනීම් වලින් (වධ හිංසා පැමිණවීම සහ අත්‍යවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප කිරීම ඇතුළුව වෙනත් ආකාරයේ අයුතු සැලකිලි ආදිය) වැළකී සිටීමට සියලුම බන්ධනාගාර නිලධාරීන්ට නියෝග නිකුත් කිරීම හා එවැනි නියෝග වලට අනුකූල වන බවට දැඩි ලෙස නිරීක්ෂණය කිරීම, පළිගැනීමේ ක්‍රියාවන්හි යෙදෙන ඕනෑම නිලධාරියෙකුට එරෙහිව කඩිනම් විනය ක්‍රියාමාර්ග ගැනීම සහ සුදුසු ක්‍රියා මාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාවට සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට එවැනි ඕනෑම සිදුවීමක් වාර්තා කිරීම.
3. මීගමුව බන්ධනාගාරයේ සිට මාරු කරන ලද සියලුම රැඳවියන් සිටින ස්ථාන ඔවුන්ගේ ළඟම ඥාතීන්ට අනාවරණය කිරීමට කඩිනම් පියවර ගැනීම.
4. සිර දඬුවම් කාලය සම්පූර්ණ කර ඇති සිරකරුවන් ප්‍රමාදයකින් තොරව නිදහස් කිරීම තහවුරු කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.

#### *6.1.4 සෞඛ්‍ය සහ වෛද්‍ය පහසුකම්*

මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරයේ වෙත මාරු කර එවන ලද සියලුම රැඳවියන් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක NGB/MCI/PC/16655/26-B දරණ නඩුවේ නියෝගයට අනුව 2026.07.22 වන දින සිට මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරයේ වෙත මාරු කර එවන ලද සියලුම රැඳවියන් කොළඹ ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. එසේම, ප්‍රතිකාර අවශ්‍ය රැඳවියන් වැලිකඩ බන්ධනාගාර රෝහල වෙත ද ඇතුළත් කර ප්‍රතිකාර ලබා දී ඇත.

## 6.2 අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය

මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ වත්මන් තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.22 සහ 2026.07.28 යන දිනයන්හිදී අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණ පවත්වා පහත කරුණු පිළිබඳව වාර්තා කර ඇත.

#### *6.2.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත රැඳවියන් මාරු කිරීම අවස්ථා කිහිපයකදී සිදුව ඇත. 2026.07.06 දින මීගමුව බන්ධනාගාරයේ සිට රැඳවියන් 150 දෙනෙකු ද, 2026.07.07 වන දින රැඳවියන් 120 දෙනෙකු ද, 2026.07.09 දින තවත් කාන්තා රැඳවියන් 20 දෙනෙකු වශයෙන් රැඳවියන් 290 දෙනෙකු අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත යොමු කර තිබේ.

මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන් අතරින් උඩවල හේවගේ සඳුන් චතුරංග (සැක අංක 4008) යන රැඳවියා 2026.07.07 වන දින අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත පැමිණ ඇති අතර, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය තුළට ඇතුළු කිරීමට පෙර ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමේ දී එම රැඳවියා අසනීප තත්ත්වයෙන් පසුවන බව දැක අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ නිලධාරීන් විසින් එදිනම එනම්, 2026.07.07 වන දින රාත්‍රී 10ට පමණ අඟුණකොළපැලැස්ස රෝහලට ඇතුළත් කර ඇත. එදින රාත්‍රී 10.30ට ඔහු රෝහලේ දී මිය ගොස් ඇත. තංගල්ල මූලික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් 2026.07.09 වන දින ඔහුව පරීක්ෂා කර ඇති අතර මරණය සම්බන්ධයෙන් විවෘත තීන්දුවක් ලබා දී ඇත.

#### *6.2.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් අවස්ථා දෙකකදී එකී රැඳවියන් හමු වී ප්‍රකාශ ලබාගැනීම සිදු කර ඇත. ඒ අනුව 2026.07.20 වන දින රැඳවියන් 30 දෙනෙකුගෙන් ද, 2026.07.28

වන දින රැඳවියන් 60 දෙනෙකුගෙන් ද ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එලෙස සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

***A1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා 2025.09.27 දින මීගමුව පොලිස් ස්ථානය මගින් මත්ද්‍රව්‍ය චෝදනා මත අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බන්ධනාගාර ගත කළ බවත්, මීගමුව බන්ධනාගාරයේ 07 වාට්ටුවේ සිටි බවත්, තමා ඇතුළු 7 වාට්ටුවේ සිටි අය වාට්ටුව ඇතුළට දමා වසා තිබූ බවත්, තමා ගැටුමට සම්බන්ධ නොවූ බවත්, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත එවන තුරු මීගමුව බන්ධනාගාරයේ 7 වාට්ටුවේ සිටි බවත්, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ දී පහර දීමක් සිදුවූ බවත්, මේ වන විට එම තුවාල සුව වී ඇති බවත්, ප්‍රතිකාර ලබා දීම් සිදු කළ බවත්, ඊට පසුව ගැටළුවක් ඇති නොවූ බවත් A1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***A2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා 2025.12.31 වන දින කටාන පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බන්ධනාගාර ගත කළ බවත්, මීගමුව බන්ධනාගාරයේ 07 වාට්ටුවේ රඳවා තිබූ බවත්, මේ අතරතුරදී මීගමුව බන්ධනාගරයේ ගැටුමක් ඇති වූ බවත්, තමා ඊට සම්බන්ධ නොවූ බවත්, ගැටුමෙන් පසුව අඟුණකොළ පැලැස්ස බන්ධනාගාරයට එවූ බවත්, එහි පැමිණි පළමු දින පහරදීමක් සිදු වූ බවත්, මෙම පහර දීමෙන් තමාගේ දකුණු කකුලේ විලුඹ ආසන්නයේ වේදනාවක් තිබෙන බවත් A2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***A3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා 2026.07.06 වන දින රාත්‍රී මීගමුව බන්ධනාගරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගරයට බස් රථයකින් රැගෙන ආ බවත්, බස් රථයෙන් බැස පෝලිමේ සිටින විට බන්ධනාගර නිලධාරීන් දසදෙනෙකු පමණ පැමිණ කේබල් වලින් සහ පොලු වලින් තමා ඇතුළු පිරිසට පහරදුන් බවත්, තමාගේ පිටට සහ හිසට එම පහරවල් වැදුනු බවත්, ඉන්පසුව ලියාපදිංචි කළ බවත්, පාන්දර වාට්ටුවලට ගෙන ගිය බවත්, වාට්ටුවට යන විට ද තමාට බෙල්ට් එකකින් හිසට පහරක් ගැසූ බවත්, පහර දුන් නිලධාරීන් හඳුනාගත නොහැකි වූ බවත් A3 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***A4 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

2026.07.01 වන දින සිට තමා මීගමුව බන්ධනාගාරයේ අංක 8 වාට්ටුවේ සිටි බවත්, මීගමුව බන්ධනාගරයේ මෙම ගැටුම ඇති වූ 2026.07.05 සහ 06 යන දිනවල ද අංක 8 වාට්ටුවේම සිටි බවත්, තමා ගැටුමට සම්බන්ධ නොවූ බවත්, තමාට කිසිදු තුවාලයක් සිදු නොවූ බවත්, එම ගැටුම නිසා තමාට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට ඒමට සිදු වූ බවත්, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට

පැමිණි මුල් දිනයේ ‘උඹලා ඔක්කොම මේකට සම්බන්ධයි නේද’ යනුවෙන් පවසා බන්ධනාගාර නිලධාරීන් විසින් පහර දුන් බවත්, තමාගේ පිටට 20,25 වතාවක් පමණ පහර දුන් බවත්, එම පහරවල් පිටේ තිබෙන බවත්, තමාට පහර නොදෙන ලෙස නිලධාරීන්ට පැවසූ බවත්, ඉන්පසුව තමාට පහර නොදුන් බවත්, පසුව තමාව පුනුරුත්තාපන කඳවුරකට දැමූ බවත්, අනතුරුව කිසිදු ප්‍රශ්නයක් ඇති නොවූ බවත්, පහරදීම් සම්බන්ධයෙන් වෛද්‍යවරයාට පැවසූ පසු වෛද්‍යවරයා සටහන් තබාගෙන ඖෂධ ලබා දුන් බවත් A4 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***A5 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා මීගමුව බන්ධනාගරයේ 08 වාට්ටුවේ සිටි බවත්, 2026.07.05 සහ 2026.07.06 දින මීගමුවේ ඇති වූ ගැටුම නිසා බන්ධනාගර බස් රථයකින් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට රැගෙන ආ බවත්, තමා කිසිම ගැටුමකට සම්බන්ධ නොමැති බවත්, බන්ධනාගර බස් රථයෙන් බැස්ස තැන සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවියන් ලියාපදිංචි කරන ස්ථානයට රැගෙන එන තුරු බන්ධනාගාර නිලධාරීන් විසින් තමා ඇතුළු මීගමුව බන්ධනාගාරයෙන් පැමිණි රැඳවියන් හට කේබල් වලින්, වයර් වලින් සහ චේන් වලින් පහර දුන් බවත්, තමාගේ පිටට එම පහරවල් වැදුනු බවත්, එම පහරවල් පිටේ තිබෙන බවත්, පසුව ලියාපදිංචි කර ආහාර ලබා දී කර්මාන්ත අංශයේ වාට්ටුවට යැවූ බවත්, ඉන්පසුව පහරදීම් සිදු නොවූ බවත්, පහරදීමෙන් ඇති වූ තුවාල බන්ධනාගර රෝහලේදී වෛද්‍යවරයාට පෙන්වූ බවත්, වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර සටහන් තබාගෙන ඖෂධ ලබා දුන් බවත් A5 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***A6 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා 2026.07.06 වන දින වෛරස් උණ රෝගයෙන් පෙළුණු බවත්, එදින තමා 11 වාට්ටුවේ සිටි බවත්, තමා කිසිම ගැටුමකට සම්බන්ධ නොවූ බවත්, ඒ සිද්ධියෙන් පස්සේ 2026.07.06 දින රාත්‍රියේ බස් රථයෙන් අඟුණකොළපැලැස්ස බන්ධනාගරයට රැගෙන ආ බවත්, බන්ධනාගර බස් රථයෙන් බැසීමෙන් පසුව බන්ධනාගර නිලධාරීන් විසින් සියලු දෙනාටම පහර දුන් බවත්, එවිට තමාට ද පහර දුන් බවත්, තමාව ලියාපදිංචි කිරීමෙන් අනතුරුව කර්මාන්ත අංශයට යොමු කළ බවත්, කර්මාන්ත අංශයට ඇතුළු වන අවස්ථාවේ දී නිලධාරියෙකු විසින් බෑග් පටියකින් තම කොන්දට පහර දුන් බවත්, එම පහරවල් තිබෙන බවත්, ඉන්පසුව පහරදීම් සිදු නොවූ බවත්, පහරදීමෙන් ඇති වූ තුවාල බන්ධනාගර රෝහලේදී වෛද්‍යවරයාට පෙන්වූ බවත්, වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර සටහන් තබාගෙන ඖෂධ ලබා දුන් බවත් A6 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***6.2.3 රැඳවියන් හට වධහිංසා පැමිණවීම පිළිබඳ නිරීක්ෂණ***

රැඳවියන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමේදී වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් වාර්තා වී ඇත. ඇතැම් රැඳවියන් මීගමුව සිට අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය වෙත ඇතුළත් කිරීමේදී බන්ධනාගාර නිලධාරීන් විසින් ඔවුන්ට පහර දුන් බව සඳහන් කර ඇත. 2026.07.28 වන දින ශ්‍රී ලංකා මානව

හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත ගොස් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයේ දී මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන්ගේ ශරීරවල තැලීම් සහ තුවාල සලකුණු නිරීක්ෂණය වී ඇති අතර, එකී තුවාල එම අවස්ථාව වන විට සුව වෙමින් පවතින සලකුණු දක්නට ලැබී ඇත. රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත්තේ අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ නිලධාරීන් විසින් ඔවුන් හට කේබල්, වයර්, පොලු ආදිය භාවිත කරමින් පහරදුන් බවයි. කෙසේ වෙතත්, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට පැමිණි මුල් දිනයේ සිදු වූ පහරදීමෙන් පසුව නැවත කිසිදු බලපෑමක් සිදු නොවූ බව රැඳවියන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### *6.2.4 සෞඛ්‍ය සහ වෛද්‍ය පහසුකම්*

මාරු කර එවන ලද සියලුම රැඳවියන් 2026.07.09 දින වන විට බන්ධනාගාර වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර තිබූ අතර, අවශ්‍යරැඳවියන් සඳහා ප්‍රතිකාර ලබා දී තිබුණි. ඕනෑම අවස්ථාවක බාධාවකින් තොරව වෛද්‍යවරයා හමුවීමේ පහසුකම් සලසා දී ඇති බව අනාවරණය විය.

විශේෂයෙන්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් යුත් ලිඛිත නියෝගයක් (අංක: MGB/MCI/PC/166555/26-B) අනුව, 2026.07.28 දින රැඳවියන් 40 දෙනෙකු විශේෂ අධිකරණ වෛද්‍යවාර්තා ලබා ගැනීම සඳහා කෑගල්ල අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ගොස් තිබුණි.

රැඳවියන්ගේ අධිකරණ කටයුතු සාමාන්‍ය පරිදි සිදුවන බව බලධාරීන් පැවසුවද, ප්‍රායෝගික ගැටලු කිහිපයක් විමර්ශනයේදී අනාවරණය වී ඇත.

- ඇතැම් රැඳවියන්ට අධිකරණයෙන් ඇප නියම කර තිබුණද, එම ඇප අත්සන් කිරීමට අවශ්‍යනියෝග මෙතෙක් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය වෙත ලැබී නොමැති බව වාර්තා විය.
- ඇතැම් රැඳවියන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත දිනවලදී ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන්, තමන්ගේ මීළඟ නඩු දිනය පිළිබඳව ඔවුන් අවබෝධයකින් තොරව පසුවන බව නිරීක්ෂණය විය.
- සැක අංක 3014 දරන සජිත් දිශාන් විජයතුංග නැමැති රැඳවියාට මහාධිකරණයෙන් ඇප ලැබී තිබුණද, ඔහුගේ ජාතික හැඳුනුම්පත අස්ථානගත වීම සහ රියදුරු බලපත්‍රය කඩුවෙල පොලිස් භාරයේ තිබීම (නඩු අංකය නොදන්නා බැවින්) හේතුවෙන් අනන්‍යතාව තහවුරු කර ගැනීමට නොහැකි වී තිබේ. මේ සම්බන්ධයෙන් බන්ධනාගාර අධිකාරීවරයා ප්‍රකාශ කළේ පොලිස් පැමිණිල්ල සහ ග්‍රාම නිලධාරී සහතික ඇතුළු මූලික ලේඛන ලැබුණු පසු ඔහුගේ අත්සන සහතික කර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට සහාය විය හැකි බවයි.

#### *6.2.5 සුභසාධනය සහ මූලික අවශ්‍යතා*

සියලුම රැඳවියන්ට තම පවුලේ ඥාතීන් සමඟ දුරකථනයෙන් සම්බන්ධ වීමට අවස්ථාව ලබා දී ඇති අතර, ඒ හරහා තමන් සිටින ස්ථානය පිළිබඳව නිවෙස් දැනුවත් කිරීමට ඔවුන්ට හැකි වී තිබේ. සැක අංක 1420 දරන කේ. එච්. කසුන් මධුෂංක යන රැඳවියාගේ බිරිඳ වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටින බැවින්, ඇය සමඟ දුරකථනයෙන් කතා කිරීමට ඔහු කළ ඉල්ලීමට අධිකාරීවරයා එකඟත්වය පළ කර ඇත.

බොහෝ රැඳවියන්ට නිවැසියන් විසින් ඇඳුම් ලබා දී තිබුණද, ඇතැම් රැඳවියන්ට පවතින ඇඳුම් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වී ඇත. මේ පිළිබඳව බන්ධනාගාර අධිකාරීවරයා සමඟ සාකච්ඡා කළ අවස්ථාවේ දී ඔහු විසින් අවශ්‍යඇඳුම් ලබා දීමට එකඟ වී ඇත.

රැඳවියන්ගෙන් බහුතරයක් මීගමුව අවට පදිංචිකරුවන් වන බැවින්, ඔවුන්ගේ ඥාතීන්ට අඟුණුකොළපැලැස්ස වෙත පැමිණීමට ඇති ආර්ථික අපහසුතාව සහ දුර ප්‍රමාණය සලකා, තමන්ව නැවත මීගමුවට හෝ ආසන්නතම බන්ධනාගාර වන වාරියපොළ, අනුරාධපුර හෝ කුරුණෑගල යන බන්ධනාගාර වෙත මාරු කරන ලෙස රැඳවියන් ඉල්ලීම් කර ඇත.

### 6.3 දුම්බර බන්ධනාගාරය

මීගමුව බන්ධනාගාරය තුළ ඇති වූ සිදුවීම්වලින් අනතුරුව මීගමුව බන්ධනාගාරයේ සිට මහනුවර දුම්බර බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද කාන්තා රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් 2026.07.09 වන දින දුම්බර බන්ධනාගාරය වෙත ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදුකර පහත කරුණු වාර්තා කර ඇත.

#### *6.3.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

2026.07.08 වන දින රාත්‍රියේ මීගමුව බන්ධනාගාරයේ සිට කාන්තා රැඳවියන් 43 දෙනෙකු දුම්බර බන්ධනාගාරය වෙත මාරු කර එවා ඇත. විමර්ශනය සිදු කරන අවස්ථාව වන විට දුම්බර බන්ධනාගාරය තුළ මීගමුව බන්ධනාගාරයේ සිට පැමිණි පිරිමි රැඳවියන් 316 ක් සහ කාන්තා රැඳවියන් 43 ක් වශයෙන් මුළු රැඳවියන් 359 දෙනෙකු රඳවා සිටින බව නිරීක්ෂණය වී ඇත.

#### *6.3.2 රැඳවියන් හට වධහිංසා පැමිණවීම් පිළිබඳ නිරීක්ෂණ*

සිවිල් සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලිවලට අදාළව, මාරු කර එවන ලද කාන්තා රැඳවියන්ගෙන් සවිස්තරාත්මකව කරුණු විමසා ඇත. මෙම නිරීක්ෂණ කටයුතු සඳහා විශේෂිත මනෝ උපදේශිකාවකගේ සහයෝගය ද ලබා ගැනීමට ද කටයුතු කර ඇත. එහි දී රැඳවියන් හට පහරදීමක් සිදු වූ බවට කිසිදු ප්‍රකාශයක් හෝ සාක්ෂියක් ලැබී නොමැති බව අනාවරණය වී ඇත.

මෙම රැඳවියන් පිරිස කාන්තා රැඳවියන් සඳහා වෙන් වූ විශේෂිත ආරක්ෂිත කුටියක රඳවා ඇති බව නිරීක්ෂණය වී ඇත.

### *6.3.3 සෞඛ්‍ය, සුභසාධනය සහ සන්නිවේදනය*

කාන්තා රැඳවියන්ගේ මූලික අවශ්‍යතා සහ සුභසාධන තත්ත්වයන් පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය වී ඇත.

- කාන්තා රැඳවියන්ට අවශ්‍ය වෛද්‍යපහසුකම් ලබා දී ඇති අතර, ඔවුන්ගේ සනීපාරක්ෂක අවශ්‍යතා සඳහා සනීපාරක්ෂක තුවා ද ලබා දීමට බන්ධනාගාර බලධාරීන් කටයුතු කර තිබුණි.
- මෙම රැඳවියන් රඳවා සිටින විශේෂිත ආරක්ෂක කුටිය තුළ අවශ්‍යසියලු මූලික පහසුකම් පවතින බව නිරීක්ෂණය වී ඇත.
- තම දූ දරුවන් හෝ ඥාතීන් හමුවීමට රැඳවියන්ගේ දෙමාපියන්ට අවශ්‍යඅවස්ථාව සලසා දී ඇති බව සඳහන් කර ඇත.

විමර්ශන කණ්ඩායම විසින් බෝගම්බර බන්ධනාගාරයේ පොදු යටිතල පහසුකම් නිරීක්ෂණය කිරීමේදී අඩුපාඩු කිහිපයක් හඳුනා ගෙන ඇත.

1. බන්ධනාගාරය තුළ ඇති "Body Scanner" යන්ත්‍රය ක්‍රියාවිරහිත වී පවතින බව නිරීක්ෂණය වී ඇත.
2. බන්ධනාගාරය තුළ රැඳවියන් සඳහා පවතින ජල පහසුකම් ප්‍රමාණවත් නොවන අතර එය දැඩි ගැටලුවක් බව නිරීක්ෂණය වී ඇත.
3. රැඳවියන් රඳවා තැබීම සඳහා පවතින ඉඩකඩ පහසුකම් ඔවුන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වී ඇත.

## 6.4 බූස්ස බන්ධනාගාරය

මීගමුව බන්ධනාගාරය තුළ ඇති වූ සිදුවීම්වලින් අනතුරුව මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් 2026.07.14 වන දින බූස්ස බන්ධනාගාරය වෙත ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ඇත.

### *6.4.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත රැඳවියන් මාරු කිරීම අවස්ථා කිහිපයකදී සිදුව ඇත. 2026.07.06 දින මීගමුව බන්ධනාගාරයේ සිට රැඳවියන් 68 දෙනෙකු ද, 2026.07.07 වන දින රැඳවියන් 59 දෙනෙකු ද, 2026.07.27 දින රැඳවියන් 03 දෙනෙකු වශයෙන් රැඳවියන් 130 දෙනෙකු බූස්ස බන්ධනාගාරය වෙත යොමු කර තිබේ.

2026.07.07 වන දින මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන් අතරින් ජයසූරිය කරුණාගේ නිශාන් බුද්ධික පෙරේරා (සැක අංක 3470) යන රැඳවියා හට ඇති වූ අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026.07.07 වන දින ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුළත් කර ඇත. ඔහු රෝහලේ දී මිය ගොස් ඇත. ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරිය විසින් 2026.07.09 වන දින ඔහුව පරීක්ෂා කර ඇති අතර මරණය සම්බන්ධයෙන් විවෘත තීන්දුවක් ලබා දී ඇත.

### *6.4.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් මීගමුව බන්ධනාගාරයෙන් බූස්ස බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමු වී ප්‍රකාශ ලබාගැනීම සිදු කර ඇත. ඒ අනුව රැඳවියන් 21 දෙනෙකුගෙන් ද ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එලෙස ප්‍රකාශ ලබාදුන් සියලු රැඳවියන් ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් කිසිදු ගැටුමකට සම්බන්ධ නොවූ බවත්, මීගමුව බන්ධනාගාරයේ දී හෝ බූස්ස බන්ධනාගාරයේ දී ඔවුන් පහරදීම් වලට ලක් නොවූ බවත් ය. එකී ප්‍රකාශ ලබා දුන් රැඳවියන්ගේ ඉල්ලීමක් වී ඇත්තේ ඔවුන් හට ප්‍රමාණවත් ඇඳුම් ලබාදෙන ලෙස සහ නිවැසියන් දැනුවත් කර නිවැසියන් හමුවීමට අවස්ථාව සලසා දෙන ලෙස ය.

2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම මෙහෙයවා ඇත්තේ 'සුරේෂ්' නම් රැඳවියා විසින් බවට ඇතැම් රැඳවියන් සහ බන්ධනාගාර නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ ලබා දීමේ දී සඳහන් කර තිබූ අතර, මාධ්‍ය මගින් ද එවැනි තොරතුරක් ප්‍රචාරය විය. 2026.07.07 වන දින එකී රැඳවියා මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත යවා ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.14 වන දින කේ.ඒ. සුරේෂ් පුෂ්පකුමාර (සිර/සැක අංක 4423) යන රැඳවියාගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, එහිදී ඔහු සඳහන් කර ඇත්තේ තමා 2026.07.07 වන දින මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත බස් රථයකින් රැගෙන ආ බවත්, තමාහට පැවසීමට දෙයක් නොමැති බවත් ය. කෙසේවෙතත්, මෙම රැඳවියාගේ දකුණු කකුලේ වලලුකර ආසන්නයේ ඉදිමුවක් ඇති බවට නිරීක්ෂණය වීම හේතුවෙන් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් ඒ පිළිබඳව විමසා ඇති අතර, එහිදී එම රැඳවියා විසින් "මොකුත් නැහැ" යනුවෙන් ප්‍රකාශ කළ බවත්, තොරතුරු ලබාදීමට මැලිකමක් දක්වන බවත් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සටහන් යොදා ඇත.

ඉන් අනතුරුව 2026.07.24 වන දින කොමිෂන් සභාවේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණය (National Preventive Mechanism) මගින් බූස්ස බන්ධනාගාරයට ගොස් බන්ධනාගාරයේ රඳවා තබා ගැනීමේ තත්ත්වයන්, රැඳවියන්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාමාර්ගයන් ආදිය නිරීක්ෂණය කර ඇති අතර, මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත මාරු කරන ලද රැඳවියන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. මෙම නිරීක්ෂණ

චාරිකාවේ දී රැඳවුම් තත්ත්වයන් සෘජුවම නිරීක්ෂණය කිරීම, බන්ධනාගාර බලධාරීන් සමඟ සාකච්ඡා කිරීම සහ නිලධාරීන්ගෙන් වෙන්ව රැඳවියන් සමඟ සාකච්ඡා කිරීම සිදු කර ඇත.

එහිදී මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද "C" විශේෂ සිරමැදිරියේ රඳවා සිටි රැඳවියන් දොළොස් දෙනාගෙන් නව දෙනෙකු සමඟ කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් සාකච්ඡා කර ඇත. එම සාකච්ඡාවන් වලදී බන්ධනාගාර නිලධාරීන් විසින් එකී රැඳවියන් ශාරීරික සහ මානසික හිංසනයන්ට ලක් කරන බවත්, සිර මැදිරිවලින් පිටත රැඳී සිටීමට අවසර දී ඇති කාලය සීමා කර ඇති බවත් තවදුරටත් හිංසනයන්ට ලක්වේය යන බිය නිසා, ඇතැම් රැඳවියන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට යාමෙන් වැළකී සිටින බවත්, ආහාර ලබා දුන් ආකාරය පිළිබඳ ගැටළු පවතින බවත් කොමිෂන් සභාවේ නිලධාරීන් අනාවරණය කරගෙන ඇත.

ඒ අනුව මෙම රැඳවියන්ට සිදු කරනු ලබන පහරදීම් නැවත සිදු වීම වළක්වාලීමට සහ නිලධාරීන් සහ රැඳවියන් අතර ගැටුමක් ඇති වීම වලක්වාලීමට පහත පියවර අනුගමනය කිරීමට අවශ්‍ය මැදිහත් වීම කඩිනමින් සිදු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත අංක HRC/RM/NPM/BOO/2026/32 සහ 2026.07.25 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත.

1. මීගමුව බන්ධනාගාරයේ සිට රැගෙන ආ රැඳවියන් අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමුකර එක් එක් රැඳවියා වෙත අධිකරණ වාර්තා ලබාගැනීමට කටයුතු කිරීම සහ එම වාර්තාවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම,
2. මීගමුව බන්ධනාගාරයේ සිට රැගෙන එන ලද කොටුගොඩ වසන්ත නමැති රැඳවියා හට බන්ධනාගාර නිලධාරීන් සිදු කරන ලද දැඩි පහරදීම් සහ නිසි ප්‍රතිකාර ලබානොදීම නිසා මරණයට පත් වූ බව ඇසින් දුටු සාක්ෂි පවතින බව රැඳවියන්ගේ තොරතුරු මගින් අනාවරණය වූ බැවින් එම මරණය සම්බන්ධයෙන් සුදුසු නීතිමය කටයුතු සිදු කිරීම,
3. මෙම රැඳවියන් හට පහර දුන් නිලධාරීන් මේ වන විටත් බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරයේ රාජකාරී කරන බව නිරීක්ෂණය වන බැවින් එම නිලධාරීන් සඳහා ඉදිරි නීතිමය කටයුතු ආරම්භ කිරීම,
4. බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය තුළ මීගමුව බන්ධනාගාරයෙන් රැගෙන ආ රැඳවියන් රඳවා ඇති ස්ථානයන් සහ ඔවුන්ගේ නාම ලේඛනයන් වෙන් වෙන් වශයෙන් කඩිනමින් යොමු කිරීම.

ඉහත ලිපියට පිළිතුරු වශයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.අ) විසින් අංක කේ05/05/මානවහිමිකම්/2026 සහ 2026.07.28 දිනැති ලිපිය යොමු කරමින් කොමිෂන් සභාවේ නිලධාරීන් 2026.07.24 වන දින බූස්ස බන්ධනාගාරයේ සංචාරය කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු වලට අදාලව ගෙන ඇති පියවර සම්බන්ධයෙන් පහත පරිදි කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව,

1. මීගමුව බන්ධනාගාරයේ රඳවා සිටි සියළුම රැඳවියන්ගේ අධිකරණ වෛද්‍ය වාර්තා ලබා ගැනීම සඳහා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර නියෝග ලබා ගෙන ඇති බවත්, ඒ අනුව මේ වන විට එම සියළු රැඳවියන් අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කරනු ලබන බවත්,
2. මීගමුව බන්ධනාගාරයේ සිට මාරු කරන ලද රැඳවියකු වන කොටුගොඩ වසන්න නැමැති අය මිය යාම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති බවත්, කොටුගොඩ වසන්ත යන නම ඔහු විසින් බූස්ස බන්ධනාගාරය වෙත ඇතුලත් කිරීමේදි ලබා දී ඇති නම වන බවත්, මෙම සැකකරුගේ නිවැරදි නම් ජේ. කේ නිශාන්ත බුද්ධික පෙරේරා බවට ලේඛන පරීක්ෂාවේ දී අනාවරණය වී ඇති බවත්, මෙම මිය යාමට අදාළව අධිකරණයට හා රත්ගම පොලිස් ස්ථානයට කරුණු වාර්තා කර අධිකරණ කටයුතු සිදුවන බවත්, බන්ධනාගාරය මගින් මූලික විමර්ශනයක් ද සිදු කරමින් පවතින බවත්,
3. එලෙස එම මරණයට අදාළව අධිකරණ කටයුත්තක් සහ මූලික විමර්ශනයක් සිදුවන බැවින් එම විමර්ශනයෙන් අනාවරණය වන කරුණු අනුව හා අධිකරණ නියෝග පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත්,
4. මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරයට මාරු කරන ලද රැඳවියන් හට එකිනෙකාට නැවත කල්ලි ගැසීමට නොහැකි වන පරිදි බූස්ස බන්ධනාගාරයේ A,B,C,D,E සහ F අංශ වල රැඳවීමට කටයුතු කර ඇති බවත්,
5. මෙම රැඳවියන්ට හිංසාවක් පීඩාවක් ඇති නොවන පරිදි කටයුතු කිරීමට සියළුම නිලධාරින් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීමට බූස්ස බන්ධනාගාර අධිකාරී වෙත අවශ්‍ය සියලු උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.අ) විසින් දැනුම් දී ඇත.

තවද, බූස්ස බන්ධනාගාරයේ කාර්ය මණ්ඩල හිඟයක් පවතින බවත්, සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් හා සම්බන්ධිත සිරකරුවන් සහ අධි අවදානම් සහිත සිරකරුවන් මෙම බන්ධනාගාරය තුළ රඳවා සිටින බැවින් නිලධරීන්ගේ පුද්ගලික ආරක්ෂාව සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව පිළිබඳ ගැටළු මතු වී ඇති බවත් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අනාවරණය කරගෙන ඇත. එබැවින් නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි ආරක්ෂිතව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සහාය වීම සඳහා කාර්ය මණ්ඩලය, ආරක්ෂාව, නවාතැන්, සුභසාධනය, පුහුණුව සහ මෙහෙයුම් සම්පත් වැඩිදියුණු කිරීම අවශ්‍ය වන බව ද හඳුනාගෙන ඇත.

## 6.5 යාපනය බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට යාපනය බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ

නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.09 වන දින යාපනය බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණ පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.5.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට යාපනය බන්ධනාගාරය වෙත රැඳවියන් 60 දෙනෙකු 2026.07.07 වන දින යොමු කර තිබේ. යාපනය බන්ධනාගාරයේ බී1 සහ බී2 යන වාට්ටුවල එකී රැඳවියන් රඳවා ඇත.

### *6.5.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.09 වන දින යාපනය බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට යාපනය බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් මීගමුව බන්ධනාගාරයේ අංක 6 සහ 7 වාට්ටුවල රඳවා සිටි බවත්, 2026.07.05 වන දින දහවල් 12.30ට පමණ බන්ධනාගාරය තුළ කලබලකාරී වාතාවරණයක් හටගත් බවත්, එදින ප.ව. 6.30ට පමණ බන්ධනාගාරයේ තත්ත්වය නැවත සාමකාමී වූ බවත්, නැවතත් ඊට පසුදින එනම්, 2026.07.06 වන දින බන්ධනාගාරය තුළ කලබලකාරී වාතාවරණයක් හටගත් බවත්, තත්ත්වය සාමාන්‍ය අතට පත්වන තුරු ඔවුන් වාට්ටු තුළට වී සිටි බවත්, පසුව පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් පැමිණ ඔවුන්ව වාට්ටු වලින් පිටතට ගත් බවත්, ඉන්පසුව යාපනය බන්ධනාගාරය වෙත රැගෙන ආ බවත්, යාපනය බන්ධනාගාරය තුළ දී ඔවුන් හට අවශ්‍යපහසුකම් ලැබෙන බවත්, දුරකථන මාර්ගයෙන් ඥාතීන් සම්බන්ධ කරගැනීමට යාපනය බන්ධනාගාරයේ නිලධාරීන් විසින් අවස්ථාව සලසා දුන් බවත්, ඔවුන්ට අදාළ නඩු කටයුතු සඳහා සහභාගී වීමට මීගමුව බන්ධනාගාරය වෙත ඉක්මනින් යාමට අපේක්ෂා කර බවත් ය.

මෙම රැඳවියන් විසින් ඔවුන් හට කිසිදු තුවාලයක් සිදු නොවූ බව ප්‍රකාශ කර ඇති අතර, ඔවුන්ගේ ශරීරවල තුවාල ඇති බවට නිරීක්ෂණය නොවන බවට කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් ද සටහන් යොදා ඇත.

## 6.6 මඩකලපුව බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.09, 10 සහ 23 යන දිනවල මඩකලපුව බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණ පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.6.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත රැඳවියන් 60 දෙනෙකු යොමු කර ඇත. ඔවුන් අතරින් 55 දෙනෙකු සිංහල ජාතිකයන් ද, 4 දෙනෙකු දෙමළ ජාතිකයන් ද, එක් අයෙකු මුස්ලිම් ජාතිකයෙකු ද වේ.

### *6.6.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.09, 10 සහ 23 වන දිනවල මඩකලපුව බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් අතරින් බහුතරය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් 2026.07.05 සහ 06 දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම් වලට සම්බන්ධ නොවූ බවයි. ඇතැම් රැඳවියන් විසින් සඳහන් කර ඇත්තේ, නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දුන් බව ඔවුන් දුටු බවයි.

මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හට ගැටලු පවතින බව කොමිෂන් සභාවේ නිලධාරීන් හට නිරීක්ෂණය වී ඇත. ඒ අතරින් මූලිකම ගැටලුවක් වී ඇත්තේ සන්නිවේදන අපහසුතාවයන් ය. මඩකලපුව බන්ධනාගාරයේ මූලික සන්නිවේදන භාෂාව දෙමළ භාෂාව වන බැවින් මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් අතරින් සිංහල ජාතික රැඳවියන් 55 දෙනාහට දෙමළ භාෂා අවබෝධයක් නොමැති වීම හේතුවෙන් සන්නිවේදන ගැටලු පවතින බව ඔවුන් විසින් සඳහන් කර ඇත. එසේම, කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.09 සහ 10 වන දිනවල මඩකලපුව බන්ධනාගාරය වෙත ගිය අවස්ථාවේදී මීගමුව බන්ධනාගාරයේ සිට පැමිණි ඇතැම් රැඳවියන් ප්‍රකාශයක් ලබා දීමට හැකි මානසික මට්ටමක නොසිටි බවත්, පසුව 2026.07.23 වන දින කොමිෂන් සභාවේ නිලධාරීන් නැවත මඩකලපුව බන්ධනාගාරය වෙත ගිය අවස්ථාවේදී ඔවුන් ප්‍රකාශ ලබා දී ඇති බවත් ස්ථානීය පරීක්ෂණ සඳහා සහභාගී වූ කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් වාර්තා කර ඇත.

මීගමුව බන්ධනාගාරයේ සිට මඩකලපුව බන්ධනාගාරය වෙත යොමු කරන ලද සියලු රැඳවියන්ගේ ඥාතීන් හට ඔවුන් සිටින ස්ථානය පිළිබඳව දැනුවත් කර ඇති බවත්, පවතින ජල හිඟයට පිළියම් ලබා දීම සඳහා මඩකලපුව මහා නගර සභාවේ සහය ලබාගෙන ඇති බවත් මඩකලපුව බන්ධනාගාරයේ නිලධාරීන් විසින් තහවුරු කළ බවත් ස්ථානීය පරීක්ෂණ සඳහා සහභාගී වූ කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් වාර්තා කර ඇත.

එසේම, මඩකලපුව බන්ධනාගාරයේ ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා ඇති බැවින් රැඳවියන් හට අවශ්‍යපහසුකම් සැලසීමේ දී එය මූලික ගැටලුවක් වී ඇති බවත්, නිලධාරීන්ගේ හිඟතාවයක් ද පවතින බවත්, එය පරිපාලනමය වශයෙන් ගැටලු ඇති වීමට හේතුවක් වී ඇති බවත් කොමිෂන් සභාවේ නිලධාරීන් හට නිරීක්ෂණය වී ඇත.

## 6.7 කුරුවිට බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට කුරුවිට බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.10 වන දින කුරුවිට බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණයක් පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.7.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට කුරුවිට බන්ධනාගාරය වෙත රැඳවියන් 171 දෙනෙකු යොමු කර ඇත. එකී රැඳවියන් 171 දෙනා කුරුවිට බන්ධනාගාරයේ එච් වාට්ටුවේ අනෙකුත් රැඳවියන් ගෙන් වෙන්කොට රඳවා තැබීමට කටයුතු කර ඇත.

### *6.7.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.10 වන දින කුරුවිට බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට කුරුවිට බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් අතරින් 15 දෙනෙකු ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ප්‍රකාශ ලබා දී ඇත. එලෙස ප්‍රකාශ සටහන් කර ගන්නා අවස්ථාවේදි ද රැඳවියන් තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වූ මත් වූ ස්වභාවයන් නිරීක්ෂණය වී ඇත. එකී ප්‍රකාශ තුළින් අනාවරණය වී ඇත්තේ, බන්ධනාගාරයේ රැඳවියන් රඳවා සිටින වාට්ටුවල පරිපාලන කටයුතු සඳහා නිලධාරීන් හට සහය දැක්වීමට "කාමර පාටි" ලෙස රැඳවියන් යොදා ගෙන ඇති බවත්, එකී රැඳවියන් විසින් සාමාන්‍ය රැඳවියන්ට වදහිංසා පමුණුවන බවට බන්ධනාගාර අධිකාරීවරයා වෙත වාචිකව පැමිණිලි කළද, පරිපාලනය විසින් ඒවා නොසලකා හැරීම හරහා රැඳවියන් තුළ පාටි ලෙස කටයුතු කරන රැඳවියන් කෙරෙහි දැඩි වෛරයක් පැවතී ඇති බවත්, ඒ හේතුවෙන් මෙම ගැටුම මූලික අදියරේදී නිලධාරීන්ට එරෙහිව සිදු වූවක් නොවන බවත්, "කාමර පාටි" ලෙස කටයුතු කළ රැඳවියන්ගේ පීඩනයට එරෙහිව සාමාන්‍ය රැඳවියන් විසින් දියත් කළ කැරල්ලක් බවත්, නිලධාරීන් ඉලක්ක වී ඇත්තේ, පසුව සිදු වූ පාලනය බිඳ වැටීම මත බවත් ය. එලෙස සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

### *K1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින රැඳවියන් දෙදෙනෙකු අතර පහරදීමක් සිදු වූ බවත්, නිලධාරීන් පැමිණ තමා ඇතුළු රැඳවියන් හට පහර දුන් බවත්, තමාට මැහුම් 16ක් දමා ඇති බවත්, බන්ධනාගාරය පාලනය කරන්නේ නිලධාරීන් නොව රැඳවියන් බවත් K1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***K2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

2026.07.05 වන දින දහවල් ආහාරය ලබා ගන්නා අවස්ථාවේදී විශාල ශබ්දයක් ඇසුණු බවත්, තමා අංක 8 වාට්ටුවට ගිය බවත්, බන්ධනාගාරය පාලනය කරන ලද්දේ "පාටි" ලෙස කටයුතු කරන රැඳවියන් විසින් බවත්, එම "පාටි" රැඳවියන් විසින් විනය අංශයේ නිලධාරීන් හට අසත්‍ය තොරතුරු ලබාදෙන බවත්, ඒවා අසා විනය අංශයේ නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දෙන බවත්, මේ නිසා "පාටි" රැඳවියන් සහ අනෙක් රැඳවියන් අතර 2026.07.05 වන දින ගැටුම් ඇති වූ බවත්, තමා ඒවාට සම්බන්ධ නොවූ බවත්, ගැටුම් හේතුවෙන් තුවාල ලැබූ සහ මිය ගිය පිරිස, රැඳවියන් විසින්ම බන්ධනාගාර රෝහල වෙත ඔසවාගෙන ගිය බව තමා දුටු බවත් K2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***K3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

බන්ධනාගාරයේ සිටින "පාටි" ලෙස කටයුතු කරන රැඳවියන් විසින් අනෙක් රැඳවියන් සම්බන්ධයෙන් නිලධාරීන් හට අසත්‍ය තොරතුරු ලබාදීම නිසා එම රැඳවියන් දෙපාර්ශවය අතර 2026.07.05 වන දින ගැටුම් ඇති වූ බවත්, කෙසේවෙතත් එදින සවස් වන විට බන්ධනාගාරයේ තත්ත්වය සාමකාමී වාතාවරණයක් ගෙන තිබූ බවත්, ඊට පසුදින එනම්, 2026.07.06 වන දින උදෑසන ආහාර ලබා දීමට පෙර රැඳවියන් වාට්ටු වලින් පිටත සිටි නිසා නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දුන් බවත්, එයින් මුළු බන්ධනාගාරයම කැළඹුණු බවත්, රැඳවියන් විසින් නිලධාරීන් හට පහර දීමට පටන් ගත් බවත්, නිලධාරීන් විසින් ලී දොරෙන් ඇතුළට වෙඩි තැබූ බවත්, ඉන්පසුව රැඳවියන් විසින් ද වෙඩි තැබූ බවත්, පසුව තත්ත්වය සාමකාමී වූ පසු රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත යොමු කළ බවත්, ඒ අනුව තමා කුරුවිට බන්ධනාගාරය වෙත පැමිණි බවත් K3 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

## 6.8 මොණරාගල බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වයෙන් පසුව මීගමුව බන්ධනාගාරයේ සිට මොණරාගල බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන්ගේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා 2026.07.10 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් මොණරාගල බන්ධනාගාරය වෙත ගොස් ඇත.

### *6.8.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

2026.07.07 වන දින මීගමුව බන්ධනාගාරයේ සිට මොණරාගල බන්ධනාගාරය වෙත රැඳවියන් 40 දෙනෙකු යොමු කර ඇත.

### *6.8.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් 2026.07.10 වන දින මීගමුව බන්ධනාගාරයෙන් මොණරාගල බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් 40 දෙනාගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එකී රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත්තේ 2026.07.05 වන දින රැඳවියන් 15ක් 20ක් පමණ වාට්ටුවෙන් වාට්ටුවට යමින් කාමර පාටි රැඳවියන් සොයමින් පහර දුන් බවත්, ඒ හේතුවෙන් රැඳවියන් අතර ගැටුම් ඇති වූ බවත්, 2026.07.06 වන දින බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දීම හේතුවෙන් රැඳවියන් ද පෙරලා එම නිලධාරීන් හට පහර දීමෙන් විශාල ගැටුමක් උද්ගත වූ බවත් ය. එලෙස රැඳවියන්ගෙන් සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

#### *M1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා දහවල් ආහාර ලබා ගැනීමට පෝලිමේ සිටියදී රැඳවියන් පිරිසක් පැමිණ "කාමර පාටි" රැඳවියන් සොයමින් ඔවුන් හට පහර දුන් බවත්, 2026.07.06 වන උදෑසන වැලිකඩින් පැමිණි බන්ධ පොලිස් නිලධාරීන් (බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන්) විසින් වාට්ටු වලින් පිටත සිටි රැඳවියන් හට පහර දුන් බවත්, ඉන් අනතුරුව අනෙක් රැඳවියන් වහලවල් සහ දොරවල් වල ඉබ්බන් කඩා දමා පිටතට පැමිණ නිලධාරීන් හට පහර දුන් බවත්, එම නිලධාරීන් මිය ගිය බව පසුව දැනගත් බවත්, 2026.07.07 වන දින රාත්‍රියේ තමා මොණරාගල බන්ධනාගාරය වෙත පැමිණි බවත්, බස් රථයෙන් බැස මොණරාගල බන්ධනාගාරය වෙත පැමිණෙන අවස්ථාවේදී මොණරාගල බන්ධනාගාර නිලධාරීන් විසින් පහර දුන් බවත්, රැඳවියන් පරීක්ෂා කරන ස්ථානයේ දී ද මුහුණට සහ කොන්දට නිලධාරීන් විසින් පහර දුන් බවත්, ඉන් අනතුරුව ගේට්ටුවෙන් ඇතුලට පැමිණ වාට්ටුව වෙත දණ ගාගෙන ගිය බවත්, ඒ අවස්ථාවේදීත් නිලධාරීන් විසින් තමාට පහර දුන් බවත්, මොණරාගල බන්ධනාගාරයට පැමිණි දිනට පසුදින එනම්, 2026.07.08 වන දින ලියාපදිංචි කරන ස්ථානයේ දී ද කාමරයකට ගෙන ගොස් දණ ගස්සවා යටි පතුල් වලට නිලධාරීන් විසින් පොල්ලකින් පහර දුන් බවත්, ඒ වේලාවේදී දැඩි වේදනාවක් දැනුණු බවත්, දින දෙකක් ඇවිදීමට නොහැකි වූ බවත්, වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබාගත් බවත්, පහර දෙන අවස්ථාවේදී මොල්ලිගොඩ නම් නිලධාරියා පැමිණ පහර නොදෙන ලෙසට දැනුම් දුන් බැවින් පහරදීම නැවතුනු බවත්, තමා මීගමුව බන්ධනාගාරයේ ගැටුමට සම්බන්ධ නොවූ බවත් M1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

#### *M2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා මීගමුව බන්ධනාගාරයේ අංක 8 වාට්ටුවේ සිටි බවත්, එදින දහවල් ආහාරය ලබාගෙන වාට්ටුවේ සිටින විට රැඳවියන් පිරිසක් දොරගුළු කඩා වාට්ටුවට ඇතුළු වී "කාමර පාටි" සෙවූ බවත්, ඊට පසු දින එනම්, 2026.07.06 වන දින වෙනත් නිලධාරීන් පිරිසක් තමා සිටි වාට්ටුවට පැමිණ

රැඳවියන් පිරිසකට පහරදුන් බවත්, එයින් බේරීම සඳහා රැඳවියන් වහල කඩා පිටතට ගිය බවත්, ඉන්පසුව ගැටුම වැඩි වූ බවත්, තමාට වෙඩි ශබ්ද ඇසුණු බවත්, තමා 2026.07.07 වන දින මොණරාගල බන්ධනාගාරයට පැමිණි බවත්, මොණරාගල බන්ධනාගාරයේ දී තමාට පහරදීමක් සිදු නොවූ නමුත්, දණ ගාමින් අඩි 20ක පමණ දුරක් යන ලෙස නිලධාරීන් විසින් නියෝග කළ බවත්, ඒ හේතුවෙන් දණහිස් තුවාල වූ බවත් M2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

*M3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා දහවල් ආහාරය ගැනීමට සූදානම් වූ අවස්ථාවේදී යකඩ පොලු රැගත් රැඳවියන් පිරිසක් පැමිණ "කාමර පාටි" රැඳවියන් හට පහර දුන් බවත්, එදින බෙහෙත් බොමින් සිටි පිරිසක් තමාට ද බෙහෙත් ලබා දුන් බවත්, තමා ඒවා පානය කිරීම හේතුවෙන් මත් වී සිටි බැවින් ඊට පසුදින එනම්, 2026.07.06 වන දින සිදු වූ දේවල් පිළිබඳව පැහැදිලි මතකයක් නොමැති බවත්, 2026.07.07 වන දින තමා මොණරාගල බන්ධනාගාරයට පැමිණි බවත්, මොණරාගල බන්ධනාගාරයේ ගේට්ටුවෙන් ඇතුළු වීමේදී නිලධාරීන් විසින් පයින් පාරක් ගැසූ බවත්, ඉන්පසුව පහර නොදුන් බවත් M3 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

### *6.8.3 රැඳවියන් හට වධහිංසා පැමිණවීම පිළිබඳ නිරීක්ෂණ*

කොමිෂන් සභාව විසින් රැඳවියන් 40 දෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශවලදී, මීගමුව බන්ධනාගාරයේ සිට මොණරාගල බන්ධනාගාරය වෙත ඇතුළත් කිරීමේදී මොණරාගල බන්ධනාගාරයේ නිලධාරීන් විසින් ඔවුන්ට පහර දුන් බව ඇතැම් රැඳවියන් විසින් සඳහන් කර ඇත. එසේම, පහර නොදුන් නමුත්, දණ ගස්වා ඇවිද්දවූ බව ඇතැම් රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත. තවත් රැඳවියන් කිහිපදෙනෙකු සඳහන් කර ඇත්තේ, ඔවුන්ව කාමරයකට දමා යටි පතුල් වලට පහර දුන් බවයි. මුල් දිනයේ සහ ඊට පසු දින සිදු වූ එම පහරදීමෙන් පසුව කිසිදු බලපෑමක් සිදු නොවූ බව රැඳවියන් විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

## 6.9 වාරියපොළ බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට වාරියපොළ බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.10 වන දින වාරියපොළ බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණයක් පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.9.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට වාරියපොළ බන්ධනාගාරය වෙත පිරිමි රැඳවියන් 110 දෙනෙකු සහ කාන්තා රැඳවියන් 39 දෙනෙකු වශයෙන් මුළු

රැඳවියන් 149 දෙනෙකු යොමු කර ඇත. එම කාන්තා රැඳවියන් අතර විදේශීය කාන්තාවන් 26 දෙනෙකු ද සිට ඇත. මීට අමතරව කාන්තා රැඳවියන්ගේ කුඩා දරුවන් හය දෙනෙකු ද සිට ඇත.

### *6.9.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.10 වන දින වාරියපොළ බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට වාරියපොළ බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් අතරින් පිරිමි රැඳවියන් 10 දෙනෙකු සහ කාන්තා රැඳවියන් 05 දෙනෙකු වශයෙන් රැඳවියන් 15 දෙනෙකු ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ප්‍රකාශ ලබා දී ඇත. එලෙස රැඳවියන්ගෙන් සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

#### *V1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින තමා මීගමුව බන්ධනාගාරයේ අංක 2 වාට්ටුවේ සිටි බවත්, එදින දහවල් 12.30ට පමණ අංක 2 වාට්ටුවේ කාමර පාට් ලෙස කටයුතු කරන මිහිඳු නම් රැඳවියා සොයාගෙන රැඳවියන් පිරිසක් වාට්ටුවට පැමිණි බවත්, එම රැඳවියාට පැමිණි පිරිස යකඩ පොල්ලකින් පහර දුන් බවත්, ඒ අවස්ථාවේදී මිහිඳු නම් රැඳවියා පිටතට පැන දිවූ බවත්, පැමිණි පිරිසද ඔහුව එලවාගෙන ගිය බවත්, නැවතත් එම පිරිස වාට්ටුවට පැමිණ "ගිරවු" ටික ගන්නවා යනුවෙන් පවසා කූරා සහ ගයියා නමින් හඳුන්වන රැඳවියන් දෙදෙනාට පහර දී දමා ගිය බවත්, ඔවුන් දෙදෙනා මිය ගිය බවත්, එදින රැඳවියන් පිරිසක් බන්ධනාගාර රෝහල කඩා එහි තිබූ බෙහෙත් ගෙන පානය කළ බවත්, කාන්තා රැඳවියන් දෙසට ද එම බෙහෙත් විසි කළ බවත්, 2026.07.06 වන දින උදෑසන ආහාර ලබා දී අංක 2 වාට්ටුව වසා තිබූ බවත්, උදෑසන 9ට පමණ වෙඩි තැබීමක් ඇසුණු බවත්, අංක 2 වාට්ටුවට පිටුපසින් ඇති වාට්ටු වල රැඳවියන් ප්‍රධාන ගේට්ටුව දෙසට දිව ගිය බවත්, පොලිස් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළ සිටිනවා තමා දුටු බවත්, නිලධාරියෙකුගෙන් වැටුණු ටී -56 අවියක් රැඳවියෙකු විසින් අහුලා ගත් බව තමා දුටු බවත්, උඹලා තියපල්ලා, අපිත් තියනවා යනුවෙන් එම රැඳවියා පැවසූ බවත්, පසුව ඔහුට වෙඩි වැදී වැටුණු බවත්, ටිකෙන් ටික තත්ත්වය පාලනය වූ බවත් V1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

#### *V2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින දහවල් කාන්තා අංශයේ රැඳවියන් වහලට නැග පිරිමි අංශය දෙස බලමින් කෑගසමින් සිටි බවත්, පිරිමි අංශය දෙසින් කාන්තා අංශය වෙත මත් පෙති දමා තිබූ බවත්, කාන්තා රැඳවියන් විසින් ඒවා පානය කර තිබූ බවත්, 2026.07.06 වන දින ද කාන්තා රැඳවියන් අතර ගැටුම් ඇති වූ බවත්, තමා මස නාවයක කුඩා අත දරුවෙකු සිටින මවක් වන බැවින් දරුවාට කරදරයක් සිදු වේය යන බියට සැඟවී සිටි බවත් V2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

## 6.10 අනුරාධපුර බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට අනුරාධපුර බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.27 වන දින අනුරාධපුර බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණයක් පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.10.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට අනුරාධපුර බන්ධනාගාරය වෙත විදේශීය රැඳවියන් 30 දෙනෙකු ඇතුළුව රැඳවියන් 119 දෙනෙකු යොමු කර ඇත.

### *6.10.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.27 වන දින අනුරාධපුර බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට අනුරාධපුර බන්ධනාගාරය වෙත යොමු කරන ලද විදේශීය රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් හට ආහාර ලබා දීමේ දී විදේශිකයින්ට හුරුපුරුදු ආහාර නොලැබෙන බව ඇතැම් රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇති අතර ඇතැම් අයට සුදුසු පරිදි ප්‍රමාණවත් ආහාර ලැබෙන බව ප්‍රකාශ කර ඇත. තවද ඔවුන් හට අවශ්‍යසනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවන බවත්, පානය සඳහා පිරිසිදු ජලය නොලැබෙන බවත්, විදේශීය ඥාතීන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට ප්‍රමාණවත් සන්නිවේදන පහසුකම් නොමැති බවත්, ඔවුන්ගේ අදාළ රටවල්වල තානාපති කාර්යාල සමඟ සම්බන්ධ වීමට නොහැකි බවත්, ඇතැම් රැඳවියන්ට ගරු අධිකරණයෙන් ඇප ලබා ගැනීමට හැකි නමුත්, ඇප ලබා දීම සඳහා කිසිවකු ඉදිරිපත් වීමට නොමැති බවත්, ඇතැම් රෝගී රැඳවියන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ද සුදුසු පරිදි නොලැබෙන බවත් එකී විදේශිය රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත. එලෙස රැඳවියන්ගෙන් සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

### *AP 1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.05 වන දින බන්ධනාගාරයේ සිටි විශාල රැඳවියන් පිරිසක් බන්ධනාගාරයේ ප්‍රධාන දොරටුව අසළට රැස් වූ බවත්, බන්ධනාගාර නිලධාරීන්ට පාලනය කර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වූ බවත්, කාමර පාටි රැඳවියන් හට අනෙක් රැඳවියන් පහර දෙනවා තමා දුටු බවත්, ඔවුන්ට පහර දුන්නා පමණක් නොව ඔවුන්ව සපා කෑ බවත්, 2026.07.06 වන දින නැවත මේ කෝලාහලය ඇති වූ බවත්, රැඳවියන් විසින් ප්‍රධාන යකඩ ගේට්ටුව කඩා දැමූ බවත්, ඒ අවස්ථාවේදී පොලු රැගත් නිලධාරීන් ඇතුළට ආ බවත්, සමහර නිලධාරීන් පැන දිවූ බවත්, ඇතැම් නිලධාරීන්ව මරා දැමූ බවත්, මේ අවස්ථාවේදී තමා දන්නා ඉන්දියානු රැඳවියෙක් මිය ගිය බවත්, ඒසේ මිය යාමට හේතුව වූයේ

ජනේලයෙන් හදිසියේම උණ්ඩයක් ඔහුගේ දකුණු පැත්තේ පපුවට වැදීම බවත් AP 1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

### *AP 2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය*

2026.07.06 වන දින තමා වාට්ටුවේ සිටින විට දේශීය රැඳවියන් ගහ ගන්නවා මෙන්ම බැන වදින ශබ්දය ඇසුණු බවත්, පසුව රැඳවියන් ආරක්ෂක ආයුධ කාමරය කඩා ආයුධ ගන්නවා තමා දුටු බවත්, තමා බියට පත් වූ බවත්, පසුව තමා වැසිකිළි කාමරයට ගිය බවත්, තමාගේ නයිජීරියා තානාපති කාර්යාලය ඉන්දියාවේ ඇති බවත්, තානාපති කාර්යාලය සමග සම්බන්ධ කිරිමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලා සිටින බවත් AP 2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

## 6.11 පොළොන්නරුව බන්ධනාගාරය

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට පොළොන්නරුව බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද රැඳවියන්ගේ තත්ත්වය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.11 වන දින පොළොන්නරුව බන්ධනාගාරය තුළ ස්ථානීය පරීක්ෂණයක් පවත්වා පහත කරුණු වාර්තා කර ඇත.

### *6.11.1 රැඳවියන් පිළිබඳ සංඛ්‍යාලේඛන*

නිලධාරීන් කණ්ඩායම විසින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව, මීගමුව බන්ධනාගාරයේ සිට පොළොන්නරුව බන්ධනාගාරය වෙත රැඳවියන් 60 දෙනෙකු යොමු කර ඇත.

### *6.11.2 රැඳවියන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් 2026.07.11 වන දින පොළොන්නරුව බන්ධනාගාරය වෙත ගොස් මීගමුව බන්ධනාගාරයේ සිට පොළොන්නරුව බන්ධනාගාරය වෙත යොමු කරන ලද රැඳවියන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර ඇත. එහිදී එකී රැඳවියන් අතරින් රැඳවියන් 33 දෙනෙකු කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ප්‍රකාශ ලබා දී ඇත. එලෙස ප්‍රකාශ ලබා ගත් 33 දෙනාගෙන් වැඩිම පිරිසක් මීගමුව බන්ධනාගාරයේ 4 වාට්ටුවේ රඳවා සිටින ලද රැඳවියන් වූ බව නිරීක්ෂණය වී ඇති අතර, මෙම සියලුම රැඳවියන් පොදුවේ ප්‍රකාශ කර ඇත්තේ, 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් දෙපිරිසක් අතර ගැටුමක් ඇති වූ බවත්, එම ගැටුමෙන් කාමර පාටි යනුවෙන් හඳුන්වන රැඳවියන් දෙදෙනෙකු මියගොස් ඇති බවට තොරතුරු ලද බවත්, මෙම ගැටුම් සිද්ධිය නොදුටු බවත්, ලද ආරංචි අනුව දෙදෙනෙකු මිය ගිය බව දැනගත් බවත්, පසුදින එනම්, 2026.07.06 වන දිනද මීගමුව බන්ධනාගාරය තුළ කලහකාරී තත්වයක් ඇති වූ බවත්, මෙම තත්ත්වය තුළ එළිමහනට නොගිය බවත්, තම සිරමැදිරියේ සැඟවී සිටි බවත්, කලහකාරි තත්ත්වය හමුවේ නිලධාරීන් පැමිණ පිරිස් එළියට ගෙන බස් රථ වලින් පොළොන්නරුව බන්ධනාගාරය වෙත එවන ලද

බවත්, 2026.07.05 හා 06 යන දෙදින තුළ මීගමුව බන්ධනාගාරයේ කලහකාරී තත්ත්වය හේතුවෙන් රැඳවියන් හා නිලධාරීන් මිය ගිය බව දැනගත් බවත් ය.

එසේම, පොළොන්නරුව බන්ධනාගාරයට රැගෙන ඒමෙන් පසු පරීක්ෂා කර බලා බන්ධනාගාරය තුළට ඇතුළත් කළ බවත්, පරීක්ෂා කිරීමේදී කිසිදු හිංසාවක් පීඩාවක් සිදු නොවූ බවත්, පරීක්ෂා කරන අවස්ථාවේදී සාමාන්‍ය අසනීප තත්ත්වයන් සඳහා බන්ධනාගාර වෛද්‍යවරයා විසින් නියම කරන ලද ප්‍රතිකාර ලබාගත් බවත්, බන්ධනාගාරයේ සිරමැදිරි තුළට ඇතුලත් කළ පසු එම සිරමැදිරි වල සිටි කිසිදු රැඳවියෙකුගෙන් කිසිදු හිංසාවක් සිදු නොවූ බවත් රැඳවියන් විසින් ප්‍රකාශ කර ඇත. එලෙස රැඳවියන්ගෙන් සටහන් කරගන්නා ලද ප්‍රකාශ කිහිපයක් සැකෙවින් පහත සඳහන් කර ඇත.

***P1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා මීගමුව බන්ධනාගාරයේ අංක 4 වාට්ටුවේ සිටි බවත්, 2026.07.05 හා 06 යන දින වල සිදු වූ සිදුවීම් තමා දුටු බවත්, තමා කිසිම ගැටුමකට සම්බන්ධ නොවූ බවත්, රැඳවියන් පැමිණ තම වාට්ටුවේ දොරෙහි ඉබ්බා කැඩූ බවත්, ඒ නිසා එහි සිටි සියලු දෙනාම එළියට ආ බවත්, පොළොන්නරුව බන්ධනාගාරයට පැමිණි පසු තමාහට කිසිදු කරදරයක් සිදු නොවූ බවත් P1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***P2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා මීගමුව බන්ධනාගාරයේ 4 වාට්ටුව තුළ සිටි බවත්, 2026.07.05 වන දින රැඳවියන් දෙපාර්ශවයක් අතර ගැටුමක් ඇති වූ බවත්, එම ගැටුමෙන් දෙදෙනෙකු මිය ගිය බවත්, එලෙස මිය ගියේ නිලධාරීන්හට ඔත්තු සපයන රැඳවියන් දෙදෙනෙකු බවත්, ඔවුන් හට පහර දුන්නේ කවුරුන්ද කියා දන්නේ නැති බවත්, තමා පොළොන්නරුව බන්ධනාගාරයට පැමිණි පසු කිසිදු කරදරයක් සිදුවූයේ නැති බවත් P2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

***P3 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුමෙන් බන්ධනාගාර කාමර පාටිලා දෙදෙනෙකු මිය ගිය බව දැනගත් බවත්, ඊට පසුදින එනම්, 2026.07.06 වන දින නිලධාරීන් පැමිණ වාට්ටු වලින් පිටත සිටි රැඳවියන්ට පහර දුන් බවත්, ඒ අවස්ථාවේදී තමාට ද පහර බැටන් පොලු වලින් පහර දුන් බවත්, තමාට තුවාල සිදු වී නොමැති බවත්, පොළොන්නරුව බන්ධනාගාරයට පැමිණි පසු කිසිදු කරදරයක් සිදු නොවූ බවත් P3 ලෙස නම් කරන ලද රැඳවියා විසින් සඳහන් කර ඇත.

## 7. තුවාල ලබා රෝහල්ගතව සිටි නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ ප්‍රකාශ

### 7.1 තුවාල ලබා රෝහල්ගතව සිටි නිලධාරීන්ගේ ප්‍රකාශ

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් තුවාල ලැබූ නිලධාරීන් සහ රැඳවියන් රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.09 වන දින කොළඹ ජාතික රෝහල වෙත ගොස් ප්‍රතිකාර ලබමින් සිටි නිලධාරීන් සිව්දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත.

එම ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත්තේ, එම නිලධාරීන් සිව්දෙනා බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායට අයත් නිලධාරීන් වන බවත්, ඔවුන් මීගමුව බන්ධනාගාරය වෙත ගොස් ඇත්තේ 2026.06.05 වන දින කණ්ඩායම් දෙකක් ලෙස දවල් හා සවස් කාලයේ බවත්, එම සියලු නිලධාරීන් කිසිදු අවස්ථාවක ගිනි අවියක් සහිතව බන්ධනාගාරය තුළට ඇතුළු වී නොමැති බවත්, බැටන් පොල්ලක් හා ආරක්ෂක හිස් ආවරණයක් සහිතව පමණක් ඇතුළු වී ඇති බවත්, එම සියලු නිලධාරීන්ට සහ පහර කෑමට ලක්ව මිය ගිය සියලු බන්ධනාගාර නිලධාරීන්ට රැඳවියන් විසින් හිසට මාරාන්තික ප්‍රහාර එල්ල කර ඇති බවත්, එසේ පහර දී ඇත්තේ ලී පොලු ගල්, මල් පෝච්චි,උලු කැට, වීදුරු කැබලි, යකඩ පොලු හා කූරු හා තියුණු ආයුධ මඟින් බවත්, එම කිසිදු නිලධාරියෙකු කිසිවිටකත් රැඳවියන්ට පහර දීමට උත්සාහ නොකළ බවත්, එක් නිලධාරියෙකු සඳහා රැඳවියන් විශාල ප්‍රමාණයක් වට වී පහර දී ඇති බවත්, බන්ධනාගාර ලී දොරටුවෙන් බන්ධනාගාරය තුළට නිලධාරියෙකු විසින් වෙඩි තබන තෙක් ඊට පෙර කිසිදු අවස්ථාවක පහරදීම් වලක්වා ගැනීමට බන්ධනාගාරයට පිටතින් කිසිදු සහායක් නොලැබුණු බවත් ය.

එලෙස නිලධාරීන් සිව්දෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශ සැකෙවින් පහතින් දක්වා ඇත.

***නිලධාරියාගේ නම - වී.ඒ. විදූෂාන් මයා (බන්ධනාගාර නියාමක)***

මෙම සිදුවීම 2026.07.06 වන දින උදේ 10.30,11.00 ට පමණ සිදු වූ බවත්, බන්ධනාගාරගත රැඳවියන් 200-300 ක් පමණ සිටි බවත්, එම රැඳවියන් අතේ ලී, පොලු, ගල්, කැඩුණු වීදුරු කැබලි තිබූ බවත්, ඒවායෙන් පැය භාගයක් පමණ නිලධාරීන්ට රැඳවියන් විසින් පහර දුන් බවත්,  කිසිම නිලධාරියෙකු රැඳවියන්ට පහර නොදුන් බවත්,  රැඳවියන් විසින් පෙරදින එනම්, 2026.07.05 වන දින බන්ධනාගාර රෝහලේ දොරවල් කඩා බෙහෙත් ද්‍රව්‍ය අරගෙන තිබූ බවත්, 2026.07.06 වන දින උදැසන රජයේ නිලධාරිනියක් ඇතුළු නිලධාරීන් පැමිණ සිටි බවත්, ඒ අයගේ ආරක්ෂාව සඳහා තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත්, රැඳවියන් එම රජයේ නිලධාරීන්ටත් ගල් වලින් ගැසූ බවත්, තමා ඇතුළු නිලධාරීන් විසින් ඔවුන්ව ආරක්ෂිතව ප්‍රධාන ගේට්ටුවෙන් එළියට රැගෙන ආ බවත්, ප්‍රධාන ජේලර් මහතාට හා සහෝදර නිලධාරීන්ට රැඳවියන් පහර දුන් බව තමා නොදුටු බවත්, තමාගේ හිසට, අත් දෙකට සහ පිට පැත්තට

රැඳවියන් පහර දුන් බවත්, තම දකුණු ඇත කැඩී ඇති බවත් වී.ඒ. විදූෂාන් නම් නිලධාරියා විසින් සඳහන් කර ඇත.

*නිලධාරියාගේ නම - එච්.එස්.ජී. හතුරුසිංහ මයා (බන්ධනාගාර නියාමක)*

තමා මීගමුව බන්ධනාගාරය වෙත ගියේ බන්ධනාගරයේ ගැටුම ඇති වූ මුල් දිනය වන 2026.07.05 වන දින සවස බවත්, එදා සවස තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් හට කිසිම ප්‍රශ්නයක් නොතිබුණු බවත්, තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් 30ක් පමණ බන්ධනාගරයෙන් පිටත රැඳී සිටි බවත්, ඊට පසුදින එනම්, 2026.07.06 වන දින, පැමිණ සිටි බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් සියලු දෙනා බන්ධනාගාරය තුළට ගිය බවත්, ඔවුන් සියලු දෙනා ආරක්ෂක හිස්වැසුම් පැළඳ බැටන් පොලු සහ ආරක්ෂක ආවරණ රැගෙන ගිය බවත්, ගේට්ටුවෙන් ටික දුරක් ඉදිරියට යන විට රැඳවියන් පැමිණ නිලධාරීන් වටකරගත් බවත්, එම රැඳවියන් විසින් ජිම් එකේ තිබෙන යකඩ පොලු, උළු කැට, ලී පොලු, උල් ආදිය රැගෙනවිත් තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් හට පහර දුන් බවත් එච්.එස්.ජී. හතුරුසිංහ නම් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

*නිලධාරියාගේ නම - ආර්.එම්.සී. හංසක මයා (බන්ධනාගාර නියාමක)*

මෙම සිදුවීම 2026.07.06 වන දින උදේ 10:30 ට 11 ට පමණ සිදු වූ බවත්, තමා යකඩ ගේට්ටුව සහ ලී දොර අතරමැද රැඳී සිටි බවත්, ටික වෙලාවකින් රැඳවියන් යකඩ ගේට්ටුව ළඟට ඇවිත් කෑගසමින් සිටි බවත්, ඒ අවස්ථාවේ දී මීගමුව බන්ධනාගාර අධිකාරීතුමා විසින් 'ඇතුලට ගිහිල්ලා වැහියන්, දැන් ඕක නවත්තලා, දැන් ඕක ඇති' යනුවෙන් රැඳවියන්ට පැවසූ බවත්, ඒවේලාවේ දී රැඳවියන් විසින් 'ඔයා කොහොමද එහෙම කියන්නේ අපිට ඕනේ වෙලාවටයි අපි වැහෙන්නේ' යනුවෙන් කෑගැසූ බවත්, ඒ අවස්ථාවේ දී බන්ධනාගාර අධිකාරීතුමා විසින් 'මුන්ව ගිහින් වහල දාන්න, නැත්නම් ඕක ඉවරයක් වෙන්නේ නැහැනේ' යනුවෙන් නිලධාරීන්ට පැවසූ බවත්, ඒ අනුව තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත්, නිලධාරීන් විසින් රැඳවියන් 50ක් විතර ඔවුන් සිටි සිර මැදිරි පැත්තට රැගෙන ගිය බවත්, ඒ අවස්ථාවේ දී සිර මැදිරි වල දොරගුළු කඩා ඇති බව දුටු බවත්, ඉන් අනතුරුව රැඳවියන් සිටි වාට්ටුවල අගුළු නොමැති වුවත් තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් රැඳවියන් වාට්ටු වලට දමා දොරවල් වසමින් පැමිණි බවත් ආර්.එම්.සී. හංසක නම් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව බන්ධනාගාරයේ පිටුපස තාප්පය පැත්තේ තිබූ වාට්ටුවල රැඳවියන් කිහිපදෙනෙකු කෑගසමින් පැමිණි බවත්, එම රැඳවියන් ගල් වලින් තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් හට පහරදුන් බවත්, පහරදීම නවත්වන ලෙසට දැනුම් දුන්න ද රැඳවියන් ඊට අවනත නොවූ බවත්, දිගින් දිගටම ගල් වලින් නිලධාරීන් හට පහරදුන් බවත්, තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් 10ක් 12ක් පමණ බන්ධනාගාරය තුළට පැමිණ සිටි බවත්, ඒ වේලාවේ

දී රැඳවියන් පාලනය කිරීමට අපහසු බව නිලධාරීන් හට අවබෝධ වූ නිසා ඉක්මනින් යකඩ ගේට්ටුව දෙසට දිව ආ බවත්, නිලධාරීන් එක් පැත්තකින් ගේට්ටුව දෙසට එන විට අනෙක් පැත්තෙන් රැඳවියන් කිහිපදෙනෙක් යකඩ ගේට්ටුව ළඟට ඇවිත් ගල් මුගුරු වලින් යකඩ ගේට්ටුවට ගසමින් සිටි බවත්, ඒ අවස්ථාවේ දී තමා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් යකඩ ගේට්ටුව පැත්තට යාමට සූදානම් වන බව දැක ගේට්ටුවට පහරදෙමින් සිටි රැඳවියන් තමා ඇතුළු නිලධාරීන් දෙසට ද ගල් ප්‍රහාර එල්ල කළ බවත්, ඒ අවස්ථාවේ දී තමා ඇතුළු නිලධාරීන් හය හත් දෙනෙකු අසල තිබූ කාමරයකට ගිය බවත්, රැඳවියන් එම කාමරයේ දොර කඩාගෙන පැමිණි නිසා තමා සහ නිලධාරීන් එම කාමරයේ තිබූ වීදුරු කවුළු වලින් පැන අනෙක් පස තිබූ බන්ධනාගාර අධිකාරී කාර්යාලයට පැන එහි සැඟවී සිටි බවත්, ටික වේලාවකින් රැඳවියන් පැමිණ පොලු වලින් පහර දුන් බවත්, අනෙක් නිලධාරීන්ව පිටතට ගෙන රැඳවියන් පහරදෙන විට තමා ඉන් බේරී යකඩ ගේට්ටුව දෙසට දිව ගිය බවත්, ඒ අවස්ථාවේ දී යකඩ ගේට්ටුව අසල සිටි රැඳවියන් තමාගේ හිස් ආවරණය(හෙල්මට් එක) ගලවා හිසට පහර දුන් බවත්, තමා බිම වැටී අත්දෙකෙන් හිස බදාගෙන සිටි බවත්, පහරකෑ බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් යකඩ ගේට්ටුව අසල ගොඩගසා දමා තිබූ බවත්, පසුව විශේෂ කාර්ය බලකා නිලධාරීන් පැමිණෙන විට අත ඔසවා කතා කළ හැකිව තිබුණේ තමාට පමණක් බවත් ආර්.එම්.සී. හංසක නම් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත.

***නිලධාරියාගේ නම - ආර්.එම්.එන්.කේ. රත්නායක (බන්ධනාගාර නියාමක)***

2026.07.05 වන දින තමාට වැලිසර නාවික හමුදා රැඳවුම් මධ්‍යස්ථානයට යන ලෙස ඉහල නිලධාරීන් විසින් දවස් තුනකට කලින් දැනුම් දී තිබූ බවත්, එදින බන්ධනාගාර මූලස්ථානයේ සියළුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් තිබුණු බවත්, එම රැස්වීම මාසෙකට සැරයක් සාමාන්‍යයෙන් තිබෙන බවත්, එම රැස්වීම දවල් 12 ට පමණ අවසන් වූ බවත්, ඉන්පසුව වැලිසර නාවික හමුදා රැඳවුම් මධ්‍යස්ථානයට යාමට සූදානම් වූ අවස්ථාවේ දී මීගමුව බන්ධනාගරයේ ප්‍රශ්නයක් ඇති වී තිබෙන බැවින් එහි යන ලෙසට ඉහළින් උපදෙස් ලැබුණු බවත්, ඒ අවස්ථාව වන විට මීගමුව බන්ධනාගාරයේ ගැටලුව කුමක්ද යන්න නොදැන සිටි බවත්, බන්ධනාගර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ ඒ වෙලාවේ සේවයේ සිටි නිලධාරීන් දොළොස් දෙනෙක් පමණ මීගමුව බන්ධනාගරයට ගිය බවත්, ඔවුන් ප.ව.2:30ට පමණ මීගමුව බන්ධනාගරයට ගිය බවත්, බන්ධනාගර පරිශ්‍රයට ඇතුළු නොවී පිටත රැඳී සිටි බවත්, බන්ධනාගාරයේ මුර අට්ටාලවලට නැඟ නිරීක්ෂණය කිරීමේ දී ප.ව. 4.00-4.30ට පමණ කාන්තා අංශයේ රැඳවියන් කාන්තා අංශයේ වහලට නැඟ කෑගසමින් සිටින බව දුටු බවත්, පිරිමි අංශයේ රැඳවියන් විසින් බන්ධනාගාර රෝහල කඩා එහි තිබූ බෙහෙත් ගෙන කාන්තා රැඳවියන් සිටින දෙසට විසි කළ බවත්, එම බෙහෙත් කාන්තා රැඳවියන් පානය කළ බව තමා දුටු බවත්, කාන්තා රැඳවියන් රාත්‍රී 12 පමණ වන තෙක් වහලයේ රැඳී සිට පසුව බිමට බැස තිබූ බවත් ආර්.එම්.එන්.කේ. රත්නායක නම් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇති අතර,

ඔහුගේ හිසෙහි වේදනාවක් පවතින බැවින් වැඩිදුරටත් කරුණු දැක්වීම අපහසු බව කොමිෂන් සභාවේ නිලධාරීන් හට දැනුම් දී ඇත.

### 7.2 තුවාල ලැබූ රැඳවියන්ගේ ප්‍රකාශ

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් තුවාල ලැබූ නිලධාරීන් සහ රැඳවියන් රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2026.07.09 වන දින කොළඹ ජාතික රෝහල වෙත ගොස් ප්‍රතිකාර ලබමින් සිටි රැඳවියන් අතරින් ප්‍රකාශ ලබාදීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක සිටි රැඳවියන් දෙදෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එකී ප්‍රකාශ සැකෙවින් පහත දැක්වේ.

***H1 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ අංක 4 වාට්ටුවේ සිටි බවත්, 2026.07.05 වන දින දහවල් 12.30ට පමණ අංක 2 සහ 11 වාට්ටුවල රැඳවියන් අතර පහරදීම් සිදු වී ඇති බව දැනගන්නට ලැබුණු බවත්, ඊට හේතුව තමා නොදන්නා බවත්, තමා ඒවාට සම්බන්ධ නොවූ බවත්, ඊට පසුදින එනම්, 2026.07.06 වන දින බන්ධනාගාරයේ ඉදිරිපස දොරටුව පැත්තෙන් වෙඩි ශබ්ද කිහිපයක් ඇසී එය බැලීමට ඒ දෙසට ගමන් කරන විටදී තම වම් කකුලට වෙඩි ප්‍රහාරයක් එල්ල වුණ බවත්, ඒ වේලාවේ බන්ධනාගාර නිලධාරීන් පෙනෙන්නට නොසිටි බවත්, රැඳවියන් අතේ පොලු තිබූ බවත්, ඔවුන් හූ කියමින් කෑගසමින් සිටි බවත්, වෙඩි වැදුණු පසු සිදුවූ දේවල් තමාට මතක නැති බවත්, තමාට සිහිය එන විට සිටියේ මෙම රෝහලේ බවත්, ඒ අනුව රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගැනීමේදී තම වම් පාදය ඉවත් කරන ලද බවත් H1 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

***H2 ලෙස නම් කරන ලද රැඳවියාගේ ප්‍රකාශය***

තමා මීගමුව බන්ධනාගාරයේ අංක 6 වාට්ටුවේ සිටි බවත්, දිනය හරියටම මතක නැති බවත්, බන්ධනාගාර රෝහල දෙසින් රැඳවියන් කෑගසන ශබ්දයක් සහ වීදුරු කුඩු කරන ශබ්දයක් ඇසී තමා ඇතුළු රැඳවියන් පිරිසක් ඒ දෙසට ගිය බවත්, බන්ධනාගාර රෝහල කඩා බිඳ විනාශ කර තිබූ බවත්, බන්ධනාගාර රෝහලේ බිම බෙහෙත් පෙති වැටී තිබූ බවත්, එම ස්ථානයේ සිටි රැඳවියන් එම බෙහෙත් පෙති ගෙන පානය කළ බවත්, තමා ද කහපාට බෙහෙත් පෙති 3,4ක් පානය කළ බවත්, එම ස්ථානයේ බන්ධනාගාර නිලධාරීන් කිසිවෙක් නොසිටි බවත්, මඳ වේලාවකින් තමා සිහිසුන්ව යකඩ වැටක් මතට ඇද වැටුණු බවත්, සිහිය ලැබෙන විට තමා කොළඹ ජාතික රෝහලේ සිටි බවත්, හිසට තුවාල වීම මත රෝහල්ගතව ප්‍රතිකාර ලබන බවත් H2 ලෙස නම් කරන ලද රැඳවියා විසින් ප්‍රකාශ කර ඇත.

## 8. බන්ධනාගාර, ශ්‍රී ලංකා පොලිසිය සහ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ප්‍රචණ්ඩකාරී සිදුවීම් සිදුවන අවස්ථාවේ දී එම ස්ථානයේ රැඳී සිටි පහත නම් සඳහන් බන්ධනාගාර, ශ්‍රී ලංකා පොලිසිය සහ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් කොමිෂන් සභාව වෙත කැඳවා ප්‍රකාශ ලබාගෙන ඇත.

1. 2026.07.13 - මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මයා
2. 2026.07.23 - සහකාර බන්ධනාගාර අධිකාරී චමීර ආසිරි රාජකරුණානායක මයා
3. 2026.07.23- බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම්, මාධ්‍ය හා බුද්ධි අංශ (වැඩබලන) අනුරුද්ධ ගජනායක මයා
4. 2026.07.23 - මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මයා
5. 2026.07.23 - මීගමුව බන්ධනාගාරයේ නියාමක තුසිත වේරකෝ මයා
6. 2026.07.24 - මීගමුව බන්ධනාගාරයේ නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මයා
7. 2026.07.24 - මීගමුව බන්ධනාගාරයේ නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මයා
8. 2026.07.24 - මීගමුව බන්ධනාගාරයේ කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුශිකා මිය
9. 2026.07.30 - මීගමුව බන්ධනාගාරයේ නියාමක එස්.කේ. දිල්හාන් මයා
10. 2026.07.30 - මීගමුව බන්ධනාගාරයේ නියාමක ජී.එස්.එස්. ගමගේ මයා
11. 2026.07.31 - මීගමුව බන්ධනාගාරයේ නියාමක ජේ. ඩී. සම්පත් ද සිල්වා මයා
12. 2026.08.03 - මීගමුව බන්ධනාගාරයේ කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මිය
13. 2026.08.03 - බන්ධනාගාර කොමසාරිස් ජනාරාල් (රා.ආ.) ප්‍රසාද් හේමන්ත කුමාර මයා
14. 2026.08.07 - විශේෂ කාර්ය බලකා සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මයා
15. 2026.08.19 - වැලිකඩ බන්ධනාගාර අධිකාරී සමන්ත මහානාම මයා
16. 2026.08.21 - මීගමුව බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ක්ලීටස් ඔස්කාර් මයා
17. 2026.08.25 - මීගමුව කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨපොලිස් අධිකාරී බිමල් පෙරේරා මයා
18. 2026.09.02 - අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරී පුෂ්පකුමාර හෙන්නායක මයා
19. 2026.09.02 - අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ පළමුපෙළ ජේලර් බී.ඒ.පී.මධූෂ බාලසූරිය මයා
20. 2026.09.02 - බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මයා
21. 2026.09.02 - වාරියපොල බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ජේ.ජී. අමුණුගම මයා
22. 2026.09.02 - දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්.එම්.ඊ.එම්. රත්නායක මයා

ඉහත නම් සඳහන් නිලධාරීන්ගේ ප්‍රකාශ සැකෙවින් පහත දක්වා ඇත.

### 8.1 මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.13 වන දින ප්‍රකාශයක් ලබා දී ඇත. 2026.07.05 වන දින තමා නිවාඩු ලබා තම නිවසට ගොස් සිටියදී මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා වන ජයන්ත කුමාර මහතා විසින් දුරකථන ඇමතුමක් ලබා දී බන්ධනාගාරය තුළ ගැටලුවක් ඇති බව දැනුම් දීමෙන් පසු බන්ධනාගාරයට පැමිණි බවත්, එහිදී තුවාල ලැබූ රැඳවියන් කිහිප දෙනෙකු රෝහල්ගත කිරීමට කටයුතු කර තිබූ බව තමා දැනගත් බවත්, බන්ධනාගාරයේ රැඳවියන් නිලධාරීන්ට තර්ජනය කරමින් බන්ධනාගාරයේ ප්‍රධාන දොරටුව අසලට පැමිණ සිටි තමා දුටු බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා සඳහන් කර ඇත.

2026.07.05 වන දින සිද්ධිය ඇති වූ අවස්ථාවේ මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් සංඛ්‍යාව අවශ්‍ය සංඛ්‍යාවට වඩා සැලකිය යුතු ලෙස අඩු වූ බවත්, වෛද්‍ය නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 178 දෙනෙකු සිටිය යුතු අතර, අවශ්‍ය ප්‍රමාණය 435ක් බවත්, නිවාඩු, අසනීප නිවාඩු සහ සේවයට වාර්තා නොකළ නිලධාරීන් හේතුවෙන් එදින රාජකාරියේ සිටි නිලධාරීන් සංඛ්‍යාව සීමිත වූ බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.
එසේම, මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් සංඛ්‍යාව එහි ධාරිතාව ඉක්මවා පැවති බවත්, කාන්තාවන් ඇතුළුව රැඳවියන් 2418 දෙනෙකු සිටි අතර රඳවා තැබිය හැකි සංඛ්‍යාව 825ක් පමණක් බවත්, බන්ධනාගාරය පැරණි ගොඩනැගිල්ලක් වන අතර මෑතකදී වාට්ටු දෙකක් පමණක් අලුතින් එකතු කර ඇති බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.05 වන දින අදාළ සිදුවීම ඇති වූ පසුව තමා විසින් පොලීසිය සහ බන්ධනාගාර උසස් නිලධාරීන් දැනුවත් කළ බවත්, මීගමුව කොට්ඨාශයේ පොලිස් ස්ථාන වලින් සහ බන්ධනාගාර මූලස්ථානයෙන් සහාය ලබාගත් බවත්, පසුව බන්ධනාගාර හදිසි ප්‍රතිචාර හා උපක්‍රමික බලකාය ඇතුළු කණ්ඩායම් බන්ධනාගාරයට පැමිණ තත්ත්වය පාලනය කිරීමට උත්සාහ කළ බවත්, කෙසේ වෙතත් රැඳවියන් කලහකාරී ලෙස හැසිරීම හේතුවෙන් ඔවුන් පාලනය කිරීමට අපහසු වූ බවත් ප්‍රකාශ කර ඇත.

කලහකාරී තත්ත්වය අතරතුර බන්ධනාගාරයේ වාට්ටු, කාර්යාල, විනය අංශය, සුභසාධක අංශය සහ උපකරණ ගබඩා ඇතුළු ස්ථානවලට හානි සිදු වී ඇති බවත්, ඒවායෙහි තිබූ ලේඛන, උපකරණ හා දේපළවලට රැඳවියන් විසින් හානි කිරීම සිදු කර තිබූ බවත්, බන්ධනාගාර රෝහලේ ගබඩා සහ උපකරණවලටද හානි සිදු කර තිබූ බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

රැඳවියන්ගේ ප්‍රධාන පැමිණිල්ල වූයේ නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන්ට තොරතුරු ලබාදෙන රැඳවියන්ගෙන් ඔවුන්ට ඇති වන ගැටලු බවත්, මියගිය රැඳවියන් දෙදෙනා වන නිලංග දූල්ෂාන් සහ ගයාන් සම්පත් යන අය බන්ධනාගාරයේ නිලධාරීන් හට තොරතුරු ලබාදෙන පුද්ගලයන් ලෙස සැලකීම හේතුවෙන් ඔවුන් පුද්ගලික පළිගැනීම්වලට ලක්ව ඇති බවට සැකයක් පවතින බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.06 වන දින රැඳවියන් හට උදෑසන ආහාර ලබාදීම සඳහා තමා ඇතුළු නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය අවස්ථාවේ දී අංක 5 වාට්ටුවේ සිටි රැඳවියන් විසින් එම වාට්ටුවේම වෙනත් රැඳවියෙකුට පහර දෙමින් සිටි බවත්, ඒ අවස්ථාවේ දී මීගමුව බන්ධනාගාරයේ නියාමක ජී.එම්. ගමගේ, නියාමක ඉහළකුඹුර, නියාමක මාරසිංහ සහ නියාමක යූ.කේ.එස්. චාමර යන නිලධාරීන් විසින් එකී රැඳවියා බේරාගෙන ගේට්ටුව වෙත රැගෙන එන අවස්ථාවේ දී එම රැඳවියාට සහ නිලධාරීන්ට රැඳවියන් විසින් පහර දුන් බවත්, ඒ අවස්ථාවේ දී එය දුටු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත්, ඒ අවස්ථාවේ දී රැඳවියන් නිලධාරීන් හට ගල් ප්‍රහාර එල්ල කළ බවත්, ඒ හේතුවෙන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් නැවත ගේට්ටුව දෙසට දුව ආ බවත්, තමා ද ලී දොරෙන් පිටතට පැමිණි බවත්, නිලධාරීන් 10ක් 15ක් පමණ බන්ධනාගාරය තුළ සිරවුණ බවත්, රැඳවියන් විසින් යකඩ දොර කඩාගෙනවිත් ලී දොර ද කඩාදැමීමට උත්සහ දරන ශබ්දය ඇසුණු බවත්, දොර කඩාගෙන පැමිණියහොත් වෙඩි තබන බවට රැඳවියන් හට දැනුම් දෙන ලෙස තමා විසින් බන්ධනාගාර නිලධාරීන් හට දැනුම් දුන් බවත්, එසේ දැනුම් දීමෙන් පසුව ද දොර කඩාගෙන ඒමට උත්සහ කළහොත් වෙඩි තබන ලෙස තමා විසින් බන්ධනාගාර නිලධාරීන් හට දැනුම් දුන් බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව රැඳවියන් විසින් ලී දොර කඩාගෙන පිටතට පැමිණීමට උත්සහ කළ බවත්, බන්ධනාගාරය තුළින් වෙඩි ශබ්ද ඇසුණු බවත්, රැඳවියන් විසින් ලී දොරෙහි කවුළුවෙන් දුමක් පිටතට එවූ බවත්, ඒ සමඟම ගිනි අවියක කොටසක් (සී ඉසෙඩ් 85 තුවක්කුවක මසල් එන්ඩ් එකක්) පිටතට එවූ බවත්, ඒ අවස්ථාවේ දී බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් ලී දොරෙහි කවුළුවෙන් ඇතුළට වෙඩි තැබූ බවත්, ඒ අවස්ථාවේ දී ලී දොර අසල සිටි රැඳවියන් පසුපසට ගිය බැවින් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් ආයුධ සහිතව බන්ධනාගාරය තුළට ගිය බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් සහ බන්ධනාගාර නිලධාරීන් ද ඇතුළට ගිය බවත්, තමා ද ඇතුළට ගිය බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් සඳහන් කර ඇත.

තත්ත්වය පාලනය කිරීම සඳහා එම ආරක්ෂක කණ්ඩායම් ක්‍රියාත්මක වූ බවත්, තුවාල ලබා සිටි රැඳවියන් සහ රෝහල්ගත කිරීමට කටයුතු කළ බවත්, සිද්ධිය අතරතුර ප්‍රධාන මුර අට්ටාලයේ සිටි නිලධාරීන් විසින් උණ්ඩ සහිත මැගසින් දෙකක් මුර අට්ටාලයේ දමාවිත් ඇති අතර, එම මැගසින් දෙක රැඳවියන් අතට ගොස් ඇති බවට තොරතුරු ලැබී ඇති බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව රැඳවියන් පාලනය කර වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමේ කටයුතු ආරම්භ කළ බවත්, රැඳවියන්ගේ නම් සහ තොරතුරු සටහන් කිරීමේදී ලේඛන විනාශ වී තිබීම හේතුවෙන් අපහසුතා ඇති වූ බවත්, සිද්ධිය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණ, පොලිස් පරීක්ෂණ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන ආරම්භ කර ඇති බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, මෙම සිද්ධියෙන් නිලධාරීන් 10 දෙනෙකු සහ රැඳවියන් 22 දෙනෙකු මියගොස් ඇති බවත්, සිද්ධියෙන් පසුවද ඇතැම් රැඳවියන් සාමාන්‍ය තත්ත්වයට පත්ව නොමැති බැවින් ආරක්ෂක පියවර තර කර ඇති අතර, තත්ත්වය පාලනය කිරීම සඳහා රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමට සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටින බවත් මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

### 8.2 සහකාර බන්ධනාගාර අධිකාරී චමීර ආසිරි රාජකරුණානායක මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් සහකාර බන්ධනාගාර අධිකාරී චමීර ආසිරි රාජකරුණානායක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.23 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 දින පෙ.ව. 8.00ට තමා සේවයට වාර්තා කර සිටියදී ප.ව.12.30ට පමණ මීගමුව බන්ධනාගාරයේ විනය අංශය කඩා එහි නිලධාරීන්ට සහ රැඳවියන්ට පහරදෙන බව බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම් හා බුද්ධි) ඒ.සී. ගජනායක මහතා දුරකථනයෙන් දැනුම් දුන් බවත්, ඒ අනුව බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් කණ්ඩායමක් මීගමුව බන්ධනාගාරය වෙත යවන ලෙසට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.අ.) විසින් දැනුම් දුන් බවත්, එබැවින් තමා විසින් නියාමකවරුන් 27 දෙනෙකු, දෙවන පෙළ ජේලර්වරුන් දෙදෙනෙකු හා ප්‍රධාන ජේලර් ප්‍රබුද්ධ සිරිවර්ධන මහතා ඇතුළු බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් කණ්ඩායමක් පිටත් කළ බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් සඳහන් කර ඇත. එසේම, එදින එනම්, 2026.07.05 වන දින ප.ව.2.00ට පමණ තමාට ද බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම් සහ කොමසාරිස් පාලන සමඟ මීගමුව බන්ධනාගාරයට යන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් දැනුම් දුන් බවත්, ඒ අනුව ප.ව.2.45 - 3.00 පමණ මීගමුව බන්ධනාගාරයට ළඟා වූ බවත්, ඉන්පසුව ඉහළ නිලධාරීන් විසින් රැඳවියන් 50 - 60 දෙනෙකු සමඟ කළ සාකච්ඡාවේදී විනය අංශයේ දැඩි පාලනය, අධික තදබදය, වාතාශ්‍රය නොමැතිකම හා බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ප්‍රමාණවත් නොවීම පිළිබඳව රැඳවියන් විසින් පැමිණිලි කළ බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, 2026.07.05 වන දින ප.ව.4.30 - 5.00 පමණ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා පැමිණ රැඳවියන් 200–300ක් පමණ සමඟ මෙගාෆෝනයෙන් සාකච්ඡා කළ බවත්, වාතාශ්‍රය සහ විදුලි පංකා

සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්නා බවත්, රස පරීක්ෂක වාර්තා කඩිනම් කිරීමට හා රෝහල් ප්‍රතිකාර වැඩිදියුණු කිරීමට කටයුතු කරන බවත් රැඳවියන් හට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දුන් බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් සඳහන් කර ඇත. ඒ වනවිට කාමර පාට් එක් අයෙකු හා උප කාමර පාට් එක් අයෙකු වශයෙන් මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් දෙදෙනෙකු මියගොස් ඇති අතර තවත් 30කට අධික පිරිසක් තුවාල ලබා තිබූ බවත්, ප.ව.5.30 පමණ වනවිට රැඳවියන් වාට්ටුවලට යාම වෙනුවට මාධ්‍ය සාකච්ඡාවක් ඉල්ලා සිටි බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව කාන්තා අංශයේ රැඳවියන් ද වහලයට නැගීම හේතුවෙන් රාත්‍රී 7.30–8.00 පමණ බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) පල්ලේතැන්න මහතා සමඟ කාන්තා අංශයට ගොස් රැඳවියන් සමඟ සාකච්ඡා කළ බවත්, එහිදී මධුෂිකා නමැති ජේලර්වරියගේ පක්ෂපාතී හැසිරීම, උණු වතුර නොලැබීම සහ රස පරීක්ෂක වාර්තා ප්‍රමාද වීම පිළිබඳව කාන්තා රැඳවියන් විසින් පැමිණිලි ඉදිරිපත් කළ බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් සඳහන් කර ඇත. එසේම, එදින ප.ව.8.30 පමණ තවත් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් 56 දෙනෙකුගේ කණ්ඩායමක් බන්ධනාගාරය පිටත ආරක්ෂාවට යොදවා තිබූ බවත්, රාත්‍රී 10.00ට පමණ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා නැවත කාන්තා අංශයට ගොස් සාකච්ඡා කළ බවත්, ඉහළ නිලධාරීන් රාත්‍රී 12.00 පමණ වනතෙක් බන්ධනාගාර පරිශ්‍රයේ රැඳී සිටි බවත්, කාන්තා රැඳවියන් පාන්දර 3.00ට පමණ වහලයෙන් බැස ඇති අතර, පල්ලන්සේන බන්ධනාගාරයෙන් පාන් ගෙනවිත් රැඳවියන්ට ලබාදුන් බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, ඊට පසුදින එනම්, 2026.07.06 දින පෙ.ව.7.00ට පමණ බන්ධනාගාරයට ඇතුළු වී තත්ත්වය නිරීක්ෂණය කළ අතර, ප්‍රධාන ජේලර් කාර්යාලය, විනය අංශය, අධිකාරී කාර්යාලය, ගබඩාව, බන්ධනාගාර රෝහල හා පුනරුත්ථාපන අංශය රැඳවියන් විසින් විනාශ කර තිබූ බවත්, සිර ලියාපදිංචි අංශයට හා මුළුතැන්ගෙයට හානි සිදුවී නොතිබූ බවත්, පෙ.ව.9.45ට පමණ බන්ධනාගාරයේ බුදු මැදුරට වම්පසින් රැඳවියන් 25–30 දෙනෙකු කලහකාරීව හැසිරෙනු තමා දුටු බවත්, ඒ අවස්ථාවේ දී තමා දුරකථන ක්‍රියාකරු සිටින ස්ථානයේ සිටි බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය ඇතුළට යවා රැඳවියන් වාට්ටුවලට යොමු කිරීමට තමා උපදෙස් දුන් බවත්, එලෙස නිලධාරීන් කණ්ඩායමක් ක්ෂණිකව යොමු කරන ලද්දේ යකඩ ගේට්ටුවෙන් රැඳවියන් පිටතට පැමිණීම වැළැක්වීමට හා අවි ගබඩාව ආරක්ෂා කිරීමට බවත්, එලෙස ඇතුළට ගිය නිලධාරී කණ්ඩායමට ගල් හා උළු කැබලිවලින් රැඳවියන් පහරදී තිබූ බවත්, ඔවුන් අතරින් නිලධාරීන් පිරිසක් බන්ධනාගාරයෙන් පිටතට පැමිණිය ද තවත් නිලධාරීන් කිහිපදෙනෙකු ඇතුළත සිරවී සිටි බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තමා ඇතුළු නිලධාරීන් බන්ධනාගාරයේ ලී දොරෙන් පිටත රැඳී සිටිය දී රැඳවියන් ලී දොර දක්වාම පැමිණ එය ද කඩා බිඳ පිටතට පැමිණීමට උත්සහ කරන බව ඇසුණු බවත්, තමාගේ බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් ඇතුළත සිරවී සිටින බව තමා විසින් බන්ධනාගාර

කොමසාරිස් ගජනායක මහතාට දැනුම් දුන් බවත්, රැඳවියන් ලී දොර අසලට පැමිණ බිත්ති කඩමින් සිටි බැවින් බන්ධනාගාර කොමසාරිස් ගජනායක මහතා විසින් බන්ධනාගාරය තුළට ගොස් රැඳවියන් මැඩපවත්වන ලෙසට පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට දැනුම් දුන් බවත්, ඒ අවස්ථාවේ දී බන්ධනාගාර නියාමක වේරගේ නිලධාරියා විසින් ටී56 ගිනි අවියෙන් ඉහළට සහ ලී දොරෙහි කවුළුවෙන් බිත්තිය දෙසට වෙඩි තැබූ බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් සඳහන් කර ඇත.

ඒ සමඟම රැඳවියන් ලී දොරෙන් පිටුපසට ගිය බැවින් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් සහ අනෙතුක් නිලධාරීන් සමඟ තමා ද බන්ධනාගාරය තුළට ගිය බවත්, ඉන් අනතුරුව තුවාල ලැබූ හා මියගිය නිලධාරීන් රෝහල්ගත කළ බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් 22 දෙනෙකු ඇතුළුව නිලධාරීන් 31 දෙනෙකු තුවාල ලබා ඇති බවත්, තම හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා කණ්ඩායමේ නිලධාරීන් 07 දෙනෙකු එදිනත් (2026.07.06 වන දින) තවත් 03 දෙනෙකු පසුවත් මියගිය බවත්, රැඳවියන් මීගමුව රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ ඥාතීන් රෝහල වෙත රැස්ව සිටීම හේතුවෙන් රෝහලෙහි  කලබලකාරී තත්ත්වයක් පැවති බැවින් එහි ආරක්ෂාව සඳහා තමා රෝහලේ රැඳී සිටි බවත්, රෝහලෙහි ආරක්ෂාව සඳහා යුද්ධ හමුදා, ගුවන් හමුදා සහ පොලිස් නිලධාරීන් යොදවා සිටි බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, මීගමුව බන්ධනාගාරයේ වාට්ටු එකිනෙකින් ප්‍රමාණවත් ලෙස වෙන්කර නොමැති බැවින් රැඳවියන් විශාල පිරිසකට ඉක්මනින් ඒකරාශී විය හැකි බවත්, වාට්ටු තාප්පවලින් වෙන්කර වෙන වෙනම අගුළු දැමිය හැකි ආකාරයට සැලසුම් කිරීම ආරක්ෂාවට සුදුසු බවත්, කාන්තා අංශයේ ආරක්ෂාවද වැඩිදියුණු කළ යුතු බවත් සහකාර බන්ධනාගාර අධිකාරී රාජකරුණානායක මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.3 බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම්, මාධ්‍ය හා බුද්ධි අංශ (වැඩබලන) අනුරුද්ධ ගජනායක මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් මෙහෙයුම්, මාධ්‍ය හා බුද්ධි අංශ (වැඩබලන) අනුරුද්ධ ගජනායක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.23 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 දින ප.ව. 1.30ට පමණ මීගමුව බන්ධනාගාර අධිකාරී වජිර අබේධීර මහතා විසින් තමා අමතා, මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් පිරිසක් තවත් රැඳවියන් පිරිසකට පහරදෙන බවත්, විනය අංශයටද පහරදීමට උත්සාහ කරන බවත් දැනුම් දුන් බවත්, ඒ අනුව වැඩබලන බන්ධනාගාර

කොමසාරිස් ජනරාල්වරයා දැනුවත් කර, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රම බලකා නිලධාරීන් කණ්ඩායමක් මීගමුව බන්ධනාගාරය වෙත යොමු කරන ලෙස බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය භාර සහකාර බන්ධනාගාර අධිකාරී රාජකාරුණානායක මහතා වෙත උපදෙස් ලබාදුන් බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.05 වන දින ප.ව. 3.00ට පමණ තමා, බන්ධනාගාර කොමසාරිස් (පාලන) බස්නායක මහතා සහ සහකාර බන්ධනාගාර අධිකාරී රාජකාරුණානායක මහතා සමඟ මීගමුව බන්ධනාගාරයට ගොස් රැඳවියන් සමඟ සාකච්ඡා කළ බවත්, එහිදී රැඳවියන් විසින් පහරදීම්, විනය අංශයට වැරදි තොරතුරු ලබාදීම නතර කර දීම සහ රස පරීක්ෂක වාර්තා කඩිනමින් ලබාගැනීම ඇතුළු ඉල්ලීම් ඉදිරිපත් කළ බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් සඳහන් කර ඇත. එදින එනම්, 2026.07.05 වන දින ප.ව. 5.00ට පමණ වැඩබලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා පැමිණ රැඳවියන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය පහසුකම් හා විසඳුම් ලබාදෙන බව රැඳවියන්ට දැනුම් දුන් බවත්, පසුව බන්ධනාගරයේ තත්ත්වය සාමකාමී වූ බවත්, මීගමුව බන්ධනාගාරයේ කාන්තා අංශයේ රැඳවියන් ද වහලය මතට නැඟ ඉල්ලීම් ඉදිරිපත් කළ බවත්, වැඩබලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ඔවුන් සමඟද සාකච්ඡා කළ බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.06 දින පෙ.ව. 7.00-7.30 අතර නැවත තමා මීගමුව බන්ධනාගාරයට පැමිණි අවස්ථාවේ බන්ධනාගාරය ඇතුළත කලහකාරී තත්ත්වයක් නොමැති බව මීගමුව බන්ධනාගාර අධිකාරි වජිර අබේධීර මහතා දැනුම් දුන් බවත්, ඒ වන විට මීගමුව බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී කාර්යාලය, ගිණුම්, ගබඩා, පුනරුත්ථාපන අංශ ඇතුළු ස්ථාන කිහිපයකට රැඳවියන් විසින් හානි සිදුකර තිබූ බවත්, රැඳවියන් හට උදෑසන ආහාර ලබාදීමෙන් අනතුරුව පෙ.ව. 9.45ට පමණ තමා පිටතට පැමිණි බවත්, ඒ සමඟම බන්ධනාගාරය තුළින් කෑගැසීමක් ඇසුණු බවත්, ඒ අවස්ථාවේදී බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් බන්ධනාගාරයේ ලී දොරෙන් ඇතුළට ගිය අතර, ඔවුන් සමඟ තමාද නැවත ඇතුළට ගිය බවත්, එහිදී රැඳවියන් විසින් නිලධාරීන් දෙසට ගල් විසි කළ බවත්, ඒ සමඟ ඇතුළට ගිය නිලධාරීන් නැවත ගේට්ටුව දෙසට දිව ආ බවත්, ඒ අවස්ථාවේදී තමා ද ලී දොරෙන් පිටතට පැමිණි බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් බන්ධනාගාරයේ ඇතුළත සිරවී ඇති බව නිලධාරීන් විසින් තමාට දැනුම් දීමෙන් පසු ඔවුන් බේරාගැනීමට පොලිසිය හා විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට දැනුම් දුන් බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් සඳහන් කර ඇත.

බන්ධනාගාරයේ දොරටු කඩා පිටතට පැමිණීමට රැඳවියන් උත්සාහ කරන්නේ නම් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා බන්ධනාගාර ආඥා පනතේ 77 වගන්තිය යටතේ ක්‍රියාමාර්ග ගත හැකි බවත්, රැඳවියන් බන්ධනාගාරයෙන් පිටතට පැමිණියේ නම් විශාල විනාශයක් සිදු වන බවත්, ඒ අනුව රැඳවියන් ලී දොර කඩා පිටතට පැමිණීමට උත්සාහ කළ අවස්ථාවේ එය වලක්වාලීමේ අරමුණින්

බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් ඉහළට වෙඩි තබා පසුව ලී දොර දෙසට ද වෙඩි තැබූ බවත්, ඒ සමඟ ලී දොර ආසන්නයේ සිටි රැඳවියන් පසුපසට ගිය බැවින් රැඳවියන් නැවත පිටතට පැමිණීම වැළැක්වීමට පොලිස් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 වන දින උදෑසන සාමකාමීව සිටි රැඳවියන් අතර හදිසි නොසන්සුන්තාවයක් ඇතිවීමට හේතුව බන්ධනාගාරයේ වාට්ටු අංක 6 හා 7 ආසන්නයේ රැඳවියන් පිරිසක් තවත් රැඳවියන් පිරිසකට පහරදීම වැළැක්වීමට නිලධාරීන් කටයුතු කළ අවස්ථාවේදී නිලධාරීන්ට ද රැඳවියන් විසින් පහරදීම හේතුවෙන් ඇති වූ ගැටුම බව තමාට පසුව දැනගන්නට ලැබුණු බවත්, කෙසේවෙතත් 2026.07.05 සහ 06 දින වල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වයෙන් නිලධාරීන් 10 දෙනෙකු සහ රැඳවියන් 22 දෙනෙකු මියගොස් ඇති බවත්, මියගිය හා තුවාල ලැබූ නිලධාරීන් 21 දෙනෙකු සහ රැඳවියන් 106 දෙනෙකු සිටි බවත් බන්ධනාගාර කොමසාරිස් අනුරුද්ධ ගජනායක මහතා විසින් සඳහන් කර ඇත.

### 8.4 මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතාගේ කරුණු දැක්වීම.

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.23 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ලෙස තමා 2026.07.02 දින රාජකාරි භාරගත් බවත්, 2026.07.05 දින රාජකාරියේ නිරතව සිටි බවත්, එදින ප.ව. 12.45ට පමණ තමා දිවා ආහාර සාම්පලය පරීක්ෂා කර රැඳවියන්ට ආහාර බෙදාදීමට නිලධාරීන්ට උපදෙස් දුන් බවත්, ප.ව. 1.00ට පමණ බන්ධනාගාරය තුළින් විශාල සෝෂාවක් ඇසුණු බවත්, ආහාර බෙදාදෙන ස්ථානය ආසන්නයෙන් පොලු හා මුගුරු රැගෙන රැඳවියන් දෙවන වාට්ටුව දෙසට පැමිණෙමින් සිටි බවත්, රැඳවියන් හට පහරදීම් සිදුව තිබීම හේතුවෙන් තත්ත්වය පාලනය කිරීමට නිලධාරීන්ට අපහසු බවත්, ඒ අනුව සයිරන් නාද කළ බවත්, ප.ව. 1.15ට පමණ බන්ධනාගාර අධිකාරිවරයා දැනුවත් කර පොලීසිය හා අදාළ ආරක්ෂක අංශ දැනුවත් කිරීමට කටයුතු කළ බවත්, මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.05 වන දින ප.ව. 1.45ට පමණ මීගමුව බන්ධනාගාර අධිකාරිවරයා පැමිණි බවත්, ඒ වේලාවේ දී මීගමුව බන්ධනාගාර අධිකාරිවරයාගේ උපදෙස් මත නියාමක ජයසිංහ නිලධාරියා විසින් ඉහළට වෙඩි තැබීමක් සිදු කළ බවත්, එදින ප.ව. 2.00-2.30 අතර කාලය වන විට පොලීසිය හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරයෙන් පිටතට පැමිණ සිටි බවත්, ඒ වන විට තුවාල ලැබූ රැඳවියන් ගිලන් රථ, බන්ධනාගාර වෑන් රථ හා බස් රථ මගින් රෝහල්ගත කිරීමට කටයුතු කළ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත. එදින

ප.ව.4.00–4.15 අතර බන්ධනාගාර කොමසාරිස් ගජනායක මහතා හා බන්ධනාගාර කොමසාරිස් පාලන බස්නායක මහතා පැමිණ රැඳවියන් සමඟ සාකච්ඡා කළ බවත්, ප.ව. 5.00-5.30 අතර බන්ධනාගාර කොමසාරිස් පල්ලේතැන්න මහතා හා වැඩබලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාද පැමිණ රැඳවියන් සමඟ සාකච්ඡා කළ බවත්, එම සාකච්ඡා සාර්ථක නොවූ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, රැඳවියන් විසින් ඔවුන්ව රඳවා තිබූ වාට්ටු කිහිපයක ඉබි යතුරු කඩා තිබූ බැවින් ඒවා වසා දැමීමට නොහැකි වූ බවත්, බන්ධනාගාරයේ බන්ධනාගාර රෝහල, අධිකාරි කාර්යාලය, ප්‍රධාන ජේලර් කාර්යාලය, උපකරණ ගබඩාව, පුනරුත්ථාපන හා විනය අංශවලට ද රැඳවියන් විසින් හානි සිදුකර තිබූ බවත්, 2026.07.05 දින ප.ව. 3.00ට පමණ කාන්තා රැඳවියන් පිරිසක් කාන්තා අංශයේ වහලයට නැග සිටි බවත්, එදින එනම්, 2026.07.05 වන දින සවස බන්ධනාගාරයේ තිබූ සියලුම අවි හා උණ්ඩ ආරක්ෂිත ස්ථානයකට ඉවත් කිරීමටද කටයුතු කළ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත. එසේම, එදින රාත්‍රී ආහාරය සකස් කිරීමට නොහැකි වූ බැවින් පල්ලන්සේන බන්ධනාගාරයෙන් රාත්‍රී 8.30-9.00 අතර පාන් හා පොල් සම්බෝල ගෙනැවිත් රැඳවියන්ට බෙදා දුන් බව ද මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් දක්වා ඇත.

ඊට පසුදින එනම්, 2026.07.06 දින උදෑසන මීගමුව බන්ධනගරයේ අධිකාරිවරයා, බන්ධනාගාර කොමසාරිස් ගජනායක මහතා සහ අනෙකුත් නිලධාරීන් සමඟ රැඳවියන්ට ආහාර ලබාදී වාට්ටු වසා දැමීමට කටයුතු කළ බවත්, වාට්ටු කිහිපයකට ආහාර ලබාදීමෙන් අනතුරුව නැවත ගැටුම්කාරී තත්ත්වයක් ඇති වූ බවත්, සිල්වා සහ මාරසිංහ යන බන්ධනාගාර නිලධාරීන් දෙදෙනාට රැඳවියන් පහරදී තිබූ බවත්, පසුව රැඳවියන් විශාල පිරිසක් යකඩ ගේට්ටුව කඩා පිටතට පැමිණීමට උත්සාහ කළ බවත්, බන්ධනාගාරයේ පාලනය රැඳවියන් අතට පත්වීම හේතුවෙන් නිලධාරීන්ට පසුබැසීමට සිදු වූ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, මීගමුව බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයාගේ උපදෙස් මත නිලධාරීන් කිහිපදෙනෙකුට අවි නිකුත් කළ බවත්, දොර කඩාගෙන පැමිණියහොත් වෙඩි තැබීමට එකී නිලධාරීන් හට උපදෙස් ලබාදී තිබූ බවත්, නියාමක වේරකේ නම් නිලධාරියා විසින් රැඳවියන් හට අනතුරු ඇඟවීමෙන් පසු ඉහළට සහ බන්ධනාගාරයේ ලී දොරෙහි කවුළුවෙන් ඇතුළත බිත්තිය දෙසට වෙඩි තැබීමක් සිදුකළ බවත්, එම වෙඩි තැබීමත් සමඟ රැඳවියන් පසුපසට ගිය බවත්, ඒ සමඟ බන්ධනාගාර, පොලිස් සහ කැරලි මර්ධන නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එලෙස ඇතුළට යාමෙන් පසුව තුවාල ලැබූවන් රෝහල්ගත කිරීමට කටයුතු කළ බවත්, 2026.07.06 දින මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් පස් දෙනෙකු තුවාල ලබා ඇති අතර, රැඳවියන්

කිහිපදෙනෙකුටද තුවාල සිදුව තිබූ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත.

තවද, 2026.07.05 වන දින සවස අවි ගබඩාවේ තිබූ එදිනෙදා භාවිතයට ගන්නා අවි ඉවත් කරගෙන තිබුණ ද, එලෙස භාවිතයට නොගන්නා අවි ඉතිරිව තිබී ඇති බවත්, උණ්ඩ සියල්ලම 2026.07.05 වන දින ඉවත් කරගෙන තිබූ නමුත්, 2026.07.06 වන දින ප්‍රධාන මුර අට්ටාලයේ සිටි නිලධාරීන් දෙදෙනෙකු ජීව උණ්ඩ සහිත මැගසින් දෙකක් අට්ටාලයේ අතහැර ගොස් තිබූ බව පසුව අනාවරණය වූ බවත්, එම උණ්ඩ රැඳවියන් විසින් ලබාගන්නට ඇති බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත. එසේම, සිද්ධියෙන් පසු රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමට කටයුතු කළ බවත් මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.05 දින වන විට බන්ධනාගාරයේ රැඳවියන් 2,417ක් පමණ සිටි බවත්, එම පිරිස පාලනය කිරීමට රාජකාරියේ සිටි නිලධාරීන් ප්‍රමාණවත් නොවූ බවත්, කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් නිලධාරීන්ට අඛණ්ඩව රාජකාරි කිරීමට සිදුවන බවත්, මෙවැනි තත්ත්වයන් පාලනය සඳහා නවීන තාක්ෂණික මෙවලම් යොදා ගැනීමත්, අවි ආයුධ සඳහා වෙන් වූ ආරක්ෂිත ගබඩා තිබීමත්, මෙවැනි සිද්ධි සඳහා යෙදවීමට විශේෂ පුහුණුව ලත් නිලධාරීන් සිටීමත් අවශ්‍යවන බව මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.5 මීගමුව බන්ධනාගාර නියාමක තුසිත වේරකේ මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක තුසිත වේරකේ මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.23 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2012.09.20 දින තමා බන්ධනාගාර සේවයට එක්වී 2023.08.18 දින සිට මීගමුව බන්ධනාගාරයේ සේවය කරන බවත්, 2026.07.05 දින ඩෙංගු රෝගී තත්ත්වයක් හේතුවෙන් නිල නිවාසයේ රැඳී සිටියදී ප.ව. 1.00ට පමණ බන්ධනාගාරය දෙසින් විශාල ශබ්දයක් ඇසීමෙන් අනතුරුව ප්‍රධාන දොරටුව වෙත ගිය බවත්, එහිදී රැඳවියන් 400-500ක් පමණ පොලු, යකඩ බාර් සහ වෙනත් උපකරණ රැගෙන කලහකාරී ලෙස හැසිරෙමින් සිටි බවත්, රැඳවියන් කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් ඇති වී ඇති බව දැනගත් බවත්, පරිපාලනයට සහාය දුන් රැඳවියන් කිහිපදෙනෙකුට අනෙක් රැඳවියන් විසින් පහරදී ඇති බව දැනගන්නට ලැබුණු බවත් නියාමක වේරකේ මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, තුවාල ලැබූ රැඳවියන් කිහිපදෙනෙකු රෝහල්ගත කර ඇති බවත්, තවත් රැඳවියන් ජීවිත ආරක්ෂාව සඳහා සැඟවී සිටින බව දැනගත් බවත්, නිලධාරීන් විසින් බන්ධනාගාරයට ඇතුළු නොවන ලෙස අවවාද කළද සැඟවී සිටි රැඳවියන් බේරා ගැනීමේ අරමුණින් තමා බන්ධනාගාරයට ඇතුළු වූ බවත්, එහිදී “කටුවැල්ලේගම සුරේෂ්” ඇතුළු රැඳවියන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳව

විමසා සිටි බවත්, එහිදී ජොෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඔවුන් ඉල්ලා සිටි බවත්, එම අවස්ථාවේ දී වාට්ටු තුළ සැඟවී සිටි හා තුවාල ලැබූ රැඳවියන් 15-20 දෙනෙකු පමණ ආරක්ෂිතව පිටතට ගෙන ඒමට කටයුතු කළ බවත් නියාමක වේරකෝ මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, ඒවන විට බන්ධනාගාර රෝහල, අධිකාරී කාර්යාලය, ප්‍රධාන ජේලර් කාර්යාලය, ගිණුම් අංශය, කාර්ය මණ්ඩල අංශය, උපකරණ ගබඩාව, මුළුතැන්ගෙය හා විනය අංශය ඇතුළු ස්ථාන රැසකට දැඩි හානි සිදුව තිබූ බවත්, තුවාල ලැබූ රැඳවියන් රෝහල්ගත කිරීමට කටයුතු කළ බවත්, 2026.07.05 දින ප.ව. 6.30-7.00 පමණ නිල නිවාසයට ගොස් විවේක ගෙන නැවත පැමිණි බවත්, එහිදී ඇතැම් රැඳවියන් මත්ද්‍රව්‍ය භාවිත කළ තත්ත්වයකින් කලහකාරීව හැසිරෙමින් සිටි බවත් නියාමක වේරකෝ මහතා විසින් ප්‍රකාශ කර ඇත.

බන්ධනාගාරයේ පරිපාලනයට සහාය වූ රැඳවියන් කිහිපදෙනෙකු බරපතළ ලෙස තුවාල ලබා ඇති බවත්, දෙදෙනෙකු මියගොස් ඇති බවත් දැනගත් බවත්, එම තුවාලකරුවන් පිළිබඳ සොයා බැලීම සඳහා තමා පුද්ගලික යතුරුපැදියකින් මීගමුව මහ රෝහලට ගිය බවත්, ඒ වන විට මධ්‍යම රාත්‍රියට ආසන්නව තිබූ බවත්, නිශ්චිතව වේලාව මතක නොමැති බවත්, එහිදී පොලිස් නිලධාරීන් විසින් තුවාල ලැබූ රැඳවියන්ගෙන් ප්‍රකාශ ලබා ගනිමින් සිටි බව තමා දුටු බවත් නියාමක වේරකෝ මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 පෙ.ව. 7.50ට තමා සේවයට වාර්තා කළ බවත්, පෙ.ව. 8.00ට A1 සහ A2-1 වාට්ටුවල රාජකාරියට යොදවූ බවත්, පෙ.ව. 9.45ට පමණ සෙනෙවිරත්න ජේලර්වරයා සහ බන්ධනාගාර පොලීසිය සමඟ එක්ව එක් වාට්ටුවක් බැගින් විවෘත කර පාන්, සම්බෝල හා ජලය රැඳවියන්ට ලබාදුන් බවත්, පෙ.ව. 11.00ට පමණ තුවාල ලැබූ රැඳවියෙකුට තවත් රැඳවියන් පිරිසක් පොලු, ගල් හා යකඩ උපකරණ රැගෙන පහරදීමට පැමිණි අතර, ඔහු බේරා ගැනීමට මැදිහත් වූ නිලධාරීන්ටද පහරදුන් බවත් නියාමක වේරකෝ මහතා විසින් සඳහන් කර ඇත. ඉන් අනතුරුව රැඳවියන් 2,000කට ආසන්න පිරිසක් ප්‍රධාන යකඩ දොරටුව හරහා පිටතට පැමිණීමට උත්සාහ කළ බවත්, ලී දොර වසා දැමීමෙන් අනතුරුව ඇතුළත සිටි නිලධාරීන්ට රැඳවියන් විසින් පොලු, ගල්, මල් පෝච්චි සහ වෙනත් උපකරණවලින් පහර දී ඇති බවත්, ප්‍රධාන ජේලර්වරයාගේ නියෝග මත සීඉසෙඩ් වර්ගයේ ටී58 ගිනි අවියක් සහ උණ්ඩ පුරවන ලද මැගසින් දෙකක් ලබාගෙන ලී දොරටුව අසල ස්ථානගතව සිටි බවත්, රැඳවියන් දොර කඩාගෙන පැමිණියහොත් පළමුව අහසට වෙඩි තබා අනතුරු ඇඟවීමටත්, එය නොතකා ඉදිරියට පැමිණියහොත් වෙඩි තැබීමටත් ප්‍රධාන ජේලර්වරයාගෙන් උපදෙස් ලැබුණු බව නියාමක වේරකෝ මහතා විසින් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව රැඳවියන් ලී දොරටුව කඩාගෙන පිටතට පැමිණීමට උත්සාහ කළ අවස්ථාවේදී ගිනි අවිය භාවිත කළ බවත්, තමා පළමුව අහසට වෙඩි තැබූ බවත්, පසුව රැඳවියන් විසින් ලී දොරේ කුඩා සිදුරකින් ගිනි අවියක කොටසක් පිටතට යොමු කළ බැවින් තමා අනතුරු ඇඟවීමෙන් පසු ලී දොර

දෙසට වෙඩි තැබූ බවත්, එම වෙඩි තැබීම කිසිදු පුද්ගලයෙකු ඉලක්ක කර සිදු නොකළ බවත්, එම ස්ථානය පිටුපස බිත්තියක් ඇති බව තමන් දැන සිටි බැවින් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියා කළ බවත් නියාමක වේරකේ මහතා විසින් සඳහන් කර ඇත. ඒ සමඟම රැඳවියන් විසින් ලී දොර දෙසින් පිටුපසට ගිය බැවින් පොලිස් විශේෂ කාර්ය බලකා, ශ්‍රී ලංකා පොලිස්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා හා බන්ධනාගාර නිලධාරීන් සමඟ තමා ද බන්ධනාගාරය තුළට ඇතුළු වූ බවත්, එහිදී බරපතළ ලෙස පහර කා සිටි නිලධාරීන් හා රැඳවියන් රෝහල්ගත කිරීමට සහාය වූ බවත්, බන්ධනාගාර අධිකාරී කාර්යාලය ආසන්නයේ සහ වෙනත් ස්ථානවල තිබූ ගිනි අවි කිහිපයක් හා මැගසින් සොයා නිලධාරීන්ට භාරදුන් බවත්, වාට්ටු අසලදී තවත් ගිනි අවි භාවිත කරමින් රැඳවියන් පලායන ආකාරය දුටු බවත් නියාමක වේරකේ මහතා විසින් සඳහන් කර ඇත.

වාට්ටු අංක 12 ආසන්නයේදී හිස් මැගසින් තුනක් සොයාගත් බවත්, එම ස්ථානය ආසන්නයෙන් වෙඩි ශබ්ද දෙකක් ඇසී ගිනි අවියක් රැගෙන රැඳවියෙකු පලායනු දුටු බවත්, තම ගිනි අවිය ක්‍රියා විරහිත වී තිබූ අතර තමන් සතුව තිබුණේ හිස් මැගසින් පමණක් බැවින් එම ස්ථානයේ තවදුරටත් රැඳී සිටීම අනාරක්ෂිත බවට අනෙකුත් නිලධාරීන්ට දැනුම් දුන් බවත්, අනතුරුව තමන් සතුව තිබූ ගිනි අවිය හා මැගසින් දෙකත් සොයාගත් හිස් මැගසින් තුනත් මංජුල මහතාට භාරදී තුවාල ලැබූ නිලධාරීන් හා රැඳවියන් රෝහල්ගත කිරීමට සහාය වූ බවත් නියාමක වේරකේ මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තමා රාජකාරිය නිසි පරිදි ඉටු කරමින් ජීවිත හා රජයේ දේපළ ආරක්ෂා කිරීම සහ විශාල විනාශයක් වැළැක්වීමේ අරමුණින් ක්‍රියා කළ බවත්, කිසිදු පුද්ගලයෙකුට හානි කිරීමේ අරමුණක් නොතිබූ බවත්, මීගමුව බන්ධනාගාරයේ වාට්ටු 14ක් පවතින අතර සාමාන්‍යයෙන් වාට්ටු රාජකාරි සඳහා නිලධාරීන් 4-6 දෙනෙකුත් ප්‍රධාන දොරටුව හා මුර අට්ටාල සඳහා 7-8 දෙනෙකුත් යොදවා ඇති බවත්, බන්ධනාගාරයේ රැඳවියන් 2,400ක් පමණ සිටි බවත් නියාමක වේරකේ මහතා විසින් සඳහන් කර ඇත.

මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා බන්ධනාගාර තදබදය අවම කිරීම, ප්‍රමාණවත් බන්ධනාගාර නිලධාරීන් බඳවා ගැනීම, සුළු වැරදි සඳහා සිරදඬුවම් වෙනුවට විකල්ප ක්‍රම හඳුන්වාදීම, අධි අවදානම් සහ ප්‍රචණ්ඩ රැඳවියන් අධි ආරක්ෂිත බන්ධනාගාරවල රඳවා තැබීම සහ හදිසි තත්ත්වයන් සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් හා බලතල පැවරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම අවශ්‍ය බවත් නියාමක වේරකේ මහතා විසින් සඳහන් කර ඇත. මෙම සිදුවීම හේතුවෙන් තමාට, බිරිඳට සහ දරුවන් දෙදෙනාට ජීවිත අවදානමක් පවතින බවත්, දරුවන් පාසල් නොගොස් නිවසේ රැඳී සිටින බවත්, තම පවුලට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත් නියාමක වේරකේ මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**8.6 මීගමුව බන්ධනාගාරයේ නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතාගේ කරුණු දැක්වීම**

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.24 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා මීගමුව බන්ධනාගාරයට අනුයුක්තව නියාමකවරයෙකු ලෙස සේවය කරන බවත්, 2026.07.05 දින මාරවිල අධිකරණයේ රාජකාරියේ නිරතව සිටි බවත්, එදින ප.ව. 1.00ට පමණ මීගමුව බන්ධනාගාරයේ හදිසි තත්ත්වයක් ඇතිවී ඇති බැවින් අධිකරණයෙන් බන්ධනාගාර ගතකරන සැකකරුවන් මීගමුව බන්ධනාගාරයට රැගෙන නොඑන ලෙසත්, හලාවත සිර මැදිරිය වෙත රැගෙන යන ලෙසත් බන්ධනාගාර දුරකථන ක්‍රියාකරු විසින් තමා සමඟ සිටි අධිකරණ රාජකාරි භාරව සිටි නිලධාරියාට දැනුම් දී තිබූ බවත්, ඒ අනුව සැකකරුවන් 8-10 දෙනෙකු හලාවත සිර මැදිරියට රැගෙන ගොස් භාරදී ප.ව. 6.30ට පමණ මීගමුව බන්ධනාගාරයට පැමිණි බවත්, එලෙස පැමිණෙන විට බන්ධනාගාරයේ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත්ව තිබුණු නමුත්, තමාට රාජකාරි අවසන් කිරීමට නොහැකි වූ අතර රාත්‍රී 10.00 පමණ වනතෙක් බන්ධනාගාරයේ ආරක්ෂක රාජකාරියේ නිරතව සිටි බවත්, 2026.07.05 දින ඇතිවූ සිද්ධිය පිළිබඳව අනෙකුත් නිලධාරීන්ගෙන් විමසූ විට, සුරේෂ් නමැති රැඳවියෙකු ඇතුළු පිරිසක් පරිපාලන කටයුතු සඳහා සහාය වන රැඳවියන් පිරිසකට පහරදී ඇති බවත්, එහිදී දෙදෙනෙකු මියගොස් තවත් පිරිසක් තුවාල ලබා රෝහල්ගත කළ බවත් දැනගත් බවත් මීගමුව බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, ඊට පසුදින එනම්, 2026.07.06 දින පෙ.ව. 7.00ට රාජකාරි සඳහා අත්සන් කර, ප්‍රධාන අවි අට්ටාලයේ රාජකාරි භාරගත් බවත්, එහිදී ටී-56 සහ ටී-58 ගිනි අවි දෙකක් එම අට්ටාලයේ තිබූ බවත්, වෙනත් දින වලදී එහි තිබෙන්නේ ටී-56 ගිනි අවියක් සහ උණ්ඩ 30ක් සහිත මැගසින් දෙකක් පමණක් බවත්, ටී-56 ගිනි අවියෙන් එක් උණ්ඩයක් 2026.07.05 වන දින ඇතිවූ හදිසි තත්ත්වය හේතුවෙන් උඩට වෙඩි තැබීමට භාවිත කළ බවට එදින රාජකාරියේ සිටි නිලධාරියා විසින් සටහන් යොදා තිබූ බවත්, ඒ අනුව තමා ටී-56 ගිනි අවිය සහ ඊට අදාළ උණ්ඩ 29ක් හා 30ක් සහිත මැගසින් දෙකක් සහ ටී-58 ගිනි අවියක් සහ ඊට අදාළ උණ්ඩ 30ක් සහිත මැගසින් දෙකක් භාරගත් බවත්, එම අවස්ථාවේදී වැලිකඩ බන්ධනාගාරයෙන් පැමිණි හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් දෙදෙනෙකුද එම අට්ටාලයේ සිටි බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් සඳහන් කර ඇත.

තමා රාජකාරි කළ ප්‍රධාන අවි අට්ටාලයට වයි ඕ වාට්ටුව, ඒ 1 වාට්ටුව, ඒ 2 වාට්ටුව, 1 වාට්ටුව සහ ඒ අතර තිබෙන මිදුල පෙනෙන බවත්, 2026.07.06 වන දින පෙ.ව. 9.50ට පමණ එම වාට්ටු වල සිටි රැඳවියන් හට නිලධාරීන් උදෑසන ආහාර බෙදා දුන් බවත්, ආහාර බෙදා දී රැඳවියන් ගණන් කර වාට්ටු වැසූ බවත්, එම කාර්යය සඳහා නියාමක සම්පත් ද සිල්වා, ජී.එස්.එන්. ගමගේ, පී.පී.පී. ඉහළකුඹුර, මාරසිංහ ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගී වූ බවත්, එම අවස්ථාවේ බන්ධනාගාර කොමසාරිස් ගජනායක මහතා ඇතුළු ඉහළ නිලධාරීන් කිහිපදෙනෙකුද එහි සිටි බවත්, ඉන්පසුව නිලධාරීන් පිටුපස

වාට්ටු වලට ආහාර බෙදීමට ගිය බවත්, එකී වාට්ටු තමා සිටි අවි අට්ටාලයට නොපෙනන බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.06 වන දින පෙ.ව. 10.45-10.50 අතර කාලයේදී පිටුපස වාට්ටුවල සිටි රැඳවියන් 50කට ආසන්න පිරිසක් කෑම බෙදමින් සිටි නිලධාරීන්ට පහරදීගෙන මෙන් යකඩ ගේට්ටුව දෙසට පැමිණෙනු තමා දුටු බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා සහ අනෙකුත් බන්ධනාගාර නිලධාරීන් බැටන් පොලු සහ පලිහන් රැගෙන බන්ධනාගාරය තුළට ගිය බවත්, ඒ අවස්ථාවේදී රැඳවියන් විශාල පිරිසක් පසුපසට දිව ගිය බවත්, අනතුරුව රැඳවියන් 300–400ක පමණ පිරිසක් නිලධාරීන්ට පහරදෙමින් ගේට්ටුව දෙසට පැමිණි බවත්, උළු කැට හා ගල්වලින් තමා සිටි අට්ටාලයට ද රැඳවියන් පහර දුන් බවත්, එහිදී තමාටද ගල් පහර කිහිපයක් වැදුණු බවත්, තමා අට්ටාලයෙන් අඩි පහක් පමණ යට තිබෙන කොන්ක්‍රීට් ස්ලැබ් එකට බැස්ස බවත්, තමා එසේ බැසීමට පෙර මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් දෙතුන් දෙනෙකුද කොන්ක්‍රීට් ස්ලැබ් එකට පැමිණ සිටි බවත්, තමා අට්ටාලයේ තිබූ ටී-56 ගිනි අවිය ගත් බවත්, අනෙක් ටී -58 අවිය වෙනත් නිලධාරියෙකු විසින් ගත් බවත්, තමා සහ අවිය ගත් අනෙක් නිලධාරියා විසින් තත්ත්වය පාලනය කිරීමට  කොන්ක්‍රීට් ස්ලැබ් එකෙහි සිට ඉහළට වෙඩි තැබූ බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේ දී රැඳවියන් විශාල පිරිසකගේ ශබ්දය ඇසුණු බවත්, යකඩ ගේට්ටුව කඩා රැඳවියන් ලී දොර දෙසට පැමිණි බව ඇසුණු ශබ්ද වලින් තමාට තේරුණු බවත්, තමා සිටි අට්ටාලයට නැගීමට ඇති ඉණිමඟ ඇත්තේ යකඩ ගේට්ටුව සහ ලී දොර අතර තිබෙන බොඩි ස්කෑන් යන්ත්‍රය තිබූ කාමරයෙන් බවත්, ඒ අවස්ථාවේ දී ඇතුලේ තිබූ යන්ත්‍ර කඩා බිඳ දමන ශබ්දය ඇසුණු බවත්, ඒ වේලාවේදී ජීවිතයට අවදානමක් ඇති බව හැඟී ගිය බැවින් තමා ඒ අසල තිබූ කොහොඹ ගසට නැග එයින් බන්ධනාගාරයෙන් පිටතට පැමිණි බවත්, ඒ අවස්ථාවේ බන්ධනාගාරය ඉදිරිපිට බන්ධනාගාර, ශ්‍රී ලංකා පොලිස් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් විශාල පිරිසක් සිටි බවත්, තමා ගසෙන් බසිනවාත් සමඟම එම නිලධාරීන් බන්ධනාගාරය තුළට ගිය බවත්, පසුව තම ගිනි අවිය තාවකාලික අවි ගබඩාව වෙත භාරදුන් බවත්, ලේ පෙරාගත් බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාරයෙන් පිටතට ගෙන ආ බවත්, එකී තුවාල ලැබූ බන්ධනාගාර නිලධාරීන් ගිලන් රථ වෙත රැගෙන යාමට තමා සහාය වූ බවත්, තමාට භාරදී තිබූ මැගසින් දෙකක් අට්ටාලය මත දමා ආ බව පසුව සිහිවී නැවත ගොස් පරීක්ෂා කළ බවත්, ඒ අවස්ථාවේ එහි විශේෂ කාර්ය බලකා නිලධාරීන් තිදෙනෙකු සිටි බවත්, එහෙත් එම මැගසින් දෙක එහි නොතිබූ බව එම නිලධාරීන්ද ප්‍රකාශ කළ බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තමාගේ රාජකාරිය අනුව මුර අට්ටාලයේ සිට බන්ධනාගාරයේ ආරක්ෂාව නිරීක්ෂණය කිරීම හා රැඳවියන් පලායාම වැළැක්වීම ප්‍රධාන වගකීම බවත්, කැරල්ලක් ඇති වූ අවස්ථාවක තත්ත්වය පාලනය කිරීම සඳහා ඉහළට වෙඩි තැබිය හැකි නමුත්, බන්ධනාගාරය තුළට වෙඩි තැබිය නොහැකි බවත්,  එමෙන්ම සිද්ධියෙන් පසු නිලධාරීන් කිහිපදෙනෙකු තුවාල ලබා ඇති අතර ඉහළකුඹුර

නිලධාරියාද තුවාල ලබා තිබූ බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් සඳහන් කර ඇත.

තවද, මෙවැනි හදිසි තත්ත්වයන්ට මුහුණදීම සඳහා නිලධාරීන්ට ප්‍රමාණවත් පුහුණුවක් අවශ්‍ය බවත්, කඳුළු ගෑස් වැනි උපකරණවල හිඟයක් පවතින බවත්, බන්ධනාගාර නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බවත්, ඇතැම් නිලධාරීන්ට අඛණ්ඩව දින 10ක් පමණ රාජකාරි කිරීමට සිදුවන අතර, නිවාඩු ලබාගැනීමද අපහසු බැවින්, එම තත්ත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් බන්ධනාගාර නියාමක ආර්.ඒ. ප්‍රගීත් අසංක මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.7 මීගමුව බන්ධනාගාරයේ නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.24 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2017.11.27 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවට බැඳී මූලික පුහුණුවෙන් අනතුරුව මඩකලපුව බන්ධනාගාරයේ සේවය කළ බවත්, 2021.03.13 දින සිට මීගමුව බන්ධනාගාරයේ සේවය කරන බවත්, 2026.07.05 දින පෙ.ව. 7.00ට සේවයට වාර්තා කළ බවත්, එදින දෙවන මුර සේවයට නියමිතව තිබූ බැවින් පෙ.ව. 11.40ට මීගමුව රෝහලේ වාට්ටු අංක 04හි ප්‍රතිකාර ලබමින් සිටි බන්ධනාගාර නිලධාරියකුට දිවා ආහාරය ලබාදීම සඳහා ගිය බවත්, ප.ව. 12.00 සිට ප.ව. 2.00 දක්වා පමණ රෝහලේ රැඳී සිටි අවස්ථාවේදී නියාමක සිරිවර්ධන මහතා පැමිණ බන්ධනාගාරය තුළ රැඳවියන් දෙපිරිසක් අතර ගැටුමක් ඇතිවී තුවාල ලැබූවන් රෝහලට රැගෙන එන බව දැනුම් දුන් බවත්, ඒ අනුව ප.ව. 6.30 පමණ දක්වා රෝහලේ සහායක කටයුතුවල නිරත වී ප.ව. 6.45ට පමණ බන්ධනාගාරයට පැමිණි බවත් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව 2026.07.05 වන දින ප.ව. 7.15 පමණ ප්‍රධාන මුර අට්ටාලයේ රාජකාරිය භාරගත් බවත්, රාජකාරි භාරගැනීමේදී ටී-56 ගිනි අවියක් සහ උණ්ඩ සහිත මැගසින් දෙකක්ද, තවත් ගිනි අවියක් හා උණ්ඩ සහිත මැගසින් දෙකක්ද අදාළ පොතේ සටහන් කර භාරගත් බවත්, රාත්‍රී 8.00-9.00 පමණ වන විට රැඳවියන් වාට්ටු වලින් පිටත සිට ඇවිදිමින් හා ගී ගයමින් සිටි බවත්, උසස් බන්ධනාගාර නිලධාරීන් පැමිණ රැඳවියන් සමඟ සාකච්ඡා කළ බවත්, එම අවස්ථාවේදී විශාල කලබලයක් නොතිබූ නමුත්, වාට්ටුවල දොරවල් වසා නොතිබූ බවත්, තමා රාජකාරී කළ ප්‍රධාන මුර අට්ටාලයේ සිට කාන්තා අංශය දර්ශනය වන අතර, ප.ව. 7.30 පමණ වන විට කාන්තා රැඳවියන් වහලය මතට නැගී කෑකෝ ගසමින් සිටි බව තමා දුටු බවත් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින පෙ.ව. 6.30ට රාජකාරියෙන් නිදහස්ව පෙ.ව. 9.30 පමණ මීගමුව මහජන බැංකුවට ගොස් පෙ.ව. 10.15 පමණ නැවත බන්ධනාගාරයට පැමිණි බවත්, එහිදී රැඳවියන්ට ආහාර ලබාදීමේදී ගැටලුවක් ඇතිවී ඇති බව දැනගත් බවත්, බන්ධනාගාර ගේට්ටුව අසලට පැමිණි විට රැඳවියන්ගේ කෑගැසීම් ඇසුණු බවත්, පසුව ප්‍රධාන අවි මුර අට්ටාලය වෙත ගොස් ඉහළට නැගීමේදී ගල් හා උළු කැබලි ඒ දෙසට පැමිණෙමින් තිබූ බවත්, බන්ධනාගාරයේ තත්ත්වය දැඩි ලෙස උණුසුම් වී තිබූ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා විසින් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී මුර අට්ටාලයේ තිබූ සීඉසෙඩ් ගිනි අවියක් ලබාගෙන අහසට වෙඩි උණ්ඩ දෙකක් තැබූ බවත්, එහිදී ගිනි අවිය හිරවූ බවත්, මැගසින් එක ගලවා බැලීමේදී උණ්ඩයක් හරස්ව සිරවී තිබූ අතර, එය අතින් ඉවත් කිරීමට උත්සාහ කිරීමේදී බිමට වැටුණු බවත්, පසුව මැගසින් එක නැවත ගිනි අවියට සවි කළ බවත්, පසුව තමා වහලය ඔස්සේ ගමන් කර කොහොඹ ගසක ආධාරයෙන් බිමට බැස්ස බවත්, ගිනි අවියේ තිබූ උණ්ඩ සංඛ්‍යාව නිශ්චිතව මතක නොමැති බවත් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා විසින් සඳහන් කර ඇත.

පසුව රැඳවියන් විශාල පිරිසක් ප්‍රධාන අවි අට්ටාලය උඩට පැමිණි බවත්, නිලධාරීන් අහසට වෙඩි තැබූ බවත්, කෙටි වේලාවකින් ඔවුන් එම ස්ථානයෙන් බැස ගිය බවත්, අනතුරුව බන්ධනාගාර නිලධාරීන් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් තුවාල ලැබූවන් රෝහල් වෙත රැගෙන යාම සඳහා වාහනවලට ඇතුළත් කළ බවත්, ගිලන් රථ ද පැමිණි බවත්, තමා ද තුවාලකරුවන් රැගෙන යාමට සහාය වූ බවත්, බොහෝ පිරිසක් ලේ ගලන තත්ත්වයෙන් සිටි බවත්, බන්ධනාගාර පොලිස් නිලධාරීන් හෝ විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ඇතුලුවන අවස්ථාව තමා නොදුටු බවත් මීගමුව බන්ධනාගාර නියාමක ඊ.එම්.ආර්. සඳරුවන් ඒකනායක මහතා විසින් සඳහන් කර ඇත.

### 8.8 මීගමුව බන්ධනාගාරයේ කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මියගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.24 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා මීගමුව බන්ධනාගාරයේ කාන්තා අංශයේ කාන්තා දෙවන පෙළ ජේලර්වරියක් වන බවත්, තමා 2026.07.01 දින සිට අසනීප නිවාඩු ලබා සිටි බවත්, 2026.07.05 දින ලැබුණු බන්ධනාගාර කොමසාරිස්වරයාගේ නියෝගය අනුව 2026.07.06 දින උදෑසන රාජකාරියට වාර්තා කළ බවත්, රාජකාරියට පැමිණි බව ප්‍රධාන ජේලර්වරයාට දැනුම් දීමෙන් අනතුරුව, අසනීප තත්ත්වය හේතුවෙන් තමාට ලබාදී තිබූ කාමරයේ රැඳී සිටි බවත්, කාන්තා අංශයට නොයන ලෙස ජේලර්වරයෙකු විසින් උපදෙස් ලබාදී තිබූ බවත් මීගමුව බන්ධනාගාර කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මිය විසින් සඳහන් කර ඇත.

පසුව තමා බෙහෙත් ලබාගෙන බැරැක්කයෙන් පිටතට පැමිණි අවස්ථාවේදී බන්ධනාගාරය තුළ වෙඩි තැබීම් සිදුවන බව පවසමින් නිලධාරීන් හා නිලධාරිනියන් පාර දිගේ දිව එනු දුටු බවත්, අනතුරුව කාන්තා නිලධාරිනියන්ට සිවිල් ඇඳුම්වලට මාරුවන ලෙස උපදෙස් ලැබුණු බවත්, තමා ඇතුළු නිලධාරිනියන් සිවිල් ඇඳුම් ඇඳගෙන බන්ධනාගාරයෙන් පිටත රැඳී සිටි බවත්, පසුව 2026.07.06 වන දින ප.ව. 12.30ට පමණ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් නැවත බැරැක්කයට යාමට උපදෙස් ලබාදුන් බවත් මීගමුව බන්ධනාගාර කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මිය විසින් සඳහන් කර ඇත. එසේම, 2026.07.05 දින කාන්තා රැඳවියන් වහලයට නැගී සිටි බවත්, ඩෙංගු ඇතුළු රෝග සඳහා දිනපතා පෙ.ව. 9.00ට පමණ වෛද්‍යවරයෙකු පැමිණ ප්‍රතිකාර ලබාදෙන බවත්, කාන්තා අංශයේ රැඳවියන් සමඟ සිටින කුඩා දරුවන් සම්බන්ධයෙන් විශේෂ මාර්ගෝපදේශයක් නිලධාරීන්ට ලබාදී නොතිබූ බවත්, කාන්තා අංශයේ රැඳවියන් 160කට ආසන්න සංඛ්‍යාවක් සිටි අතර, කාර්ය මණ්ඩලය 25ක් පමණ සිටියද රාජකාරි සඳහා බොහෝ අවස්ථාවල තමා ඇතුළු නිලධාරිනියන් තිදෙනෙකු පමණක් යොදවා තිබූ බවත්, එමඟින් කාර්ය මණ්ඩල හිඟයක් පැවති බවත් මීගමුව බන්ධනාගාර කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මිය විසින් ප්‍රකාශ කර ඇත.

රැඳවියන් සමඟ කටයුතු කිරීමේදී නිලධාරීන් ආවේගශීලී නොවී කටයුතු කිරීම, ප්‍රමාණවත් ඉඩකඩ සැපයීම සහ කාර්ය මණ්ඩලය වැඩි කිරීම මෙවැනි සිදුවීම් වැළැක්වීමට අවශ්‍ය බවත් මීගමුව බන්ධනාගාර කාන්තා ජේලර් එච්.ඒ.එල්. මධුෂිකා මිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.9 මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.30 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2021.09.06 දින සිට මීගමුව බන්ධනාගාරයේ සේවය කරන බවත්, 2026.07.05 දින පෙ.ව. 8.00 සිට රැඳවියන් 09 දෙනෙකු සමඟ බන්ධනාගාර පරිශ්‍රය පිරිසිදු කිරීමේ රාජකාරියේ නිරතව සිට ප.ව. 12.17ට පමණ සේවයෙන් නිදහස් වූ බවත්, එදින ප.ව. 4.00ට පමණ රූපවාහිනියෙන් බන්ධනාගාරයේ රැඳවියන් අතර ගැටුමක් ඇති බව දැනගෙන නැවත බන්ධනාගාරයට පැමිණි බවත්, රැඳවියන් දෙදෙනෙකුට පහරදී රෝහල්ගත කර ඇති බව දැනගත් බවත්, පසුව රාත්‍රී 11.00ට පමණ මීගමුව රෝහලට ගොස් ආරක්ෂක රාජකාරියක නිරත වූ නියාමකවරයෙකුට සහනයක් ලබා දී, අලුයම 1.00ට පමණ නැවත බන්ධනාගාරයට පැමිණි බවත්, එම අවස්ථාවේ බන්ධනාගාරය තුළ සාමකාමී තත්ත්වයක් බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාව වන විට මාණ්ඩලික ලිපිකරු, ගිණුම්, විනය සහ උපකරණ ගබඩා අංශ ඇතුළු ස්ථාන රැඳවියන් විසින් විනාශ කර තිබූ අතර, බන්ධනාගාර රෝහල කඩා ඖෂධ ලබාගෙන පානය කර ඇති බවත්, පොලිස් විශේෂ කාර්ය බලකා, පොලිස් සහ බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාරයේ පිටත

ආරක්ෂාව සඳහා යොදවා සිටි බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.06 දින පෙ.ව. 8.00ට පමණ තමා මැගසින් අවි මුර අට්ටාලයේ රාජකාරියට වාර්තා කළ බවත්, ටී-56 ගිනි අවියක්, උණ්ඩ 60ක් සහ මැගසින් දෙකක් භාරගත් බවත්, එම මුර අට්ටාලයේ සිට අංක 8 සහ 9 වාට්ටු, වැසිකිළිය සහ බන්ධනාගාරයේ පිටුපස ප්‍රදේශයේ කොටස් නිරීක්ෂණය කළ හැකි බවත්, පෙ.ව. 10.00 පමණ සිට රැඳවියන් කෑගසමින් වාට්ටු වලින් පිටතට පැමිණ වහලවලට නැගී උළු ගලවා නිලධාරීන් සිටි ප්‍රදේශයට විසි කළ බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා සඳහන් කර ඇත. එම අවස්ථාවේ රැඳවියන් විසින් නිල ඇඳුමින් සිටි එක් බන්ධනාගාර නිලධාරියෙකු වටකරගෙන රැගෙන ගිය අතර, ඔහුට ගලකින් වැනි දෙයකින් පහරදෙන ආකාරය දුටු බවත්, එම නිලධාරියා කවුරුන්දැයි හඳුනාගත නොහැකි වූ බවත්, එක් රැඳවියෙකු සතුව රිපීටර් හෝ සීඉසෙඩ් වර්ගයේ ගිනි අවියක් වැනි ආයුධයක් තිබෙනු දුටු බවත්, පසුව එය සඟවා තිබූ ස්ථානය පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට දැනුම් දීමෙන් පසු එම ආයුධය පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් ලබාගත් බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

බන්ධනාගාර පොලිස් නිලධාරීන් මුගුරු සහ පලිහ රැගෙන බන්ධනාගාරය තුළට පැමිණි බවත්, රැඳවියන් ඉදිරියට පැමිණීම හේතුවෙන් එම නිලධාරීන් පසුපසට ගිය බවත්, එක් නිලධාරියෙකුට රැඳවියන් විසින් පහරදෙනු දුටු නමුත්, අනෙකුත් නිලධාරීන්ට පහරදීමක් හෝ බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවියන්ට පහරදීමක් හෝ නොදුටු බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා සඳහන් කර ඇත. තමාට ලබාදුන් ටී-56 ගිනි අවිය භාවිත කළ යුත්තේ රැඳවියන් තාප්පයෙන් පැනීමට හෝ තාප්පය කඩාගෙන පිටතට පැමිණීමට උත්සාහ කළ අවස්ථාවක අනතුරු ඇඟවීමෙන් පසුව හෝ ඉහළ නිලධාරියෙකුගේ නියෝගයක් යටතේ පමණක් බවත්, ආත්ම ආරක්ෂාව සඳහා ද භාවිත කළ හැකි බවත්, කෙසේ වෙතත්, එදින තමන්ගේ ගිනි අවියෙන් කිසිදු වෙඩි තැබීමක් සිදු නොකළ බව තහවුරු කළ හැකි බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තමා 2026.07.07 දින පෙ.ව. 9.00 දක්වා රාජකාරියේ නිරත වූ බවත්, එම කාලය තුළ වැසිකිළිය සහ 6 හා 7 වාට්ටුවල වහලවල නැඟ සිටි රැඳවියන් වහලයේ කොටස් කඩාගෙන බිමට වැටෙනු දුටු බවත්, තමා සිටි ස්ථානයට රැඳවියන් මියයාම හෝ රෝහල්ගත කළ අවස්ථා දැකගත නොහැකි වූ බවත්, කාන්තා අංශය නොපෙනුණද ඔවුන්ගේ කෑගැසීම් ඇසුණු බවත් මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, අනාගතයේ මෙවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා ඖෂධ ගබඩාව බන්ධනාගාරයෙන් පිටත පවත්වාගෙන යාම, අවශ්‍ය ඖෂධ ප්‍රමාණය පමණක් ඇතුළට ගෙන ඒම සඳහා ක්‍රමවේදයක් සකස්

කිරීම සහ බන්ධනාගාරයේ අධීක්ෂණය ශක්තිමත් කිරීම අවශ්‍ය බව ද මීගමුව බන්ධනාගාර නියාමක එස්.කේ. දිල්හාන් මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.10 මීගමුව බන්ධනාගාරයේ බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.30 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2021 සිට මීගමුව බන්ධනාගාරයේ සේවය කරන අතර, 2026.07.05 දින මැගසින් මුර අට්ටාලයේ ආරක්ෂක රාජකාරියේ නිරතව සිටි බවත්, 2026.07.05 දින දහවල් කාලයේදී බන්ධනාගාරය තුළින් කෑගැසීම් හා වෙඩි ශබ්ද ඇසුණු බවත්, රැඳවියන් වාට්ටුවලින් පිටතට පැමිණ පාලනයෙන් මිදී සිටිනු දුටු බවත්, ඇතැම් රැඳවියන් බෙහෙත් පෙති බෙදාගනිමින් හා දුම්කොළ වැනි ද්‍රව්‍ය භාවිත කරමින් සිටි බවත්, පසුව රැඳවියන් වාට්ටු වහලවල් මතට නැඟී සිටි බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින රැඳවියන් නැවත වාට්ටුවලට ඇතුළත් කිරීම සඳහා නිලධාරීන් කණ්ඩායමක් සමඟ බන්ධනාගාරය තුළට ගිය අවස්ථාවේදී, රැඳවියන් පිරිසක් එක් රැඳවියෙකුට පහරදෙනු දැක ඔහු බේරා ගැනීමට කටයුතු කළ බවත්, එම අවස්ථාවේදී රැඳවියන් බන්ධනාගාර නිලධාරීන්ටද පහරදීමට උත්සාහ කළ බැවින් බන්ධනාගාර පොලිස් නිලධාරීන් මැදිහත් වූ බවත්, රැඳවියන් විසින් ගල් හා පොලු භාවිත කර නිලධාරීන්ට පහරදුන් අතර, තමන්ද රැඳවියන්ගේ ග්‍රහණයට පත්වූ නමුත්, හඳුනන රැඳවියෙකුගේ මැදිහත්වීමෙන් ආරක්ෂා වී අවසානයේ බන්ධනාගාරයෙන් පිටතට පැමිණීමට හැකි වූ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතා විසින් ප්‍රකාශ කර ඇත.

මෙම සිදුවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ රැඳවියන් මත් වී සිටීම, අධික රැඳවියන් සංඛ්‍යාව සහ නිලධාරී හිඟය බවත්, බන්ධනාගාරයේ රැඳවියන්ට ප්‍රමාණවත් ඉඩකඩ හා පහසුකම් නොමැති බවත්, රාත්‍රී කාලයේදී සමස්ත බන්ධනාගාරය සඳහා නිලධාරීන් හතරදෙනෙකු පමණක් සිටීම ප්‍රමාණවත් නොවන බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතා විසින් සඳහන් කර ඇත. තවද, සේවයට බැඳීමේදී අවි පුහුණුව ලබා දුන්නද, ඉන්පසුව නැවත අවි පුහුණුව ලබාදී නොමැති බවද මීගමුව බන්ධනාගාර නියාමක ජී. එස්. එස්. ගමගේ මහතා විසින් ප්‍රකාශ කර ඇත.

### 8.11 මීගමුව බන්ධනාගාරයේ නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.07.31 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2026.07.05 දින පෙ.ව. 8.45ට පමණ මීගමුව බන්ධනාගාරයේ සේවයට වාර්තා කළ බවත්, එදින තමාට ආයුධ මුර රාජකාරිය පැවරී තිබූ බවත්, පළමුව මීගමුව රෝහලේ 04 වන වාට්ටුවේ රාජකාරිය භාරගත් බවත්, එදින දහවල් 12.45-1.00 අතර බන්ධනාගාර බස් රථ මගින් තුවාල ලැබූ සිරකරුවන් 15 දෙනෙකු පමණ රෝහලට රැගෙන ආ බවත්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ හිස්වල තුවාල තිබූ බවත්, පසුව තවත් සිරකරුවන් ප්‍රතිකාර හා ස්කෑන් සඳහා රෝහලට රැගෙන ආ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.05 දින රාත්‍රී 7.00ට පමණ බන්ධනාගාරය වසා දැමීම සඳහා නිලධාරීන් පිරිසක් සමඟ බන්ධනාගාරය තුළට ගිය අවස්ථාවේ බන්ධනාගාර රෝහල, විනය අංශය සහ ගබඩා ආදියට දැඩි හානි සිදුව තිබූ බව දුටු බවත්, රැඳවියන් 200-300ක් පමණ 11 වන වාට්ටුව ඉදිරිපිට නිදැල්ලේ සිටි බවත්, ඇතැමුන් මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බව පෙනී ගිය බවත්, සමහරු මත් ගතියෙන් වැටී සිටි අතර තවත් පිරිසක් ගී ගයමින් සිටි බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් ප්‍රකාශ කර ඇත. එසේම, සුරේෂ් නමැති රැඳවියාද මත් ගතියෙන් සිටි බවත්, ඔහුට බන්ධනාගාරය තුළට ගොස් වාට්ටුවක වසාගන්නා ලෙස පැවසූ විට තවත් පැය භාගයක් ඉල්ලා සිටි බවත්, පසුව සුරේෂ් විසින් නිසිත නමැති රැඳවියෙකු කැඳවා ඔහුට රහසිගතව යමක් පැවසූ බවත්, ඉන් අනතුරුව නිසිත ඇතුළු රැඳවියන් 15 දෙනෙකු පමණ 07 වන වාට්ටුවේ නානකාමරයේ ස්ලැබ් එක මතට නැගී සෙසු රැඳවියන් අමතා විරෝධතා ප්‍රකාශ කළ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව තමා බන්ධනාගාරයෙන් පිටතට පැමිණ මැගසින් මුරඅට්ටාලයේ රාජකාරිය භාරගෙන 2026.07.06 දින පෙ.ව. 6.00 දක්වා එහි සේවය කළ බවත්, පෙ.ව. 9.15ට පමණ නැවත බන්ධනාගාරය වසා දැමීමේ රාජකාරියට සහභාගී වූ අතර, එම අවස්ථාවේ තත්ත්වය සාමකාමීව පැවති බවත්, වාට්ටු වසාගෙන යන අතරතුර 03 වන වාට්ටුවේ අගුල කඩා තිබූ බැවින් එය නිසි පරිදි වසා දැමීමට නොහැකි වූ බවත්, එහි දොර තමා විසින් අල්ලාගෙන සිටියදී 05 හා 08 වාට්ටු අතර ප්‍රදේශයේ රැඳවියන් පිරිසක් ගැටුමකට සම්බන්ධ වී සිටිනු දුටු බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එහිදී තුවාල ලැබූ රැඳවියෙකු නිලධාරීන් විසින් ආරක්ෂිත ස්ථානයකට රැගෙන යමින් සිටියදී රැඳවියන් විශාල පිරිසක් ගල් හා පොලු භාවිත කර නිලධාරීන්ට සහ එම රැඳවියාට පහර දුන් බවත්, තමාට ද රැඳවියෙකු විසින් තල්ලු කර පහර දුන් බවත්, එම අවස්ථාවේ රැඳවියෙකු සතුව තිබූ පොල්ලක් තමා උදුරාගත් බවත්, පසුව තමා නිලධාරීන් සමඟ බන්ධනාගාරයෙන් පිටතට පැමිණීමට උත්සාහ කළ අතර, රැඳවියන් ගල්වලින් පහර දුන් බවත්, එහිදී තමාගේ මාලයද රැඳවියෙකු විසින් කඩාගත් බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් සඳහන් කර ඇත.

බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික නිලධාරීන් 25-30ක් පමණ පසුව එම ස්ථානයට පැමිණි බවත්, ඔවුන් රයට් ෂීල්ඩ්, බැටන් පොලු සහ හෙල්මට් සහිතව සිටි අතර, ගිනි අවි රැගෙන බන්ධනාගාරය

තුළට ඇතුළු වූ කිසිදු නිලධාරියෙකු තමා නොදුටු බවත්, එම අවස්ථාවේ මීගමුව බන්ධනාගාර නිලධාරීන් ද ගිනි අවි රැගෙන ඇතුළු නොවූ බවත්, හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් ඇතුළු වී විනාඩි 20–30කට පමණ පසු පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් 50–60ක් පමණ ගිනි අවි, බැටන් පොලු සහ හෙල්මට් සහිතව බන්ධනාගාරයට ඇතුළු වූ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් ඇතුළු වූ අවස්ථාවේ සිරකරුවන් පසුපසට ගිය නමුත්, ඇතැම් රැඳවියන් ගල් හා පොල් ගෙඩි වැනි දෑ වීසි කළ බවත්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් රැඳවියන්ට වෙඩි තබන ආකාරය තමන් සෘජුව නොදුටු නමුත්, වෙඩි හඬ ඇසුණු බවත්, පසුව බන්ධනාගාරය තුළට ගිය අවස්ථාවේ තුවාල ලැබූ නිලධාරීන් සහ රැඳවියන් කිහිපදෙනෙකු දුටු බවත්, ඔවුන් ගිලන් රථ සහ වෑන් රථ මගින් රෝහල්ගත කිරීමට යොමු කළ බවත් මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් සඳහන් කර ඇත.

තවද, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් රැඳවියන්ගෙන් සොයාගත් රිපීටර් වර්ගයේ ගිනි අවි දෙකක් තමා වෙත භාර දී ඇති අතර, එම ගිනි අවි ආමරියට භාරදීම සඳහා රියදුරු පුෂ්ප කුමාර මහතා වෙත භාර දුන් බවද මීගමුව බන්ධනාගාර නියාමක ජේ.ඩී. සම්පත් ද සිල්වා මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.12 මීගමුව බන්ධනාගාරයේ කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මියගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාර කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.03 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2026.07.03 දින රාත්‍රී සේවා මුරය අවසන් කර 2026.07.04 සහ 05 දින අසනීප නිවාඩු ලබාගෙන සිටි බවත්, 2026.07.06 දින දිවා සේවයට වාර්තා කළ බවත්, එදින පෙ.ව. 8.30ට පමණ කාන්තා අංශයේ රාජකාරි භාරගෙන රැඳවියන් ගණන් කර වාට්ටුවලට යොමු කළ බවත්, එදින තමා ඇතුළු නිලධාරිනියන් 6 දෙනෙකු රාජකාරියේ සිටි බවත්, එදින කාන්තා අංශයට ජේලර්වරයෙකු ලෙස ඉන්දික කුමාරතුංග මහතාද අනුයුක්ත කර තිබූ බවත් මීගමුව බන්ධනාගාර කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මිය විසින් ප්‍රකාශ කර ඇත.

එලෙස රැඳවියන් ගණන් කරන අවස්ථාවේ රැඳවියන් සාමකාමීව සිටි බැවින් ඔවුන්ට සාමාන්‍ය දෛනික කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබාදී තිබූ බවත්, එදින එනම්, 2026.07.06 දින පෙ.ව. 10.30-10.45 අතර මීගමුව බන්ධනාගාරයේ පිරිමි අංශය දෙසින් වෙඩි ශබ්ද වැනි ශබ්ද කිහිපයක් ඇසුණු බවත්, කාන්තා රැඳවියන් උඩු මහලට ගොස් පිරිමි අංශයේ කලබලයක් ඇති බව පවසමින් කෑගැසූ

බවත්, පසුව කාන්තා රැඳවියන් කිහිපදෙනෙකු වහලයට නැග "අපේ අයව මරණවා" යනුවෙන් කෑගසමින් වහලයේ උළු කැට ගලවා නිලධාරිනියන් වෙත පහර දීමට පටන් ගත් බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ජේලර්වරයා විසින් රැඳවියන්ට කලබල නොකරන ලෙස දැනුම් දුන්නද ඔවුන් එය නොසලකා හැරීම හේතුවෙන් නිලධාරිනියන්ගේ ආරක්ෂාව සඳහා නිලධාරිනියන් පිටතට රැගෙන ගොස් ගේට්ටුව වසා දැමූ බවත්, පසුව පිරිමි අංශයේ තත්ත්වය උග්‍ර වූ බැවින් ජේලර්වරයාගේ උපදෙස් මත තමා ඇතුළු කාන්තා අංශයේ නිලධාරිනියන් නේවාසිකාගාර වෙත ගිය බවත්, එදින ප.ව. 3.30ට පමණ නැවත කාන්තා අංශය අසලට පැමිණිය ද ඇතුළතට යාමට අවසර නොතිබුණු බැවින් පිටත රැඳී සිටි බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේ කාන්තා අංශයේ රැඳවියන් 166 දෙනෙකු සිටි බවත්, 2026.08.08 දින රැඳවියන් 33 දෙනෙකු වාරියපොල බන්ධනාගාරයටත්, 43 දෙනෙකු දුම්බර බන්ධනාගාරයටත් යොමු කළ බවත්, ඉතිරි රැඳවියන් 2026.08.10 දින මාරු කළ බවත්, මේ වන විට බන්ධනාගාරයේ සාමාන්‍ය රාජකාරි යථා තත්ත්වයට පත්ව ඇති බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් සඳහන් කර ඇත.

එසේම, මෙම සිදුවීම හේතුවෙන් කාන්තා අංශයේ ප්‍රධාන දොරටුවේ යකඩ කූරු හා ඉබ්බා, අමුත්තන් බැලීමට ඇති ස්ථානයේ වහලය, දැල් ආවරණ, ගබඩා කාමරය, විවේකාගාරය සහ ජේලර් කාමරය යන ගොඩනැගිලි වලට රැඳවියන් හානි කර තිබූ බවත්, කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා, ළදරු කිරිපිටි, ලිපි ලේඛන, මෙට්ට සහ අනෙකුත් භාණ්ඩ විනාශ කර හෝ රැගෙන ගොස් තිබූ බවත්, ඩිස්පැන්සරියේ ඖෂධ ගබඩා කඩා ඖෂධ රැගෙන ගොස් තිබූ බවත්, වහලයට සහ කාර්යාලයේ විදුලි උපකරණවලටද කාන්තා රැඳවියන් විසින් හානි සිදුකර තිබූ බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මිය විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.05 දින පිරිමි අංශයේ ඇති වූ කලබලය සහ රැඳවියන් දෙදෙනෙකු රෝහල්ගත කිරීම පිළිබඳව දැනගැනීමෙන් පසුව කාන්තා රැඳවියන් කලබල වී වහලයට නැඟ ඇති බව අනෙකුත් නිලධාරීන්ගෙන් දැනගත් බවත්, 2026.04.11 දින මීගමුව බන්ධනාගාරයේ සේවයට වාර්තා කළ පළමු අවස්ථාවේදී මීට පෙර රැඳවියන් වහලයට නැඟ තිබූ ස්ථාන ජේලර්වරිය විසින් පෙන්වා දී තිබූ බවත්, ප්‍රධාන ජේලර්වරියගේ ක්‍රියාමාර්ගයක් හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ බවට පළ වූ මාධ්‍ය වාර්තා පිළිබඳව තමන් නොදන්නා බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් සඳහන් කර ඇත.

නිලධාරිනියන්ගේ හිඟය හේතුවෙන් සාමාන්‍යයෙන් රාජකාරියට නිලධාරිනියන් 2-4 දෙනෙකු පමණක් සිටින අවස්ථා ඇති බවත්, ඇතැම් දිනවල 5-6 දෙනෙකු සිටින බවත්, කාන්තා ජේලර්වරිය නොමැති අවස්ථාවල පිරිමි ජේලර්වරයෙකු වැඩ බැලීමට පත් කරන බවත්, 2026.07.06 දින රැඳවියන් ගණන් කිරීමේදී කිසිදු විරෝධයක් හෝ පීඩනයක් නොතිබූ අතර, තත්ත්වය සාමකාමීව පැවති බැවින්

කාන්තා රැඳවියන් වාට්ටුවල වසා තැබීමට අවශ්‍යතාවයක් නොපෙනුණු බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින රැඳවියන් විසින් නිලධාරිනියන් වෙත එල්ල කරන ලද උළු කැට සහ ගල් ප්‍රහාර හේතුවෙන් නිලධාරිනියන්ට තුවාල සිදු නොවූ නමුත්, 2026.07.05 දින කාන්තා නිලධාරිනියන් දෙදෙනෙකුට ගල් ප්‍රහාර වලින් තුවාල වූ බව පසුව දැනගත් බවත්, රැඳවියන්ට ඩෙංගු ඇතුළු රෝග සඳහා නිතිපතා වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන බවත්, එම කාලයේ රැඳවියන් මෙන්ම නිලධාරීන්ද ඩෙංගු හා වෛරස් උණට ගොදුරු වූ බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මිය විසින් ප්‍රකාශ කර ඇත.

මෙවැනි සිදුවීම් වැළැක්වීම සඳහා නිලධාරීන්ගේ හිඟය අවම කිරීම, බන්ධනාගාරවල අධික රැඳවියන් සංඛ්‍යාව පාලනය කිරීම සහ රැඳවියන්ගේ රස පරීක්ෂක වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කිරීම අවශ්‍ය බවත්, ගැටුම්කාරී තත්ත්වයන් පාලනය කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ට නිරන්තර දැනුවත් කිරීම් සිදුකර ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදී නොමැති බවත් කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී කලුබෝගොඩ මහත්මිය විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.13 බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ) ප්‍රසාද් හේමන්ත කුමාර මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ) ප්‍රසාද් හේමන්ත කුමාර මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.03 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 දින ප.ව. 3.00ට පමණ මීගමුව බන්ධනාගාරයේ කලකෝලාහලයක් සිදුව ඇති බවට තමාට දැනුම් දීමෙන් පසු, අදාළ බන්ධනාගාර නිලධාරීන් සමඟ සම්බන්ධ වී මීගමුව බලා පිටත්වූ බවත්, ප.ව. 5.00ත් 5.15ත් අතර මීගමුව බන්ධනාගාරයට පැමිණෙන විට මහජනතාව රැස්ව සිටි අතර පොලිස් මාර්ග බාධක යොදා තිබූ බවත්, කාන්තා රැඳවියන් වහල මතට නැග උළු ගලවා නිලධාරීන්ට පහරදීමට උත්සාහ කරමින් සිටි අතර, පිරිමි රැඳවියන්ද කලහකාරී ලෙස හැසිරෙමින් සිටි බවත්, බන්ධනාගාර රෝහල, අධිකාරි කාර්යාලය සහ එස්.එම්. ශාඛාවටද හානි සිදුව තිබූ බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් සඳහන් කර ඇත.

රැඳවියන් සමඟ පැය භාගයකට ආසන්න කාලයක් සාකච්ඡා කර ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳව අවධානය යොමු කරමින් වාට්ටුවල අධික උෂ්ණත්වය හේතුවෙන් එක්සෝස්ට් විදුලි පංකා සවි කිරීම, ආහාර සම්බන්ධ ගැටලු සොයා බැලීම, ඇතැම් නිලධාරීන් මාරු කිරීම සහ පහරදීම්වලට සම්බන්ධ රැඳවියන් වහාම වෙනත් බන්ධනාගාරවලට මාරු නොකිරීම සඳහා උපදෙස් ලබා දෙන ලද බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සඳහන් කර ඇත. ප.ව. 8.00–8.30 පමණ වන විට සියලු අංශවලට රාත්‍රී ආහාර ලබා දී තිබූ බවත්, 2026.07.06 අලුයම 2.30 වන තෙක් මීගමුව බන්ධනාගාර පරිශ්‍රයේ රැඳී සිටි

අතර, පසුව කුරුණෑගල බලා ගොස් අලුයම 4.20ට දුම්රියෙන් කොළඹට පිටත්ව පෙ.ව. 7.00ට පමණ පැමිණ පෙ.ව. 8.00ට බන්ධනාගාර මූලස්ථානයේ තම කාර්යාලයට ගිය බවත්, එදින පෙ.ව. 10.00ට ආසන්නව මීගමුව බන්ධනාගාරයේ තත්ත්වය නැවත උග්‍ර වී ඇති බව දැනගත් අතර නිලධාරියෙකුට බරපතළ ලෙස පහරදී ඇති බවටද දැනුම් දුන් බවත්, අනෙකුත් බන්ධනාගාරවලින් නිලධාරීන් සහ බස් රථ කඩිනමින් මීගමුව බන්ධනාගාරය වෙත ගෙන්වීමට කටයුතු කළ බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.06 වන දින පෙ.ව. 12.00ට ආසන්නව තමා ද මීගමුව බන්ධනාගාරයට පැමිණි විට තුවාලකරුවන් රෝහල්ගත කරමින් සිටි අතර මරණද සිදුව තිබූ බවත්, බන්ධනාගාරය පවත්වාගෙන යාම අපහසු බැවින් රැඳවියන් කණ්ඩායම් වශයෙන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යවන ලද බවත්, තුවාල ලැබූ රැඳවියන් හා නිලධාරීන් රෝහල්ගත කර ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, මෙම සිදුවීම් වලින් නිලධාරීන් 8 දෙනෙකු එදිනද, තවත් 2 දෙනෙකු පසුවද මියගොස් ඇති අතර රැඳවියන් 22 දෙනෙකු මියගොස් ඇති බවත්, නිලධාරීන් 21 දෙනෙකු සහ රැඳවියන් 106 දෙනෙකු තුවාල ලබා ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වරයා විසින් සඳහන් කර ඇත.

මෙහිදී බන්ධනාගාර තදබදය, පහසුකම් හිඟය සහ නිලධාරී පුරප්පාඩු ප්‍රධාන ගැටලු ලෙස හඳුනාගෙන ඇති බවත්, අධිකරණ කටයුතු හා රස පරීක්ෂණ වාර්තා කඩිනම් කිරීම, නිලධාරීන් බඳවා ගැනීම සහ පහසුකම් වැඩිදියුණු කිරීම අවශ්‍ය බවත්, මීගමුව බන්ධනාගාරයෙන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කළ රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස අදාළ බන්ධනාගාර අධිකාරිවරුන්ට දුරකථන පණිවිඩ සහ ලිඛිතව උපදෙස් ලබා දී ඇති අතර, පසුව වාර්තා වූ පහරදීම් පිළිබඳ විමර්ශනය සඳහා නිලධාරීන් පත් කර ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.14 විශේෂ කාර්ය බලකා සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකා සහකාර පොලිස් අධිකාරී නලින් පෙරේරා මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.07 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.06 දින පෙ.ව. 6.00–6.15 අතර නියෝජ්‍ය අණදෙන නිලධාරී (මෙහෙයුම්) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොමේෂ් ලියනගේ මහතා විසින් තමා වෙත දුරකථන ඇමතුමක් ලබා දී මීගමුව බන්ධනාගාරයේ රැඳී සිටින විශේෂ කාර්ය බලකා කණ්ඩායම භාරව සිටි සහකාර පොලිස් අධිකාරී ජයවර්ධන මහතා වෙනත් රාජකාරියකට පිටත්ව යන බැවින්, එම කණ්ඩායම අධීක්ෂණය කිරීම සඳහා පෙ.ව. 9.30ට පමණ මීගමුව බන්ධනාගාරය වෙත පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුම් දුන් බවත්,

ඒ අනුව පෙ.ව. 8.30ට පමණ විශේෂ කාර්ය බලකා වාහනයකින් සහායක නිලධාරියෙකු සමඟ මීගමුව බන්ධනාගාරය බලා පිටත්ව ගිය බවත්, පෙ.ව. 9.30ට පමණ සහකාර පොලිස් අධිකාරී ජයවර්ධන මහතා හමුවී රාජකාරි සඳහා උපදෙස් ලබාගත් බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේ මීගමුව බන්ධනාගාරය තුළ සාමකාමී තත්ත්වයක් පැවති බවත්, බන්ධනාගාරයෙන් පිටත විශේෂ කාර්ය බලකා නිලධාරීන් 03 දෙනා බැගින් ස්ථාන 14ක බන්ධනාගාරයෙන් පිටත ආරක්ෂාව සඳහා යොදවා තිබූ බවත්, කැරලි මර්ධන හා විශේෂ අවි හා උපක්‍රමික කණ්ඩායම් ද බන්ධනාගාරයෙන් පිටත ස්ථානගත කර තිබූ බවත්, පසුව පෙ.ව. 9.45-9.50 අතර බන්ධනාගාරය දෙසින් වෙඩි ශබ්ද ඇසීමත් සමඟ නොසන්සුන් තත්ත්වයක් ඇති වී ඇති බව අවබෝධ කරගෙන තම කණ්ඩායම් සමඟ බන්ධනාගාරයේ ප්‍රධාන ගේට්ටුව වෙත ගිය බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එලෙස ඇති වූ ගැටුම් හේතුවෙන් බරපතළ තුවාල ලැබූ බන්ධනාගාර නිලධාරීන් වාහනවලින් රෝහල් වෙත රැගෙන යන ආකාරය  තමා දුටු බවත්, මීගමුව කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතා ද එම ස්ථානයට පැමිණ සිටි බවත්, බන්ධනාගාර කොමසාරිස් ගජනායක මහතා විසින් රැඳවියන් බන්ධනාගාරයේ පාලනය අත්පත් කරගෙන ගේට්ටුව කඩාගෙන පිටතට පැමිණීමට උත්සාහ කරන බවත්, එම තත්ත්වය පාලනය කිරීමට සහ තුවාල ලැබූ නිලධාරීන් බේරා ගැනීමට සහාය අවශ්‍ය බවත් දැනුම් දී තිබූ බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

ඒ අනුව මීගමුව කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී  බිමල් පෙරේරා මහතා විසින් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ සහය අවශ්‍ය බව දැනුම් දුන් බවත්, තම නියෝග මත විශේෂ අවි හා උපක්‍රම කණ්ඩායම විසින් කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කළ බවත්, තමාගේ මතකය අනුව කඳුළු ගෑස් උණ්ඩ 04-06ක් පමණ භාවිත කර තිබූ බවත්, එම කණ්ඩායම භාරව පොලිස් පරීක්ෂක රසික මහතා කටයුතු කළ බවත්, ඉන් අනතුරුව බන්ධනාගාරය තුළින් ඇසුණු වෙඩි හඬ සහ ගේට්ටුවට පහරදීම නතර වූ බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත. පසුව විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ඇතුළු වූ බවත්, කාර්යාල, සිරමැදිරි, බන්ධනාගාර අධිකාරි කාර්යාලය, ප්‍රධාන ජේලර් කාර්යාලය සහ බන්ධනාගාර රෝහල ඇතුළු ස්ථාන රැසකට බරපතළ හානි සිදුව තිබූ බව නිරීක්ෂණය වූ බවත්, බන්ධනාගාර නිලධාරීන් හා රැඳවියන් කිහිපදෙනෙකු බරපතළ තුවාල ලබා සිටි බවත්, රැඳවියන් වාට්ටු තුළට ඇතුළු වූ පසු ඒවා නැවත අගුලු දමා, එක් එක් වාට්ටුව ආසන්නයේ බන්ධනාගාර, පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් ආරක්ෂාව සඳහා ස්ථානගත කළ බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

පසුව කලහකාරී රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමට පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් සහාය වූ බවත්, රාත්‍රී 11.45 පමණ වන තෙක් කණ්ඩායම් රාජකාරියේ රැඳී සිට ඇති බවත්,

තමා සහකාර පොලිස් අධිකාරී කුලතුංග මහතා සමඟ 2026.07.07 දින පෙ.ව. 2.00 පමණ වන තෙක් එහි රැඳී සිට පසුව කඳවුර වෙත ගිය බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, විශේෂ කාර්ය බලකායේ කිසිදු නිලධාරියෙකු විසින් ගිනි අවි භාවිත කර වෙඩි තැබීමක් සිදු නොකළ බවත්, තමන් විසින් ද එවැනි වෙඩි තැබීමකට කිසිදු නියෝගයක් ලබා නොදුන් බවත්, කඳුළු ගෑස් ප්‍රහාරය පමණක් තම නියෝග මත සිදුකර ඇති බවත් සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත. තවද,මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා බන්ධනාගාර තදබදය අඩු කිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, මත්ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට ඇතුළුවීම වැළැක්වීම, බන්ධනාගාර රෝහල, පරිපාලන පරිශ්‍රය සහ ආයුධ ගබඩාව වැනි සංවේදී ස්ථාන ප්‍රධාන බන්ධනාගාර පරිශ්‍රයෙන් පිටත ස්ථානගත කිරීම, ප්‍රමාණවත් බන්ධනාගාර නිලධාරීන් යෙදවීම සහ ආරක්ෂක කුටි බන්ධනාගාරයෙන් පිටත ස්ථානගත කිරීම යන යෝජනා ඉදිරිපත් කළ හැකි බව ද සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.15 වැලිකඩ බන්ධනාගාර අධිකාරී සමන්ත මහනාම මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් වැලිකඩ බන්ධනාගාර අධිකාරී සමන්ත මහනාම මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.19 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයා ලෙස කටයුතු කරන බවත්, 2026.07.05 හා 06 දින මීගමුව බන්ධනාගාරයේ සිදුවීමෙන් අනතුරුව 2026.07.06 හා 07 දිනවල මීගමුව බන්ධනාගාරයෙන් අවස්ථා දෙකකදී රැඳවියන් 50 බැගින් වැලිකඩ බන්ධනාගාරයට මාරු කර එවූ බවත්, ඔවුන් ලියාපදිංචි කර වෛද්‍ය පරීක්ෂණයට යොමු කර වයිඕ (YO) වාට්ටුවට ඇතුළත් කිරීමට කටයුතු කළ බවත්, මීගමුව හා කොළඹ ජාතික රෝහල්වල ප්‍රතිකාර ලබා නිදහස් කළ රැඳවියන් ද අවස්ථා කිහිපයකදී වැලිකඩ බන්ධනාගාර රෝහලට යොමු කර වැඩිදුර ප්‍රතිකාර ලබා දී ඇති අතර, එවැනි රැඳවියන් 160කට ආසන්න සංඛ්‍යාවක් සිටි බවත් වැලිකඩ බන්ධනාගාර අධිකාරි සමන්ත මහානාම මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, මීගමුව බන්ධනාගාරයෙන් වැලිකඩ බන්ධනාගාරයට මාරු කළ රැඳවියෙකු පහරදීමකින් මියගිය බවට එල්ල වූ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්,2026.07.07 දින ප.ව. 9.55ට අයි (I) වාට්ටුවේ පිටුපස ප්‍රදේශයේ ගෙල වැළලා ගැනීමෙන් රැඳවියෙකු මියගිය බවත්, එසේ මිය ගියේ සිර අංක 52690 දරන රත්නවේලු අවිෂ්ක ගයාන් නමැති රැඳවියා බවත්, ඔහු 2026.07.01 දින විනය හේතු මත මීගමුව බන්ධනාගාරයෙන් වැලිකඩ බන්ධනාගාරයට මාරු කර තිබූ බවත්, එකී රැඳවියා 2026.07.05 සහ 06 දිනවල මීගමුව බන්ධනාගාරයේ සිදු වූ සිදුවීමට පෙර වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කරන ලද රැඳවියෙකු වන බවත්, එලෙස ගෙල වැලලාගෙන මිය යන අවස්ථාවේ අයි (I)

වාට්ටුවේ රැඳවියන් 50–100 අතර සිටි බවත්, රාත්‍රී කාලයේ වාට්ටු සඳහා වෙනම නිලධාරීන් යෙදවීමක් සිදු නොකරන බවත් වැලිකඩ බන්ධනාගාර අධිකාරි සමන්ත මහානාම මහතා විසින් සඳහන් කර ඇත.

මියගිය රැඳවියාට පහර දී පසුව ගෙල වැළලා ඇති බවට සමාජ මාධ්‍ය ඔස්සේ පැතිරුණු චෝදනා සම්බන්ධයෙන් වීඩියෝ එකතු කර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත්, පොලිස් පරීක්ෂණයක් ද ඉල්ලා ඇති බවත්, මරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සහ පශ්චාත් මරණ පරීක්ෂණයක් ද සිදුකර ඇති බවත් වැලිකඩ බන්ධනාගාර අධිකාරි සමන්ත මහානාම මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, මීගමුව බන්ධනාගාරයෙන් වැලිකඩ බන්ධනාගාරයට මාරු කළ රැඳවියන්ට වැලිකඩ බන්ධනාගාරයේ නිලධාරීන් පහර දුන් බවට කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බැවින් එම චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, සිරකරුවන් සුරැකීමේ සංවිධානය අසත්‍ය චෝදනා ඉදිරිපත් කරන බවත්, ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට පොලිස්පතිවරයා ඇතුළු අදාළ අංශ දැනුවත් කර ඇති බවත් වැලිකඩ බන්ධනාගාර අධිකාරි සමන්ත මහානාම මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.16 මීගමුව බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ක්ලීටස් ඔස්කාර් මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ක්ලීටස් ඔස්කාර් මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.19 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 දින පෙ.ව. 7.00ට තමා අවි අංශය භාර ජේලර්වරයා ලෙස රාජකාරි භාරගෙන නිලධාරීන් අවි අට්ටාල වෙත යෙදවූ බවත්, අවි අට්ටාල 5ක් තිබුණද නිලධාරීන් හිඟය හේතුවෙන් 4ක් පමණක් ක්‍රියාත්මක වන බවත්, පෙ.ව. 8.30ට ඒවා පරීක්ෂා කළ බවත්, ප.ව. 12.15ට පමණ දීමනා වවුචර් පරීක්ෂා කරමින් සිටියදී බන්ධනාගාර නියාමක ඒ.එල්.එම්. අධිකාරී මහතා සමඟ කාන්තා අංශයට ගොස් කාන්තා රැඳවියන් 19 දෙනෙකු අමුත්තන් පෙන්වීමේ ශාලාවට රැගෙනවිත් විනාඩි 15ක කාලයක් ඥාතීන් හමුවීමට අවස්ථාව ලබා දුන් බවත්, ඉන් අනතුරුව තවත් කාන්තා රැඳවියන් 21 දෙනෙකු රැගෙන ආ බවත්, තමා සහ කාන්තා නිලධාරිනියක් අමුත්තන් පෙන්වීමේ කටයුතු අධීක්ෂණය කළ බවත්, එම අවස්ථාවේදී “මිහිඳු” නම් රැඳවියා සිරුර පුරා ලේ තැවරී තිබියදී නියාමක අධිකාරී මහතා විසින් පිටතට රැගෙන එනු දුටු බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් සඳහන් කර ඇත.

එම රැඳවියාට අනෙකුත් රැඳවියන් විසින් පහරදී ඇති බව නියාමක අධිකාරී මහතා ප්‍රකාශ කළ බවත්, විනය අංශයට සහාය වන රැඳවියෙකු විසින් කාමර පාටිලාට පහර දෙන බවත්, දෙදෙනෙකු මියගොස් ඇති බවත් දැනුම් දුන් බවත්, ඒ අනුව වහාම අමුත්තන් පෙන්වීමේ ශාලාවේ සිටි පිරිමි හා කාන්තා රැඳවියන් අදාළ අංශ වෙත යවා තමා යකඩ ගේට්ටුව වෙත ගිය බවත්, එහිදී පරිපාලනයට සහාය වන රැඳවියන්ට, අනෙක් රැඳවියන් විසින් පොලු හා ගල්වලින් පහර දෙන ආකාරය දුටු බවත්, අංක 1

වාට්ටුවේ සුරේෂ් නම් රැඳවියා විසින් පහරදීම් මෙහෙයවූ බවට තොරතුරු ලැබී ඇති බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, 2026.07.05 වන දින ප.ව. 1.30-1.45 අතර විශාල පිරිසක් යකඩ ගේට්ටුවට පහරදීම හේතුවෙන් ප්‍රධාන ගේට්ටුව අසල බැරියර් රාජකාරියේ සිටි නියාමක පී.පී.එන්. ජයසිංහ මහතා අහසට වෙඩි තබා රැඳවියන්ට යටත් වන ලෙස අණ කළ බවත්, පසුව රැඳවියන් අතර ඇති වූ ගැටුම් වලින් තුවාල ලැබූ රැඳවියන් හා නිලධාරීන් 25-30 දෙනෙකු පමණ ගිලන් රථ හා බන්ධනාගාර බස් රථ මගින් මීගමුව රෝහලට යැවූ බව තමා දුටු බවත්, ප.ව. 2.30-3.00 පමණ වන තෙක් එම කටයුතු සිදු වූ බවත්, ප.ව. 3.30ට පමණ බන්ධනාගාර මූලස්ථානයේ උසස් නිලධාරීන් පැමිණි බවත්, ප.ව. 4.30ට පමණ රැඳවියන් සමඟ එම නිලධාරීන් සාකච්ඡාවක් පැවැත්වූ බවත්, එහිදී ජංගම දුරකථන හා විෂ මත්ද්‍රව්‍ය භාවිතයට අවසර දීම ඇතුළු විවිධ ඉල්ලීම් ඉදිරිපත් කරමින් රැඳවියන් විරෝධය පළ කළ බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් සඳහන් කර ඇත.

එදින සවස 5.30- 6.00 අතර කාර්යාල හා බන්ධනාගාර රෝහල රැඳවියන් විසින් විනාශ කර ඇති බවත්, පරිගණක, මේස හා පුටු කඩා දමා ඇති බව දැනගන්නට ලැබුණු බවත්, එම අවස්ථාවේදී වැඩබලන ප්‍රධාන ජේලර් ඒ.ඩී.සී. පෙරේරා මහතාගේ උපදෙස් මත අවි ගබඩාවේ තිබූ අවි ඉවත් කර නිලධාරී විවේකාගාරයට තමා විසින් රැගෙන ගිය බවත්, අවි ගබඩාවේ ටී-58 තුවක්කු 16ක්, මිලිමීටර් 9 පිස්තෝල 6ක්, මිලිමීටර් 3.8 පිස්තෝලයක්, රිපීටර් ගිනි අවියක්, රබර් උණ්ඩ අවි 2ක් සහ උණ්ඩ 955ක් තිබූ බවත්, තවත් ටී-56 ගිනි අවි 4ක් අවි අට්ටාලවලට නිකුත් කර තිබූ බවත්, ටී-56 ගිනි අවියකට මැගසින් දෙකකට උණ්ඩ 60ක් සහ ටී-58 ගිනි අවියකට උණ්ඩ 28 බැගින් නිකුත් කර තිබූ බවත්, 2026.07.05 දින අවි අට්ටාලවලින් වෙඩි තැබීමක් සිදු නොවූ නමුත්, 2026.07.06 දින වෙඩි තැබීම් සිදු වූ බව පසුව දැනගත් බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින පෙ.ව. 8.30ට අවි ගබඩාවේ යතුරු ජේලර් ජේ.පී.කේ. ලක්සිරි මහතාට භාරදුන් බවත්, පෙ.ව. 10.30ට පමණ නැවතත් රැඳවියන් කලහකාරී ලෙස හැසිරෙන ශබ්ද ඇසී ගේට්ටුව වෙත ගිය බවත්, එහිදී පොලිස්, විශේෂ කාර්ය බලකා සහ බන්ධනාගාර නිලධාරීන් රැඳවියන් පාලනය කිරීමට කටයුතු කරමින් සිටි බවත්, අහසට වෙඩි තැබූ බව ඇසුණද වෙඩි තැබුවේ කවුරුන්දැයි තමන් නොදුටු බවත්, එදින අවි ගබඩාව ඇතුළු සියලු කාමර විනාශ කර තිබූ බවත්, දෛනික භාවිතයට ලබාදී තිබූ අවි පෙරදිනම තමා විසින් ඉවත් කර ආරක්ෂිත ස්ථානයකට රැගෙන ගොස් තිබූ බැවින් ඒවා එම අවි ගබඩාවේ නොතිබූ බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් ප්‍රකාශ කර ඇත.

කෙසේවෙතත් අවි ගබඩාවේ පැරණි පෙට්ටි හා කබඩ්වල තිබූ පරණ අවි රැඳවියන් විසින් ලබාගෙන ඇති බව පසුව දැනගත් නමුත්, එම අවිවල උණ්ඩ නොතිබූ බවත්, පසුව එම අවි නැවත ලැබී ඇති බවත්, බන්ධනාගාර අධිකාරීවරයාගේ උපදෙස් මත සිදුකළ අවි පරීක්ෂාවේදී අවි සංඛ්‍යාව නිවැරදි බව තහවුරු වූ බවත් ජේලර් ඔස්කාර් මහතා සඳහන් කර ඇත. අවසානයේදී අවි ගබඩාව පිහිටි ස්ථානය ප්‍රමාණවත් ආරක්ෂාවකින් තොර බැවින් වඩාත් ආරක්ෂිත ස්ථානයකට මාරු කළ යුතු බවත්,

ප්‍රමාණවත් නිලධාරීන් සිටියේ නම් සිද්ධිය පාලනය කිරීමට හැකියාව තිබූ බවත් ජේලර් ඔස්කාර් මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.17 මීගමුව කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨපොලිස් අධිකාරි බිමල් පෙරේරා මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් මීගමුව කොට්ඨාශ භාරජ්‍යෙෂ්ඨපොලිස් අධිකාරි බිමල් පෙරේරා මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.08.25 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 දින ප.ව.2.00ට පමණ මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් අතර නොසන්සුන්තාවක් ඇතිවී ඇති බවට මීගමුව මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාගෙන් ලද දැනුම්දීමෙන් පසු කොට්ඨාශයේ පොලිස් ස්ථාන 12කින් නිලධාරීන් 8 බැගින්ද, අපරාධ හා විශේෂ විමර්ශන අංශවලින්ද නිලධාරීන් කැඳවූ බවත්, මහජන සාමය කළමනාකරණ කොට්ඨාශයේ කැරලි මර්දන කණ්ඩායමක් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන්ද ගෙන්වා ගත් බවත්, ප.ව.3.30ට පමණ බන්ධනාගාරයට පැමිණි බවත්, එවිට මීගමුව බන්ධනාගාරයේ වාට්ටු 18ම කඩා රැඳවියන් සියලු දෙනාම වගේ පිටත සිටි බව දුටු බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බිමල් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.05 දින දහවල් ආහාර බෙදාදීමේදී බන්ධනාගාර නිලධාරීන්ට සහය වූ රැඳවියන් 34 දෙනෙකුට අනෙක් රැඳවියන් විසින් පහරදී තිබූ බවත්, බරපතළ තුවාල ලැබූ රැඳවියන් දෙදෙනෙකු පසුව මියගිය බවත්, බන්ධනාගාර රෝහලෙන් ලබාගත් ඖෂධ සහ එස්.එම්. කාමරයේ තබා තිබූ මත්ද්‍රව්‍ය රැඳවියන් විසින් ලබාගෙන ඇති බවට තොරතුරු ලැබුණු බවත්, රැඳවියන් ඉතා ආවේගශීලීව හා අමානුෂික ලෙස හැසිරුණු බවත්, බන්ධනාගාරය වටා මාර්ග බාධක, පොලිස්, කැරලි මර්දන හා පොලිස් විශේෂ කාර්ය බලකා කණ්ඩායම් යොදවා ආරක්ෂාව තහවුරු කළ බවත්, ප.ව.5.30ට පමණ වහල මත සිටි කාන්තා රැඳවියන් 20ක් සහ පිරිමි රැඳවියන් 30ක් පමණ නිරීක්ෂණය වූ බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බිමල් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

රාත්‍රී 8.00ට පමණ මීගමුව රෝහලට ගොස් තුවාල ලැබූ රැඳවියන් 34 දෙනෙකු ප්‍රතිකාර ලබමින් සිටිනු නිරීක්ෂණය කළ බවත්, ඔවුන්ගෙන් ලබාගත් තොරතුරු අනුව කටුවැල්ලේගම සුරේෂ්, දළුපොත රොකී ඇතුළු පිරිසක් රැඳවියන්ට පහරදී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කිරීමට අපරාධ විමර්ශන නිලධාරීන් යෙදවූ බවත්, රාත්‍රී 11.30ට පමණ නැවත බන්ධනාගාරය අසලට පැමිණි අතර 2026.07.06 වන දින පෙ.ව.12.45 පමණ වහල මත සිටි රැඳවියන් පහළට බැස ඇති බවත්, පෙ.ව.1.00-1.15 අතර රැඳවියන් 150-200ක් පමණ තැනින් තැන ගමන් කරමින් සිටි බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බිමල් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින තමා තෙල්වත්තේ පිහිටි කාර්යාලයේ සිටියදී එදින පෙ.ව.10.04ට කොට්ඨාශ අපරාධ අංශයේ උ.පො.ප. රසික නිලධාරියා විසින් මීගමුව බන්ධනාගාරය තුළින් වෙඩි ශබ්ද ඇසෙන බවට

තමාට දැනුම් දුන් බවත්, ඒ අනුව තමා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේ ප්‍රධාන දොරටුවේ අවි සහිතව රාජකාරියේ යෙදී සිටි පො.සැ.51769 වෙත්තසිංහ ටී56 අවියක් සහ උණ්ඩ 30ක් ද, පො.සැ.74954 ධනුෂ්ක, පො.කො.77997 කොතලාවල පිස්තෝලයක් සහ උණ්ඩ 10ක් ද රැගෙන පෙ.ව.10.12ට පමණ මීගමුව බන්ධනාගාර ගේට්ටුව වෙත පැමිණි බවත්, එහිදී රැඳවියන් බන්ධනාගාරයේ පාලනය අත්පත් කරගෙන තිබූ බවත්, ලී දොරට බර යකඩ හා ආයුධවලින් පහර දෙමින් සිටි බවත්, රැඳවියන් උළු හා ගල් කැබලිවලින් පිටත සිටි නිලධාරීන්ට පහරදුන් බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

පසුව බන්ධනාගාර නිලධාරියෙකු විසින් ලී දොරේ කවුළුව දෙසට හා එතුළින් පහළට වෙඩි කිහිපයක් තැබූ බවත්, අනතුරුව පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සමඟ බන්ධනාගාරය තුළට ඇතුළු වූ බවත්, ඇතුළත බන්ධනාගාර නිලධාරීන් කිහිපදෙනෙකු තුවාල ලබා වැටී සිටි බවත්, රැඳවියන් අත ටී56 අවියක් සහ රිපීටර් අවියක් තිබෙනු දුටු නමුත් එම රැඳවියන් අවි භාවිත නොකර පලාගිය බවත්, සියලු රැඳවියන් වාට්ටුවලට යොමු කර වාට්ටු අගුළු දැමූ බවත්, පොලිස් විශේෂ කාර්ය බලකා හා කැරලි මර්දන නිලධාරීන් යොදවා තත්ත්වය පාලනය කළ බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතා විසින් ප්‍රකාශ කර ඇත.

පසුව රැඳවියන් 731 දෙනෙකු වෙනත් බන්ධනාගාර වෙත යොමු කළ බවත්, කටුවැල්ලේගම සුරේෂ් ඇතුළු හඳුනාගත් රැඳවියන් 13 දෙනෙකු බූස්ස බන්ධනාගාරයට යැවූ බවත්, බස් රථ සඳහා පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ ආරක්ෂාව ලබාදුන් බවත්, මෙම සිද්ධිය සම්බන්ධ සියලු විමර්ශන 2026.07.08 දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බවත්, පොලිස් නිලධාරීන් විසින් වෙඩි තැබීමක් සිදු නොකළ බවත්, 2026.07.06 දින පොලිස්, පොලිස් විශේෂ කාර්ය බලකා හා කැරලි මර්දන නිලධාරීන්ට බන්ධනාගාරයට ඇතුළු වීමට නියෝග කළ ප්‍රධාන නිලධාරියා තමා බවත්, නමුත් වෙඩි තැබීමට නියෝග නොකළ බවත්, බන්ධනාගාර ආඥා පනතේ 77 වගන්තිය හා බන්ධනාගාර කොමසාරිස්වරයාගේ අවසරය මත නිලධාරීන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා තත්ත්වය පාලනය කිරීමට නායකත්වය දුන් බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතා විසින් සඳහන් කර ඇත.

තවද, මීගමුව බන්ධනාගාරයේ වාට්ටු 18 එකිනෙකින් ප්‍රමාණවත් ලෙස වෙන්කර නොමැති බැවින් එක් වාට්ටුවක් කැඩී ගියහොත් සියලු රැඳවියන්ට පිටතට පැමිණිය හැකි බවත්, බන්ධනාගාර නිලධාරීන්ගේ හිඟය හා ධාරිතාව ඉක්මවා රැඳවියන් රඳවා තැබීම ගැටලුකාරී බවත්, වාට්ටු වෙන්කර ආරක්ෂාව වැඩිදියුණු කළ යුතු බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.18 අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරී පුෂ්පකුමාර හෙන්නායක මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරී පුෂ්පකුමාර හෙන්නායක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.09.02 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

2026.07.05 සහ 06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිද්ධියෙන් අනතුරුව අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට රැඳවියන් යොමු කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාර අධිකාරී එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා ප්‍රකාශ කර සිටියේ, 2026.07.06 දින රාත්‍රී 11.00ට පමණ මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට රැඳවියන් රැගෙන ආ අතර, 2026.07.07 දින අලුයම 1.10ට පළමු වරට රැඳවියන් 150ක්ද, එදින රාත්‍රී 10.20ට තවත් රැඳවියන් 120ක්ද අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට ඇතුළත් කළ බවත්, 2026.07.10 දින කාන්තා රැඳවියන් 20ක්ද ඇතුළත් කර තිබූ බවත්, මීගමුව බන්ධනාගාරයෙන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට ඇතුළත් කරන ලද සමස්ත රැඳවියන් සංඛ්‍යාව 290ක් බවත් ය.

2026.07.06 දින මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට පැමිණි රැඳවියන් සෝදිසි කර භාරගැනීමේ රාජකාරියේ නියාමක එම්.ජී.ටී. ජීවන්, නියාමක බී.ඩී.එස්. මහේන්ද්‍ර, නියාමක එම්.එම්. සමන්ත, නියාමක ඒ.එම්.ජී.වී. බණ්ඩාර සහ නියාමක ජී.අයි.කේ. ප්‍රනාන්දු යන නිලධාරීන් සේවයේ යෙදී සිටි බවත්, 2026.07.07 දින ඒ.ආර්.එස්.ඊ. අලහකෝන්, කේ.ටී.එල්. කාරියවසම්, කේ.එච්.එස්. ප්‍රසාද්, කේ.එම්. චානක, නියාමක ආර්.ජේ. ලක්මාල්, නියාමක ජීවන්, නියාමක ඒ. ඉන්ද්‍රසේන සහ නියාමක එස්.ඒ.ඒ. තරංග යන නිලධාරීන් රාජකාරියේ සිටි බවත්, ජේලර්වරුන් දෙදෙනා බැගින් අධීක්ෂණයට යොදවා තිබූ බවත් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරී එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා විසින් සඳහන් කර ඇත.

මීගමුව බන්ධනාගාරයේ සිට පැමිණි රැඳවියන් අතරින් සැක අංක 4008 දරණ උඩවලහේවගේ සඳුන් චතුරංග යන රැඳවියා 2026.07.07 දින රාත්‍රී 10.20ට පමණ භාරගෙන, අසනීප තත්ත්වයක් හේතුවෙන් අගුණුකොළපැලැස්ස රෝහලට යොමු කර තිබූ බවත්, රාත්‍රී 10.50ට පමණ එකී රැඳවියා මියගිය බව දැනුම් දී තිබූ බවත්, එකී මරණයට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණයේදී විවෘත තීන්දුවක් ලබාදී ඇති බවත් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරී එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා විසින් සඳහන් කර ඇත.

රැඳවියන් භාරගැනීමේදී අධීක්ෂණ කටයුතු සිදු කළ ජේලර්වරයා විසින් සටහන් තබා ඇති බවත්, තුවාල සහිත රැඳවියන් ආයතන භාර වෛද්‍ය නිලධාරී චානක විජේතුංග මහතා වෙත ද, අධිකරණ නියෝග මත තංගල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ද යොමු කර ඇති අතර, බෙල්ට්, පොලු හෝ වයර්වලින් පහරදීමක් පිළිබඳ පැමිණිල්ලක් තමා වෙත වාර්තා නොවූ බවත්

අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරි එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා විසින් සඳහන් කර ඇත.

මීගමුව බන්ධනාගාරයේ සිට පැමිණි රැඳවියන්ට ඇඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය ආදිය ලබා දී ඇති බවත්, ඥාතීන් හමුවීමටද අවස්ථාව ලබාදී ඇති බවත්, 2026.09.01 දින වන විට පිරිමි රැඳවියන් 134ක් සහ කාන්තා රැඳවියන් 10ක් පමණක් එහි සිටි අතර, අනෙක් අය මීගමුව බන්ධනාගාරය වෙත මාරු කර ඇති බවත් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරි එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

තවද, මෙවැනි ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා සීසීටීවී හා ස්කෑනර් යන්ත්‍ර භාවිතය, රැඳවියන් සමඟ සාකච්ඡා කිරීම, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සඳහා වෙනම පුනරුත්ථාපන වැඩසටහන් පැවැත්වීම සහ නිලධාරී හිඟය විසඳීම අවශ්‍ය බව අඟුණකොළපැලැස්ස බන්ධනාගාර අධිකාරි එච්. එම්. පුෂ්පකුමාර හෙන්නායක මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.19 අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ පළමුපෙළ ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ පළමුපෙළ ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.09.02 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2026.07.06 දින අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ලෙස කටයුතු කළ බවත්, එදින එනම්, 2026.07.06 රාත්‍රී 8.30ත් 9.00ත් අතර මීගමුව බන්ධනාගාරයෙන් රැඳවියන් 150 දෙනෙකු බන්ධනාගාර බස් රථ 3කින් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයට රැගෙනවිත් තිබූ අතර, ඔවුන් සම්බන්ධ ලේඛන කිසිවක් ලබාදී නොතිබුණ බවත්, බන්ධනාගාරයේ පවතින සාමාන්‍ය ක්‍රමවේදය අනුව වෙනත් බන්ධනාගාර වලින් පැමිණෙන රැඳවියන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබන නමුත්, 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමෙන් පසුව රැඳවියන් විසින් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් හට පහර දී මරා දැමීම හේතුවෙන් මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත පැමිණි රැඳවියන් පරීක්ෂා කිරීමෙන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් වැළකී සිටීම හේතුවෙන් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාර නිලධාරීන් පස්දෙනෙකු විසින් රැඳවියන් පරීක්ෂා කිරීම සිදු කළ බවත්, එහිදී මත්පෙති, හෙරොයින් වැනි ද්‍රව්‍යයක්, මුදල් සහ මාංචු යතුරු හමුවී තිබෙන බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, එම රැඳවියන් අතර තුවාල ලැබූ කිහිපදෙනෙකු සිටි බවත්, සියලුම රැඳවියන් වෛද්‍ය පරීක්ෂණයට යොමුකර තිබෙන බවත්, එක් රැඳවියෙකු වෙඩි වැදීමෙන් තුවාල ලබා සිටීම හේතුවෙන් හම්බන්තොට රෝහලටත්, තවත් අයෙකු ඇසට සිදුවූ තුවාලයක් හේතුවෙන් තංගල්ල රෝහලටත් යොමුකර ඇති බවත්, මේ වන විට ඔවුන් ප්‍රතිකාර ලබා නැවත බන්ධනාගාරය වෙත පැමිණ ඇති බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් ප්‍රකාශ කර ඇත.

2026.07.07 සවස 6.00ට පමණ තවත් රැඳවියන් 120 දෙනෙකු මීගමුව බන්ධනාගාරයේ සිට රැගෙන ආ බවත්, ඔවුන් සම්බන්ධ ලේඛන ද එවා නොතිබූ බවත්, ඔවුන් ද පරීක්ෂා කර වෛද්‍යවරයා වෙත යොමුකර ඇති බවත්, ඒ අනුව මීගමුව බන්ධනාගාරයෙන් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය වෙත පැමිණි මුළු පිරිමි රැඳවියන් සංඛ්‍යාව 270ක් බවත්, එම පිරිස අතර සිටි යූ.එච්. සඳුන් චතුරංග සිල්වා අසනීප වීම හේතුවෙන් 2026.07.07 දින රාත්‍රියේ අඟුණුකොළපැලැස්ස රෝහලට ඇතුළත් කළ බවත්, ප්‍රතිකාර ලබමින් සිටියදී එම රැඳවියා මියගොස් ඇති බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.27 වන දින සිට රැඳවියන් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, මීගමුවෙන් පැමිණි රැඳවියන් 224 දෙනෙකු එලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබෙන බවත්, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ ධාරිතාව ඉක්මවා රැඳවියන් රඳවා සිටි බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් දක්වා ඇත.

තවද, අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ නිලධාරීන් විසින් මීගමුව බන්ධනාගාරයෙන් පැමිණි රැඳවියන් හට පහරදුන් බවට පැමිණිලි තමා වෙත ලැබී නොමැති නමුත්, මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් හා රැඳවියන් විසින් පහරදුන් බවට රැඳවියන් තමාට පවසා ඇති බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.05 සිදුවීමෙන් පසු ඊට පසුදිනම මීගමුව බන්ධනාගාරයට නිලධාරීන් යවා තක්සේරු කටයුතු සිදුකිරීම සුදුසු නොවන බවත්, මිය ගිය හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගොස් ඇත්තේ එම නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා බවත්, තත්ත්වය සමනය වූ පසු එවැනි කටයුතු සිදු කළේ නම් ජීවිත හානි වළක්වා ගැනීමට හැකිව තිබූ බව තමාගේ පෞද්ගලික මතය බවත් අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් බී.ඒ.පී. මධූෂ බාලසූරිය මහතා විසින් සඳහන් කර ඇත.

### 8.20 බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.09.02 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2026.01.01 දින සිට බූස්ස බන්ධනාගාරයේ අධිකාරිවරයා ලෙස කටයුතු කරන බවත්, ඊට පෙර මීගමුව බන්ධනාගාරයේ වසර 04 මාස 04ක් අධිකාරිවරයා ලෙස සේවය කළ බවත්, බූස්ස බන්ධනාගාර අධිකාරි ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කර ඇත. 2026.07.05 හා 06 දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වයෙන් පසු 2026.07.06 දින රැඳවියන් 68 දෙනෙකුද, 2026.07.07 දින 59 දෙනෙකුද, 2026.07.27 දින 03 දෙනෙකුද ඇතුළුව රැඳවියන් 130 දෙනෙකු බූස්ස බන්ධනාගාරයට මාරු කර එවා ඇති බවත්, ඔවුන් පැමිණෙන විට ඉන් කිහිපදෙනෙකු මත්ද්‍රව්‍ය හෝ මත්පෙති භාවිත කර ඇති බවට පෙනී ගොස් තිබූ බවත්, සෝදිසි කිරීමේදී ඖෂධ පෙති, මාංචු යතුරු කිහිපයක් හා කහ පැහැති කරාබුවක් සොයාගෙන ඇති බවත්, එසේ පැමිණි රැඳවියන් අතරින් 11 දෙනෙකු විශේෂ අංශයේද අනෙක් අය සාමාන්‍ය වාට්ටුවලද රඳවා ඇති බවත් බූස්ස බන්ධනාගාර අධිකාරි ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.07 දින රැඳවියන් බූස්ස බන්ධනාගාරය වෙත රැගෙන එන අවස්ථාවේදී කිහිපදෙනෙකු අතර දබරයක් සිදුව ඇති බවත්, එක් රැඳවියෙකු මීගමුව බන්ධනාගාරයේදීම තුවාල ලබා තිබූ බව වාර්තා වී ඇති බවත්, බොහෝ රැඳවියන්ට තුවාල තිබුණ ද, එදින රැඳවියන් විශාල පිරිසක් පැමිණීම සහ බූස්ස බන්ධනාගාරයේ ස්ථිර වෛද්‍යවරයෙකු නොමැතිවීම හේතුවෙන් ඒවා සම්පූර්ණයෙන් ලේඛනගත කිරීමට හා වහාම වෛද්‍ය පරීක්ෂණයට යොමු කිරීමට නොහැකි වූ බවත්, 2026.07.12 දින මීගමුව බන්ධනාගාරයේ වෛද්‍යවරුන් 05 දෙනෙකු පැමිණ රැඳවියන් 126 දෙනෙකු පරීක්ෂා කර ප්‍රතිකාර නිර්දේශ කළ බවත් බූස්ස බන්ධනාගාර අධිකාරි ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කර ඇත.

අධිකරණ හා අධිකරණ අමාත්‍යාංශ නියෝග අනුව 2026.07.27, 2026.07.28, 2026.07.30, 2026.07.31 හා 2026.08.03 යන දිනවල රැඳවියන් 102 දෙනෙකු අධිකරණ වෛද්‍ය පරීක්ෂණ සඳහා කරාපිටිය රෝහලේ සහ රුහුණු විශ්ව විද්‍යාලයේ අධිකරණ වෛද්‍යවරුන් වෙත ඉදිරිපත් කර ඇති බවත්, 30 දෙනෙකු කරාපිටිය රෝහලටත් 72 දෙනෙකු රුහුණු විශ්ව විද්‍යාලයටත් යොමු කර ඇති බවත් බූස්ස බන්ධනාගාර අධිකාරි ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් සඳහන් කර ඇත. බූස්ස බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවියන්ට පහරදුන් බවට වාර්තා වී තිබුණද, තමාට එවැනි පහරදීමක් සිදු වූ බවට වාර්තා වී නොමැති බවත්, තමාගේ නිලධාරීන් විසින් සිදුකර ඇත්තේ මීගමුව බන්ධනාගාරයේ උපකරණ ගබඩා හා කාර්යාල කඩා භාණ්ඩ රැගෙන ආ බවට ලැබුණු තොරතුරු මත දැඩි සෝදිසි කිරීමකට රැඳවියන් ලක් කිරීම පමණක් බවත් බූස්ස බන්ධනාගාර අධිකාරි ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.07 දින මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත රැගෙන ආ ජයසූරිය කරුණාගේ නිශාන් බුද්ධික පෙරේරා (සැක අංක 3470) දරණ සැකකරු එදිනම අසනීප වීම හේතුවෙන් ප.ව. 8.15ට පමණ කරාපිටිය රෝහලට ඇතුළත් කළ බවත්, ප.ව. 9.15ට පමණ එම සැකකරු මියගිය බව වාර්තා වූ බවත්, තමාට අනුව, රැඳවියා බූස්ස බන්ධනාගාරයට පැමිණ ඇත්තේ 2026.07.07 වන දින ප.ව. 4.30ට පමණ වන බවත්, බූස්ස බන්ධනාගාරයට ඇතුළත් කර ඇත්තේ ප.ව. 6.15ට පමණ බවත් බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, එම සැකකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණය කරාපිටිය ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරිනී එච්.ජී.එස්. සසිනි හිරුදිකා මිය විසින් සිදුකර ඇති අතර, මේ වන විට විවෘත තීන්දුවක් පමණක් ලැබී ඇති බවත්, එකී සිද්ධිය සම්බන්ධව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 15197/26 දරණ නඩුව විභාග වන බවත් බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දුමහතා විසින් සඳහන් කර ඇත.

තවද, තම අදහස අනුව, බන්ධනාගාර තුළ මත්ද්‍රව්‍ය ජාවාරම් හා පාතාල කණ්ඩායම්වල බලපෑම මෙවැනි සිදුවීම්වලට හේතුවක් වන අතර, ඉදිරියේදී මෙවැනි සිදුවීම් වැළැක්වීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය ආයතන හා ආරක්ෂක අංශ ඒකාබද්ධව සහාය ලබාදීම සඳහා අමාත්‍යාංශය මගින් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති බවත් බූස්ස බන්ධනාගාර අධිකාරී ජීවක ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 8.21 වාරියපොළ බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ජේ.ජී. අමුණුගම මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් වාරියපොළ බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර් ජේ.ජී. අමුණුගම මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.09.02 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා වාරියපොළ බන්ධනාගාරයේ දෙවන පෙළ ජේලර්වරයෙකු ලෙස සේවය කරන බවත්, 2026.07.05 දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය හේතුවෙන් බන්ධනාගාර අධිකාරිවරයාගේ උපදෙස් මත නියාමක නිලධාරීන් හත්දෙනෙකු සහ කාන්තා නියාමක නිලධාරීන් දෙදෙනෙකු සමඟ රාත්‍රී 8.00ට පමණ මීගමුව බන්ධනාගාරය වෙත පිටත්ව, රාත්‍රී 10.00ට පමණ එහි ළඟා වූ බවත් ජේලර් ජේ.ජී. අමුණුගම මහතා විසින් ප්‍රකාශ කර ඇත.
මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන්ගේ හිඟයක් පැවති බැවින් තම කණ්ඩායමේ පිරිමි නිලධාරීන් පිටත දොරටුව හා ලී දොරටුවේද, කාන්තා නිලධාරිනියන් කාන්තා අංශයේද රාජකාරියට යොදවා තිබූ බවත්, තමා බන්ධනාගාරය තුළට අවස්ථා කිහිපයකදී ගොස් තත්ත්වය නිරීක්ෂණය කර උසස් නිලධාරීන් දැනුවත් කළ බවත්, රැඳවියන් විසින් ප්‍රධාන ජේලර් කාර්යාලය, සැලුන් එක, බන්ධනාගාර අධිකාරී

කාර්යාලය, ගබඩාව හා රෝහල ඇතුළු ගොඩනැගිලි විනාශ කර තිබූ බවත්, සීසීටීවී පද්ධතියද විනාශ කර ඇති බව මීගමුව බන්ධනාගාර අධිකාරිවරයා පැවසූ බවත් ජේලර් ජේ.ජී. අමුණුගම මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 දින තමා මීගමුව බන්ධනාගාරයේ සිටියදී පෙ.ව. 9.30ට පමණ නිලධාරීන් විසින් රැඳවියන් හට ආහාර ලබාදීමේදී රැඳවියන් පිරිසක් පොලු හා ගල් රැගෙන ප්‍රධාන දොරටුව දෙසට පැමිණි බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බැටන් සහ පළිහන් සහිතව ඇතුළුවූ බවත්, රැඳවියන් ඔවුන් පසුපස දිව ආ බැවින් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් කිහිප දෙනෙකු බන්ධනාගාර අධිකාරී කාර්යාලය අසල තිබූ වැසිකිලියක් තුළට ඇතුළු වූ බවත්, තමා ද එයට ඇතුළු වූ බවත්, එලෙස රැඳී සිටින විට එම වැසිකිළියේ දොර කඩා දමා රැඳවියන් ඇතුළට පැමිණි බවත්, රැඳවියන් විසින් තමා හට පොලුවලින් පහරදී හිසට හා අත්වලට තුවාල සිදු කළ බවත්, ඒ අවස්ථාවේදී වෙනත් රැඳවියන් දෙදෙනෙකු තමාව පහරදීම් වලින් බේරාගෙන පිටතට ගෙන ආ බවත් ජේලර් ජේ.ජී. අමුණුගම මහතා විසින් සඳහන් කර ඇත. එලෙස පිටතට පැමිණීමෙන් අනතුරුව තමාව මීගමුව රෝහලට ඇතුළත් කළ බවත්, එම රෝහලේ දින 3ක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත්, අත් දෙකේ අස්ථි හා ඇඟිලිවලට තුවාල සිදුවී තිබූ බැවින් දින 42ක් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවත්, දැනටත් අත් වල ඇතැම් ඇඟිලි ඇද වී නැවීමට නොහැකි තත්ත්වයක් පවතින බැවින් ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සිදු කරන බවත් ජේලර් ජේ.ජී. අමුණුගම මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙවැනි ගැටුම් වැළැක්වීම සඳහා තෝරාගත් රැඳවියන් තනි සිරමැදිරිවල රඳවා තැබීම, බන්ධනාගාර තුළ ජැමර් පද්ධති ක්‍රියාත්මක කිරීම සහ බන්ධනාගාරයේ විවිධ කොටස් වෙන්කර පවත්වාගෙන යාම අවශ්‍ය බවට තමා යෝජනා කරන බවත් ජේලර් ජේ.ජී. අමුණුගම මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

### 8.22 දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්.එම්.ඊ.එම්. රත්නායක මහතාගේ කරුණු දැක්වීම

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්.එම්.ඊ.එම්. රත්නායක මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2026.09.02 වන දින පහත පරිදි ප්‍රකාශයක් ලබා දී ඇත.

තමා 2026.07.05 දින පෙ.ව. 8.00ට දළුපොත බන්ධනාගාරයේ රාජකාරි භාරගත් බවත්, එදින දහවල් 12.00ට පමණ මීගමුව බන්ධනාගාරයේ කැරැල්ලක් වැනි ගැටුම්කාරී තත්ත්වයක් ඇතිවී ඇති බව දැනුම් දීමෙන් පසු පැය භාගයක් ඇතුළත එහි ගිය බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් සඳහන් කර ඇත. මීගමුව බන්ධනාගාරයට පැමිණි විට

රැඳවියන් 1000ක් පමණ නිලධාරීන් වටකරගෙන සිටි බවත්, රැඳවියන් දෙපාර්ශවයකට බෙදී සිටි බවත්, දහවල් 1.00ට පමණ රැඳවියන් විසින් කාර්යාල හා බන්ධනාගාර රෝහලට ඇතුළු වී දේපළ හා ඖෂධවලට හානි කරමින් සිටි බවත්, රැඳවියන් අතර පහරදීම් සිදුවී තුවාල ලැබූ පිරිසක් ගේට්ටුව අසලට රැගෙනවිත් රෝහල්ගත කිරීමට කටයුතු කළ බවත්, මියගිය රැඳවියන් දෙදෙනෙකුගේ සිරුරුද රෝහලට ගෙන ගිය බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් සඳහන් කර ඇත.

එසේම, 2026.07.05 වන දින සවස 6.30ට පමණ තත්ත්වය තාවකාලිකව සාමකාමී වූ බවත්, රාත්‍රී 8.00-9.00 අතර රැඳවියන් වාට්ටු වෙත යොමු කර අගුළු දැමීමට කටයුතු කළ බවත්, වාට්ටු අංක 6 හා 7 අසල වහලයක රැඳවියන් 50-60ක් පමණ රැඳී සිටි බවත්, දොරගුළු කඩා දැමීම හේතුවෙන් නිලධාරීන්ට පාන්දර 3.00-3.30 පමණ වනතුරු තත්ත්වය නිරීක්ෂණය කිරීමට සිදුවූ බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් දක්වා ඇත.

ඊට පසුදින එනම්, 2026.07.06 වන දින පෙ.ව. 6.00-6.30 පමණ මීගමුව බන්ධනාගාරයේ තත්ත්වය සාමකාමීව පැවති බවත්, පෙ.ව. 8.30ට පමණ තමාව මීගමුව බන්ධනාගාරය තුළ සිදු වූ හානිය තක්සේරු කිරීම සඳහා පත් කර ඇති කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කර ඇති බැවින් ප්‍රධාන කාර්යාලය වෙතින් පැමිණෙන සාමාජිකයන් සමඟ එම කටයුතු වල නිරත වන ලෙසට මීගමුව බන්ධනාගාර අධිකාරී සහ දළුපොත බන්ධනාගාර අධිකාරී විසින් තමා වෙත උපදෙස් ලබා දුන් බවත්, ඒ සඳහා ඉංජිනේරුවරයෙක්, සහකාර මුදල් කොමසාරිස්වරියක් සහ වැඩ පරීක්ෂක වශයෙන් නිලධාරියෙක් සහභාගී වූ බවත්, තමා එකී දේපළ හානි තක්සේරු කිරීමේ කමිටුව සමඟ පරීක්ෂණ කටයුතු සිදුකළ බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් දක්වා ඇත.

එම අවස්ථාවේදී රැඳවියන් 200ක් පමණ දිව එන බව දුටු බවත්, එම රැඳවියන් විසින් එක් රැඳවියෙකුගේ ඇඳුම් ගලවා නිරුවත් කර පහරදුන් බවත්, එම රැඳවියා බේරා ගැනීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු මැදිහත් වී සිටි බවත්, එම නිලධාරීන්ට ද රැඳවියන් විසින් බලපෑම් කරමින් පහර දෙමින් සිටින අයුරු තමා දුටු බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් සඳහන් කර ඇත.මෙම සිදුවීම නිරීක්ෂණය වීමෙන් පසුව තමා සමඟ බාහිරින් පැමිණි කාන්තා නිලධාරිනියක් ඇතුළු නිලධාරින් සිටි නිසා යම් හානියක් ඔවුන්ට සිදුවීමේ අවධානමක් ඇති බැවින්, එම පිරිස පිටතට රැගෙන යාමට ප්‍රධාන දොරටුව වෙත පැමිණි බවත්, නමුත් ඒ වන විටත් ඒ අසල රැඳවියන් 100, 200 ක් පමණ රැදි සිටි බැවින්, ගේට්ටුව වැසී තිබූ බවත්, ඉන්පසුව රැඳවියන් කාන්තා නිලධාරිනිය ඇදගෙන යාමට උත්සාහ කළ බවත්, අදාළ නිලධාරිනිය තමා විසින් ඇදගෙනවිත් ගේට්ටුවෙන් පිටතට දැමූ බවත්, නිරුවතින් පහර කෑමට ලක්ව සිටි රැඳවියා සහ පහර කෑමකට ලක්ව සිටි නිලධාරියෙක් ද ගේට්ටුවෙන් පිටතට ගැනීමට තමා කටයුතු කළ බවත්, එම අවස්ථාවේදී ගේට්ටුව අසල සිටි රැඳවියන් පිටතට පැමිණීමට උත්සාහ කළ බවත්, තමා ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු බන්ධනාගාරය තුළට ගොස් ඔවුන් ඉන් ඉවත් කිරීමට උත්සහ කළ බවත්, එම අවස්ථාව වන විට බන්ධ

පොලිසියේ නිලධාරින් ඇතුළට ගිය බවත්, ඔවුන් ඇතුළට යන අවස්ථාවේදීම ගේට්ටුව අසල සිටි රැඳවියන් ඇතුළට දිව ගිය බවත්, මිනිත්තු 5 ක් පමණ යාමට මත්තෙන් බන්ධනාගාරය තුළින් 500ක් පමණ රැඳවියන් පිරිසක් ගල්, උළු කැට, පොලු සහ යකඩ රැගෙන ඉදිරියට පැමිණි බවත්, ඔවුන් නිලධාරීන්ට පහරදුන් බවත්, තමාට ද රැඳවියන් අත තිබූ ගල් සහ පොලු වලින් පහරා දුන් බවත්, හිතවත් රැඳවියන් විසින් නිලධාරීන් ආරක්ෂා කිරීමට කටයුතු කළ බවත්, තුවාල ලැබූ නිලධාරීන් පිටතට යොමු කරන ලෙසට රැඳවියන්ට දැනුම් දී තමා පිටතට පැමිණි බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් සඳහන් කර ඇත.

2026.07.06 වන දින පෙ.ව. 9.30ට පමණ තමා බන්ධනාගාරයෙන් පිටතට පැමිණි අතර, ඒ අවස්ථාවේදී කැරලි මර්දන උපකරණ සහිත නිලධාරීන් 20-25ක් පමණ බන්ධනාගාරය ඇතුළට ගිය බවත්, තුවාල ලැබූ නිලධාරීන් 10ක් පමණ රැඳවියන් විසින් පිටතට ගෙනවිත් දුන් බවත්, තමා ද රෝහල්ගතව දින හතක් ප්‍රතිකාර ලැබූ බවත්, 2016.07.16 වන දින රාජකාරියට වාර්තා කළ බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් ප්‍රකාශ කර ඇත.

මෙම සිද්ධියට මත්ද්‍රව්‍ය හා රැඳවියන් දෙපිරිසක් අතර ගැටුම හේතු වූ බවත්, රස පරීක්ෂක වාර්තා ප්‍රමාදය අවම කිරීම, ප්‍රමාණවත් නිලධාරීන් යෙදවීම හා බන්ධනාගාර තදබදය අවම කිරීම අවශ්‍ය බවත්, මෙම සිද්ධියට අදාළ තමා සතු වීඩියෝ දර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරන බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්. එම්. ඊ. එම්. රත්නායක මහතා විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

## 9. පුවත්පත් වාර්තා කිරීම්

### 9.1 2026 ජූලි මස 05 වන දින 'ලංකාදීප' පුවත්පත

"මීගමු බන්ධනාගාර ගැටුමින් දෙදෙනෙක් මරුට: 24ක් රෝහලට" නමැති එසැණ පුවත් වාර්තාවට අනුව, මීගමුව බන්ධනාගාරයේ රඳවා සිටින අච්චු විඳින සිරකරුවන් සහ සාමාන්‍ය සිරකරුවන් (රැඳවියන් දෙපිරිසක්) අතර හදිසියේ හටගත් ප්‍රචණ්ඩකාරී ගැටුමකින් දෙදෙනෙකු මියගොස් තවත් 24 දෙනෙකු තුවාල ලබා තිබේ. මෙම ගැටුම්කාරී වාතාවරණය අතරතුර රැඳවියන් දෙදෙනෙකු බන්ධනාගාරයෙන් පළාගොස් ඇති බවට තොරතුරු වාර්තා වී ඇති අතර, උද්ගත වූ නොසන්සුන් තත්ත්වය පාලනය කර සමනය කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය (STF) වහාම කැඳවීමට පියවර ගත් බව පොලිස් මාධ්‍ය කාර්යාලය තහවුරු කර ඇත යනුවෙන් වාර්තා කර ඇත.

### 9.2 2026 ජූලි මස 06 වන දින 'ලංකාදීප' පුවත්පත

"මීගමුව බන්ධනාගාරය යළි නොසන්සුන්: නිලධාරීන්ටත් තුවාල" නමැති පුවත් වාර්තාවට අනුව, ඊට පෙරදින (ජූලි 05) රැඳවියන් දෙදෙනෙකුගේ මරණයට සහ 33 දෙනෙකුගේ තුවාල ලැබීමට හේතු වූ

ගැටුම්කාරී වාතාවරණය පාලනය කර තිබුණ ද, ජූලි 06 වන දින උදෑසන වන විට බන්ධනාගාරය තුළ නැවතත් උණුසුම් නොසන්සුන් තත්ත්වයක් හටගෙන තිබේ. රිමාන්ඩ් භාරයේ පසුවන රැඳවියන් පිරිසක් සහ දඬුවම් නියම වී සිටින රැඳවියන් පිරිසක් අතර මෙම යළි හටගත් ගැටුම සිදුව ඇති අතර, එහිදී රැඳවියන් විසින් එල්ල කරන ලද ප්‍රහාරවලින් බන්ධනාගාර නිලධාරීන් 06 දෙනෙකු තුවාල ලබා මීගමුව රෝහලට ඇතුළත් කර ඇති බවත්, තවත් පිරිසක් තුවාල ලබා සිටින බවත් පොලිස් සහ බන්ධනාගාර ආරංචි මාර්ග තහවුරු කර ඇති බව වාර්තා කර ඇත.

### 9.3 2026.07.06 දිනැති BBC News සිංහල

මෙම සිදුවීමට සම්බන්ධයෙන් BBC News සිංහල සේවය මගින් ජූලි 05 වන දින සිට ජූලි 06 වන දින දක්වා කාලය තුළ කාලරාමුවකට අනුකූලව විශේෂ පුවත් වාර්තාවක් ලෙස ඉදිරිපත් කර ඇත. අදාළ මාධ්‍ය වාර්තාවට අනුව, මීගමුව බන්ධනාගාරය තුළ රැඳවියන් දෙපිරිසක් අතර ඇති වූ මතගැටුමක් දුරදිග යාමෙන් හටගත් නොසන්සුන්තාව පාලනය කිරීමට පොලිස් කැරලි මර්දන ඒකකය සහ පොලිස් විශේෂ කාර්ය බලකාය (STF) ඇතුළු වී වෙඩි තැබීම් සිදු කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයින් 26 දෙනෙකු (බන්ධනාගාර නිලධාරීන් 7 දෙනෙකු ඇතුළුව) මියගොස් 100කට ආසන්න පිරිසක් තුවාල ලබා ඇත. මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීමෙන් අනතුරුව රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යැවීමට කටයුතු කර ඇති බවත්, රැඳවියන් 600-650කට පමණ පහසුකම් ඇති ස්ථානයක 2,600කට ආසන්න පිරිසක් රඳවා සිටීම වැනි දැඩි තදබදය සහ සනීපාරක්ෂක පහසුකම් මන්දගාමී වීම මෙයට ප්‍රධාන හේතුවක් වූ බවත් එහි සඳහන් වේ. තවද, සිද්ධියෙන් පසු බන්ධනාගාරය ඉදිරිපිටට රැස්වූ රැඳවියන්ගේ ඥාතීන්ට තම පවුලේ අය පිළිබඳ නිසි තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බව ද එකී පුවත්පත් වාර්තාව මගින් වැඩිදුරටත් අනාවරණය කර ඇත.

### 9.4 2026 ජූලි මස 06 වන දින 'ලංකාදීප' පුවත්පත

**"මීගමුව හිරගෙදර යුද පිටියක්: රැඳවියෝ 2ක් මරුට: 33ක් රෝහලේ"** ලෙස පළ වූ ප්‍රධාන පුවත් වාර්තාවට අනුව, ජූලි 05 වන දින දහවල් 1.00 ට පමණ මෙම ගැටුම ආරම්භ වී තිබේ. මත්ද්‍රව්‍ය පාවාදීම්, මංකොල්ලකෑම් සහ ආයුධ පාවිච්චිය සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ සිටින 'සුරේෂ්' නමැත්තා මෙහෙයවන පිරිසක් සහ තවත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පිරිසක් අතර හටගත් මෙම ආරවුල පසුව දෙපිරිසේ හිතවතුන් මැදිහත්වීමෙන් යුද පිටියක් බඳු ප්‍රචණ්ඩකාරී තත්ත්වයකට පත්ව ඇත. ගැටුම අතරතුර රැඳවියන් බන්ධනාගාර ඖෂධාලය කඩා එහි තිබූ විවිධ ඖෂධ පානය කිරීම, විශේෂිත සිරමැදිරිවල ඉබි යතුරු කඩා සිරකරුවන්ට පහරදීම, සහ කාන්තා රැඳවියන් ඇතුළු පිරිසක් වහලයට නැග විරෝධතා පෑම නිසා වහලයේ කොටස් කඩා වැටීම වැනි ක්‍රියා සිදු කර තිබේ. මෙම සිදුවීමෙන් රැඳවියන් දෙදෙනෙකු මියගොස් (දෙදෙනෙකුගේ තත්ත්වය බරපතළ වී කොළඹ ජාතික රෝහලට මාරු කර යවා ඇත), 33 දෙනෙකු තුවාල ලබා ඇති අතර, තත්ත්වය පාලනය කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය (STF) සහ අමතර පොලිස් කණ්ඩායම් යොදවා ආරක්ෂාව තර

කිරීමටත්, සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ පොලිස් පරීක්ෂණ ආරම්භ කිරීමටත් කටයුතු කර ඇති බවත් වාර්තා කර ඇත.

### 9.5 2026 ජූලි මස 07 වන දින 'BBC News සිංහල'

**"මීගමුව බන්ධනාගාරයේ නොසන්සුන්තාව ගැන ඔබ නිතර නගන ප්‍රශ්න 10කට පිළිතුරු"** නමැති විශේෂ විමර්ශනාත්මක වාර්තාවට අනුව, ජූලි 05 වන දින මත්ද්‍රව්‍ය චෝදනා ලැබූ රැඳවියන් දෙපිරිසක් අතර ඇති වූ පළමු ගැටුමෙන් පුද්ගලයින් දෙදෙනෙකු මියගොස් 35 දෙනෙකු තුවාල ලබා එදිනම තත්ත්වය පාලනය කළ ද, ජූලි 06 වන දින උදෑසන මත්ද්‍රව්‍ය පෙති පානය කර සිහිවිකල් වූ රැඳවියන් යළිත් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙමින් නිලධාරීන්ට පහර දී ප්‍රධාන යකඩ දොර කඩාගෙන පැන යාමට උත්සාහ කර ඇත. එම අවස්ථාවේදී පලායාම වැළැක්වීමට සහ ඇතුළත කොටුවූ නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා ආරක්ෂක අංශ විසින් දොරෙහි වූ කුඩා කවුළුවකින් වෙඩි තැබීම සිදු කර ඇති අතර, ජූලි 07 වන විට මියගිය සංඛ්‍යාව 27 දක්වා (රැඳවියන් 20යි, නිලධාරීන් 7යි) ඉහළ ගොස් තවත් 104 දෙනෙකු තුවාල ලබා තිබේ. රැඳවියන් 10,500ක ධාරිතාවක් ඇති මෙරට බන්ධනාගාර පද්ධතිය තුළ 41,257ක් සහ මීගමුවේ පමණක් 2,400කට ආසන්න පිරිසක් රඳවා සිටීම මෙන්ම නිලධාරී හිඟය ද මෙම අර්බුදයට බලපා ඇති බවත්, තත්ත්වය පාලනය කිරීමෙන් පසු රැඳවියන් 1,000කට ආසන්න සංඛ්‍යාවක් වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යවා නාමලේඛන රෝහල් සහ බන්ධනාගාර ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ප්‍රසාද් හේමන්ත කුමාර, බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක ඒ.සී. ගජනායක සහ අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර යන මහත්වරුන්ගේ ප්‍රකාශ ඇසුරෙන් වාර්තා කර ඇත.

### 9.6 2026 ජූලි මස 07 වන දින 'අරුණ' පුවත්පත

***"මීගමුව බන්ධනාගාරය ලේ විලක් කළේ කටුවැල්ලේගම සුරේෂ් – පොලිසියට සැකයක්"*** නමැති වාර්තාවට අනුව, 2026 ජූලි 05 වන දින පස්වරුවේ ආරම්භ වූ මෙම ප්‍රචණ්ඩකාරී ගැටුමට මුල් වී ඇත්තේ කෙහෙල්බද්දර පද්මේ නමැති සංවිධානාත්මක අපරාධකරුගේ සමීපතමයකු වන 'කටුවැල්ලේගම සුරේෂ්' නමැති රැඳවියා සම්බන්ධ මත්ද්‍රව්‍ය ජාවාරමක් පාවාදීමේ සිදුවීමකි. ජූලි 05 වන දින රාත්‍රියේ කුපිත වූ රැඳවියන් බන්ධනාගාර රෝහලට පැන ඖෂධ පැහැරගනිමින්, වහල මතට නැගීමෙන් (එක් වහලක් කඩා වැටී සිව්දෙනෙකුට තුවාල සිදුවෙමින්) සහ එකිනෙකා ගහමරා ගනිමින් ගැටුම ආරම්භ කර ඇති අතර, ජූලි 06 වන දින උදෑසන ආහාර වේල ලබා දෙන අවස්ථාවේදී එය බන්ධනාගාර නිලධාරීන් වෙත එල්ල කළ දරුණු ප්‍රහාරයක් දක්වා වර්ධනය වී ඇත. මෙම පහරදීම් සහ ගැටුම් හේතුවෙන් ජේලර් එස්.එච්.එස්. චන්ද්‍රවංශ ඇතුළු බන්ධනාගාර නිලධාරීන් 07 දෙනෙකු සහ රැඳවියන් ඇතුළුව පුද්ගලයින් 26 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව ඇති අතර, මෙය බන්ධනාගාර ගැටුමකදී නිලධාරීන් 07 දෙනෙකු මියගිය ප්‍රථම අවස්ථාව ලෙස ද වාර්තා වේ. සාමාන්‍යයෙන් 900ක ධාරිතාවකින් යුත් මෙම බන්ධනාගාරය තුළ රැඳවියන් 2,400කට අධික පිරිසක් අධික ලෙස තදබද කර රඳවා සිටීම ගැටුම පාලනය කිරීමට නොහැකි වීමට ප්‍රධාන හේතුවක් ලෙස රැඳවියන්ගේ ඥාතීන්

චෝදනා කරන අතර, තත්ත්වය පාලනය කිරීමෙන් අනතුරුව රැඳවියන් 675 දෙනෙකු පල්ලන්සේන සහ දුම්බර (පල්ලෙකැලේ) බන්ධනාගාර වෙත මාරු කර යැවීමටත්, සිද්ධිය පිළිබඳ සොයා බැලීමට විශේෂ ත්‍රිපුද්ගල කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කිරීමටත් කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් වාර්තා කර ඇත.

### 9.7 2026 ජූලි මස 07 වන දින 'දිවයින' පුවත්පත

**"මීගමුව හිරගෙදර තනිකර යුද පිටියක් – නිලධාරීන් 7 ක් ඇතුළු 26 ක් මරුට"** නමැති ප්‍රධාන පුවත් වාර්තාවට අනුව, මෙම ප්‍රචණ්ඩකාරී ගැටුම හටගෙන ඇත්තේ බන්ධනාගාරය තුළ මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරමක නිරත වූ 'කටුවැල්ලේගම මහේෂ්' (පාතාල නායක කෙහෙල්බද්දර පද්මේගේ ගෝලයෙකු වන බූරු මූණාගේ සමීපතමයෙකු) ඇතුළු කල්ලියක් සහ ඊට විරෝධය පාමින් පාලනාධිකාරියට ඔත්තු ලබා දුන් රැඳවියන් පිරිසක් අතරයි. ජූලි 05 වන දින ආරම්භ වූ මෙම නොසන්සුන්තාව ජූලි 06 වන දින උදෑසන ආහාර ලබා දීමට පැමිණි බන්ධනාගාර නිලධාරීන්ට අමානුෂික ලෙස පහරදී, නිරුවත් කර, ගිනි අවි සහ ජංගම දුරකථන පැහැර ගනිමින් ප්‍රාණ ඇපයට ගැනීමත් සමඟ උච්චස්ථානයට පැමිණ ඇත. රැඳවියන් විසින් ශරීර අභ්‍යාස ඒකකයේ යකඩ පොලු කඩාගෙන සිදු කළ පහරදීම් සහ ඖෂධාලය කඩා මානසික ආතතිය සඳහා වන ඖෂධ අධිමාත්‍රාවෙන් පානය කර අසිහියෙන් හැසිරීම හේතුවෙන් ජේලර් එල්.ඒ.එස්. චන්ද්‍රවංශ මහතා ඇතුළු නිලධාරීන් 7 දෙනෙකු සහ රැඳවියන් ඇතුළු 26 දෙනෙකු ඝාතනය වී ඇත. ආරක්ෂක අංශ එල්ල කළ වෙඩි ප්‍රහාර ඇතුළු ගැටුම්වලින් STF, පොලිස් හා බන්ධනාගාර නිලධාරීන් 29 දෙනෙකු සහ රැඳවියන් 75 දෙනෙකු තුවාල ලබා ඇති අතර, එයින් බරපතළ තුවාල ලැබූ 14 දෙනෙකු කොළඹ ජාතික රෝහලට මාරු කර යවා තිබේ. 600ක ධාරිතාවකින් යුත් බන්ධනාගාරයේ රැඳවියන් 1,800කට අධික පිරිසක් දැඩි පීඩනයකින් රඳවා සිටීම ගැටුම උත්සන්න වීමට හේතු වී ඇති අතර, ගුවන් හමුදාවේ බෙල් 412 හෙලිකොප්ටර් යානා හා ඩ්‍රෝන යොදාගනිමින් නිරීක්ෂණය කර පාලනය කළ මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැඩබලන පොලිස්පති සංජීව ධර්මරත්න මහතාගේ අධීක්ෂණය යටතේ පූර්ණ විමර්ශන ආරම්භ කර සියලු රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීමට කටයුතු කර ඇති බව එහි වැඩිදුරටත් වාර්තා කර ඇත.

### 9.8 2026 ජූලි මස 11 වන දින 'දිවයින' පුවත්පත

***"හිතන්න දෙයක් ඉතිරි කළ මීගමුව බන්ධනාගාර ගැටුම..."*** නමැති ලිපියට අනුව, මීගමුව බන්ධනාගාරය තුළ හටගත් ප්‍රචණ්ඩකාරී ගැටුම හදිසියේ සිදු වූවක් නොව, පද්ධතිය තුළ කලක පටන් පැසවමින් තිබූ දූෂණය, පරිපාලනමය බිඳවැටීම, නිලධාරීන්ගේ පාක්ෂික හාවිතාවන්, අධික සිරකරු තදබදය (ධාරිතාව 650ක් වන ස්ථානයක රැඳවියන් 2,400-2,600ක් පමණ රඳවා තිබීම) සහ සංවිධානාත්මක පාතාල/මත්ද්‍රව්‍ය කල්ලිවල ඍජු බලපෑමේ ප්‍රතිඵලයකි. ජූලි 05 වන දින රැඳවියන් පිරිසක් අතර මත්ද්‍රව්‍ය ජාවාරමකට අදාළ පාවාදීමක් මුල් කරගනිමින් ආරම්භ වූ මෙම ප්‍රචණ්ඩත්වය,

පසුව බන්ධනාගාර රෝහල කඩා බිඳ දමා එහි තිබූ අධිමාත්‍රා ඖෂධ පානය කිරීමෙන් කුපිත වූ රැඳවියන් විසින් ජූලි 06 වන දින උදෑසන බන්ධනාගාර නිලධාරීන් වෙත එල්ල කරන ලද ම්ලේච්ඡ ප්‍රහාරයක් දක්වා වර්ධනය වී ඇත. මෙම සිදුවීමෙන් පුද්ගලයින් 28 දෙනෙකු (අමානුෂික පහරදීම්වලින් ඝාතනය වූ බන්ධනාගාර නිලධාරීන් 07 දෙනෙකු ද ඇතුළුව) මියගොස්, බන්ධනාගාරයේ ගිනි අවි සහ රුපියල් කෝටි 12ක පමණ දේපළ විනාශ වී ඇති අතර, පාලනය සඳහා අවම බලය භාවිත කිරීමට සිදු වූ පොලිස් විශේෂ කාර්ය බලකායේ (STF) නිලධාරීන්ට පවා මරණ තර්ජන එල්ල වී තිබේ. සිද්ධියෙන් පසු මුළු බන්ධනාගාරයම "අපරාධ ස්ථානයක්" (Crime Scene) ලෙස මුද්‍රා තබා, රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කර යැවීමටත්, සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) සහ විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ කමිටුවක් හරහා විමර්ශන ආරම්භ කිරීමටත් කටයුතු කර ඇති බව සඳහන් කර ඇත.

### 9.9 2026 ජූලි මස 31 වන දින 'BBC News සිංහල' පුවත්පත

**"මීගමුව බන්ධනාගාර ගැටුම: ප්‍රධාන ජේලර්ගේ 'අතිශය සංවේදී තොරතුරු ඇතුළත් සාක්ෂිය' ගැන මහේස්ත්‍රාත් දුන් නියෝගය"** නමැති වාර්තාවට අනුව, ජූලි 30 වන දින මීගමුව ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ මෙම නඩුව කැඳවූ අවස්ථාවේ බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් වික්‍රම ජයන්ත කුමාර මහතා පැය 2ක කාලයක් රහසිගත සාක්ෂි ලබා දී තිබේ. එම සාක්ෂියෙහි ජාතික ආරක්ෂාවට දැඩි සංවේදීතාවක් ඇති තොරතුරු ඇතුළත් වන බැවින්, ඒවා මාධ්‍ය මගින් හෙළිදරව් නොකරන ලෙසත් සාක්ෂි සම්පිණ්ඩනය අධිකරණය භාරයේ සුරක්ෂිතව තබන ලෙසත් ප්‍රධාන මහේස්ත්‍රාත් සීලනී පෙරේරා මහත්මිය නියෝග කළාය. මෙම ගැටුම පාලනය කිරීමට වැලිකඩින් කැඳවූ උපක්‍රමික බන්ධනාගාර පොලිස් නිලධාරීන් 80 දෙනා පිළිබඳ වාර්තාවක් ද ඉදිරිපත් වූ අතර, පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ උපදෙස් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පති ශානි අබේසේකර මහතා කළ ඉල්ලීමකට අනුව විමර්ශන කටයුතු CID ය වෙත පවරා, සහකාර පොලිස් අධිකාරීවරුන් 04 දෙනෙකු යටතේ පුළුල් පරීක්ෂණ ක්‍රියාත්මක වන බව අධිකරණය හමුවේ තහවුරු වී ඇත.

### 9.10 2026 අගෝස්තු මස 03 වන දින 'දිනමිණ'

**"වහා නතර කළ යුතු බන්ධනාගාර නාටකය"** ලෙස පළ වූ කතුවැකියට අනුව, වැලිකඩ, මීගමුව සහ මහර යන බන්ධනාගාරවල එක පිට එක සිදු වූ කැරලි මාලාව හුදෙක් සිරකරුවන්ගේ ක්ෂණික කෝපයක් හෝ අහඹු සිදුවීමක් නොව, රටේ නීතිය හා රාජ්‍ය යන්ත්‍රණය අඩපණ කිරීමට සංවිධානාත්මක අපරාධකරුවන් සහ පාතාලය විසින් දියත් කළ දරුණු කුමන්ත්‍රණයක ප්‍රතිඵලයකි. මීගමුව බන්ධනාගාර සිදුවීමේදී දක්ෂ බන්ධනාගාර නිලධාරීන් සහ සිරකරුවන් ගණනාවකගේ ජීවිත අහිමි වීම තුළින් බන්ධනාගාර පද්ධතිය තුළ පාතාලයේ ග්‍රහණය සහ ආයතනගත කුමන්ත්‍රණ පවතින බව තහවුරු වන බවත්, සිදුවීමට සම්බන්ධවූවන්ට හෝ කැරැල්ල මෙහෙයවූවන්ට මිනීමැරුම් චෝදනා යටතේ නඩු පැවරීමෙන් පමණක් බලධාරීන්ට වගකීමෙන් නිදහස් විය නොහැකි බවත් එමගින්

පෙන්වා දෙයි. එම නිසා බන්ධනාගාර පාලනය පාතාලයේ හා දේශපාලන අතපෙවීම්වලින් සම්පූර්ණයෙන්ම මුදාගෙන, ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරමින් ජීවිත සුරක්ෂිත කරන සහ සැබෑ වගවීමක් සහිත වැඩපිළිවෙළක් වහා ක්‍රියාත්මක කළ යුතු බව කතුවැකිය අවධාරණය කරයි.

## 10. 2020 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පිළිබඳ අධ්‍යයනය (Prison Study by HRCSL)

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය සහ බන්ධනාගාරයන්හි ක්‍රියාත්මක වන ක්‍රමවේදයන්, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම සමඟ පවතින අනුකූලතාව පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේදී විශේෂ අධ්‍යයනයක් සිදු කර ඇත. ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගතව සිටින තැනැත්තන්ගේ මානව හිමිකම් කෙරෙහි බලපෑම් එල්ල කරන විවිධ ගැටලු පිළිබඳව පුළුල් ලෙස විමර්ශනය කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන මිනුම් දර්ශකය ලෙස භාවිත කර ඇත්තේ, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් සම්පාදිත රැඳවියන්ට සැලකීම පිළිබඳ අවම සම්මත රීති සංග්‍රහය වන “නෙල්සන් මැන්ඩෙලා රීති” (Nelson Mandela Rules) වේ.

2018 වර්ෂයේ අප්‍රේල් සහ සැප්තැම්බර් යන මාස අතර කාලසීමාව තුළ මෙම අධ්‍යයනය සිදු කර ඇති අතර, එහිදී බන්ධනාගාර, රිමාන්ඩ් බන්ධනාගාර සහ එළිමහන් වැඩ කඳවුරු ඇතුළු රැඳවුම් ස්ථාන 20ක් නිරීක්ෂණයට ලක් කර ඇත. එසේම, බන්ධනාගාර නිලධාරීන්, රැඳවියන්, රාජ්‍ය ආයතන, ස්වාධීන ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන වැනි සියලු අදාළ පාර්ශවකරුවන් සමඟ සිදු කරන ලද ගවේෂණාත්මක සම්මුඛ සාකච්ඡා ද මෙම අධ්‍යයනයට අන්තර්ගත වී ඇත.

එකී අධ්‍යයනය මගින් බන්ධනාගාර පද්ධතිය තුළ පවතින ගැටලු පෙන්වා දී ඇති අතර, එහි ඇතුළත් කර ඇති සොයා ගැනීම් සහ නිර්දේශ මගින් බන්ධනාගාර පද්ධතිය පිළිබඳ දැනට පවතින දැනුම වර්ධනය කිරීම සහ ඒ පිළිබඳ පොදු අවබෝධය පුළුල් කිරීමත්, දැනට ක්‍රියාත්මක වන ව්‍යුහාත්මක, නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවල පවතින දුර්වලතා සහ අඩුපාඩු හඳුනාගැනීමත් අපේක්ෂා කර ඇත.

එකී අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් ප්‍රධාන ගැටලු කිහිපයක් පහතින් දක්වා ඇත.

1. **බන්ධනාගාර තුළ පවතින අධික තදබදය හේතුවෙන් රැඳවියන් හට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.**
2. **බන්ධනාගාර තුළ සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.**
3. **රැඳවියන් පුනුරුත්ථාපනය සඳහා යොමු නොකිරීම.**

බන්ධනාගාරගත වන සිරකරුවන් සංඛ්‍යාව අවම කරමින්, පුනරුත්ථාපන ක්‍රියාවලිය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරන්නේ නම් සහ ප්‍රමාණවත් ලෙස සම්පත් සම්පාදනය කරන්නේ නම්, බන්ධනාගාර පද්ධතියට අපේක්ෂිත අන්තර්ජාතික ප්‍රමිතීන් හා මානව හිමිකම් මට්ටම් කරා ළඟා විය හැකි බව මෙම අධ්‍යයනය මගින් වැඩිදුරටත් පෙන්වා දී ඇත.

එසේම, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද 2021-2025 උපක්‍රමික සැලසුම වන **"සුරක්ෂිත සමාජයක් උදෙසා හිමිකම් මත පදනම් වූ ප්‍රතිශෝධන ක්‍රමවේදයක්"** යන්න මෙහෙයවීම පදනම කරගනිමින්, ඉහත කී අධ්‍යයනයෙන් අනතුරුව නිකුත් කරන ලද නිර්දේශයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කරනු ඇතැයි කොමිෂන් සභාව අපේක්ෂා කර ඇත.

මෙම අධ්‍යයනය මඟින් වැඩිදුරටත් අනාවරණය කරගෙන ඇත්තේ, බන්ධනාගාරගත රැඳවියන් හට ලැබෙන පහසුකම් අවම මට්ටමක පවතින බවයි. සෞඛ්‍ය පහසුකම් සහ පුනරුත්ථාපන අවස්ථා ද ඇතුළුව බන්ධනාගාරගත රැඳවියෙකුට අනිවාර්යයෙන්ම හිමි විය යුතු මූලික පහසුකම් ප්‍රමාණවත් පරිදි නොලැබෙන බවත්, බන්ධනාගාරවල රඳවා ගැනීමට හැකියාව පවතින ධාරිතාව ඉක්මවා රැඳවියන් රඳවා තිබීම මෙයට හේතුව බවත් එකී අධ්‍යයනය මඟින් හඳුනාගෙන ඇත.

එසේම, බන්ධනාගාරයන්හි පවතින නිලධාරී හිඟය හේතුවෙන් දැනට සේවයේ නියුතු බන්ධනාගාර නිලධාරීන් දැඩි ලෙස වෙහෙසටපත්ව, වෘත්තීයමය අසංතෘප්තතාවයෙන් සහ මානසික පීඩනයෙන් යුතුව කටයුතු කරන බවත්, ඒ හේතුවෙන් දෛනිකව එල්ල වන අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීමේ හැකියාව අවම මට්ටමක පවතින බවත්, ඔවුන්ගේ රාජකාරියේ පවතින අසීරු මෙන්ම අවදානම් සහිත ස්වභාවයට සරිලන වැටුපක් නොලැබෙන බවත් එකී අධ්‍යයනය මගින් අනාවරණය කරගෙන ඇත.

එසේම, බන්ධනාගාරගතව සිටින මරණ දඬුවමට ලක්වූවන්, කාන්තාවන්, තරුණ වරදකරුවන්, විදේශිකයන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින්නන් සහ ආබාධ සහිත සිරකරුවන් වැනි විශේෂ ගණයේ බන්ධනාගාරගත වූවන්, අනෙකුත් රැඳවියන්ට සාපේක්ෂව දැඩි අවදානම් සහගත තත්ත්වයක පසුවන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, නව ප්‍රතිපත්ති සම්පාදනයේදී ඔවුන් මුහුණ දෙන මෙම සුවිශේෂී අභියෝග පිළිබඳව අවධානය යොමු කිරීම තුළින්, ඔවුනට ද පුනරුත්ථාපනය සඳහා සමාන අවස්ථාවන් සැලසිය යුතු බව මෙම අධ්‍යයනය මඟින් අවධාරණය කර ඇත.

තවද, නඩු විභාගයට පෙර කාලසීමාව තුළ දීර්ඝකාලීනව රැඳවියන් බන්ධනාගාර තුළ රඳවා තබා ගැනීමට තුඩුදෙන ආකාරයේ විවිධ ගැටලුකාරී තත්ත්වයන් අධිකරණ ක්‍රියාවලිය තුළ පවතින බවත්, එමඟින් බන්ධනාගාර තුළ දැඩි තදබදයක් නිර්මාණය වන බවත් පෙන්වා දී ඇත. ඇප නියම කිරීමේ ක්‍රමවේදයේ පවතින ගැටලු, නීතිපති දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතනවල පවතින පරිපාලනමය අකාර්යක්ෂමතාවන්, නීතිමය සහාය ලබාදීමේ පවතින දුර්වලතා මෙන්ම සිරගත කිරීමට විකල්ප ලෙස භාවිත කළ හැකි වෙනත් ක්‍රමවේද භාවිත කිරීමේ පවතින මන්දගාමීත්වය ආදී සියලු කරුණු විශාල සිරකරුවන් සංඛ්‍යාවක් දීර්ඝකාලීනව බන්ධනාගාර තුළ රැඳී සිටීමට හේතු වන බව එකී අධ්‍යයනය මගින් පැහැදිලිවම පෙන්වා දී ඇත.

තවද මෙම අධ්‍යයනය තුළින් බන්ධනාගාර තුළ සිදුවන මරණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණයන් කොමිෂන් සභාව නිර්දේශ කර තිබුණු අතර මීගමුව බන්ධනාගාර සිදුවීමෙන් පසුව 2026.07.08 වන දින වැඩ බලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලද ලිපිය මඟින් ද පහත සඳහන් නිර්දේශ සම්බන්ධයෙන් සිහිකැඳවීමක් කර ඇත.

- සිරගත කිරීමට පෙර වධහිංසාවන්ට ලක්වීම පිළිබඳ පැමිණිලි කරන සිරකරුවන් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිටීම සහ ඔවුන් අධිකරණ වෛද්‍ය නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම සහ එකී හිංසාවන්ට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම, ඒ මගින් එවැනි ප්‍රචණ්ඩත්වයෙන් සිදුවන මරණ වළක්වා ගැනීම.
- ප්‍රතිවාදී සිරකරුවන් අතර ඇතිවන හිංසනයන් අවම කිරීමෙන් සහ සිරකරුවන්ට කරන තර්ජන හේතුවෙන් වාට්ටු වෙනස් කිරීම සඳහා ඉල්ලා සිටියහොත් ඒ සඳහා පරීක්ෂා කර අවසර දීමෙන් රැඳවියන් අතර ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පියවර ගැනීම හා එවැනි පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම.
- අපරාධ චක්‍රලේඛ 19/2014 (IG චක්‍රලේඛ 2508/2014) අනුව බන්ධනාගාරයට රහස්‍ය වාතාවක් මගින් ලබා දෙන සිරකරුගේ පසුබිම පිළිබඳ තොරතුරු පිළිපැදීමෙන් අනෙකුත් සංවිධානාත්මක අපරාධ කල්ලිවල සහ ප්‍රතිවාදීන්ගේ සාමාජිකත්වය ඇතුළුව සිරකරුවන් ඵලදායී ලෙස වෙන් කර ඇති බව සහතික කිරීම.
- 1956 දෙපාර්තමේන්තු ස්ථාවර නියෝගවල 15 වන වගන්තියට අනුව, අයුතු සැලකිලි, පහරදීම් හෝ වෙනත් අක්‍රමිකතා සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම සඳහා බලය සහ සීමා කිරීමේ උපකරණය භාවිතා කිරීම පිළිබඳ නීතිමය සීමාවන් පිළිබඳව බන්ධනාගාර නිලධාරින් හා බන්ධනාගාර අධිකාරි දැනුවත් කිරීම.
- ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මරණයක් සිදු වුවහොත් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා මියගිය අයගේ වාට්ටු මාරු කිරීමේ වාර්තා පවත්වා ගැනීම.

මීගමුව බන්ධනාගාරය තුළ 2026.07.05 සහ 06 දිනවල ඇති වූ ප්‍රචණ්ඩකාරී තත්ත්වය සහ ඉන් අනතුරුව රැඳවියන්ට මුහුණ දීමට සිදු වූ සිදුවීම් හුදෙකලා සිදුවීම් නොවන බවත්, ඒවා මෙරට බන්ධනාගාර පද්ධතිය තුළ කාලාන්තරයක් තිස්සේ පවතින ගැටලු වල ප්‍රතිඵලයක් බවත් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 2018 වසරේදී සිදු කරන ලද දීප ව්‍යාප්ත බන්ධනාගාර අධ්‍යයන වාර්තාවේ (Prison Study by HRCSL) අන්තර්ගත කරුණු වත්මන් සිදුවීම විග්‍රහ කිරීමේදී අතිශයින් වැදගත් වේ.

2018 වාර්තාව මඟින් පෙන්වා දුන් පරිදි, ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතියේ පවතින ප්‍රධානතම ගැටලුව වන්නේ රඳවා තැබිය හැකි ධාරිතාව ඉක්මවා රැඳවියන් රඳවා තැබීමයි. මෙම අධික තදබදය හේතුවෙන්, රැඳවියන් අතර නිරන්තරයෙන් ගැටුම් ඇති වීමට අවශ්‍ය මානසික පීඩනය නිර්මාණය වේ. මීගමුව බන්ධනාගාරය වැනි ආයතනවල පාලනය බලධාරීන්ගෙන් ගිලිහී, "කාමර පාටි" වැනි රැඳවියන්

සතු වීමට මෙකී අධික තදබදය සහ නිලධාරී හිඟය සෘජුවම බලපාන බව 2018 අධ්‍යයනයේදී පෙන්වා දී ඇත.

කොමිෂන් සභාවේ පෙර වාර්තාවල හඳුන්වා දී ඇති පරිදි බන්ධනාගාරය තුළ විනය පාලනය සඳහා බන්ධනාගාර නිලධාරීන් විසින් ශාරීරික හිංසනය මූලික මෙවලමක් ලෙස භාවිත කිරීමේ සංස්කෘතියක් පවතී. බන්ධනාගාරයකට අලුතින් ඇතුළත් වන රැඳවියන්ට පහරදීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදයක් පවතින බව 2018 වාර්තාව අනාවරණය කර ඇත. කලහකාරී තත්ත්වයන් පාලනය කිරීමේදී අවම බලය භාවිත කිරීම වෙනුවට ප්‍රචණ්ඩත්වය සහ ජීව උණ්ඩ භාවිත කිරීම දක්වා නිලධාරීන් යොමු වීමට, ඔවුන්ට ප්‍රචණ්ඩත්වයෙන් තොර පාලන ක්‍රමවේද පිළිබඳ විධිමත් පුහුණුවක් නොමැති වීම හේතු වන බව පෙර වාර්තාව මගින් පෙන්වා දී ඇත.

මීගමුව බන්ධනාගාරය තුළ රැඳවියන් රෝහල බිඳ දමා ඖෂධ ලබා ගැනීමේ සිදුවීම තුළින් පෙනී යන්නේ බන්ධනාගාර තුළ ඖෂධ සහ මත්ද්‍රව්‍ය පාලනය පිළිබඳ පවතින දුර්වලතාවයයි. 2018 අධ්‍යයනයේදී ද බන්ධනාගාර රෝහල්වල පවතින සීමිත පහසුකම්, නිසි වෛද්‍ය පරීක්ෂණ නොමැති වීම සහ ඖෂධ ගබඩා කිරීමේ පවතින අවදානම් සහගත තත්ත්වය පෙන්වා දී තිබේ.

බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවියන්ට සිදු කරනු ලබන වධහිංසා සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව විනයානුකූල හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීම අවම මට්ටමක පවතින බව කොමිෂන් සභාවේ පෙර නිරීක්ෂණයකි. මේ හේතුවෙන් නිලධාරීන් නීතිය අතට ගෙන රැඳවියන්ට අමානුෂික ලෙස සැලකීමට පෙළඹෙන බවත් පෙන්වා දී ඇත. 2018 අධ්‍යයනය මගින් පෙන්වා දුන්නේ රැඳවියන්ගේ නඩු වාර්තා සහ ලිපිගොනු පවත්වාගෙන යාමේ පවතින අකාර්යක්ෂමතාව ඔවුන්ගේ නිදහස අහිමි වීමට හේතු වන බවයි. වත්මන් සිද්ධියේදී ද මීගමුව බන්ධනාගාරයෙන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කළ රැඳවියන්ගේ ඇප නියෝග සහ නඩු දින පිළිබඳ තොරතුරු අදාළ බන්ධනාගාර වෙත නිසි පරිදි නොයැවීම තුළින් තහවුරු වන්නේ 2018 වසරේදී පෙන්වා දුන් එම පරිපාලනමය දුර්වලතාවය වසර ගණනාවකට පසුවත් තවදුරටත් නොවෙනස්ව පවතින බවයි.

සිරකරුවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් හෙවත් “නෙල්සන් මැන්ඩෙලා රීති” ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ ක්‍රියාත්මක නොවන බව 2018 අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීමක් විය. මීගමුව බන්ධනාගාරයේදී සිදුවූ මනුෂ්‍ය ඝාතන, බලය භාවිතය සහ මාරු කිරීමේදී සිදු වූ බවට වාර්තා වී ඇති අමානුෂික සැලකිලි මඟින් මෙම ජාත්‍යන්තර ප්‍රමිතීන් උල්ලංඝනය වී ඇත්ද යන්න තවදුරටත් විමර්ශනය කළ යුතුව ඇත.

## 11. **නිරීක්ෂණ**

2026.07.05 සහ 2026.07.06 දින වලදී මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද විමර්ශනයේදී කොමිෂන් සභාව විසින් නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එකී ප්‍රකාශ අනුව පෙනී

යන්නේ 2026.07.05 වන දින රඳවියන් හට දිවා ආහාරය ලබා දෙන අවස්ථාවේදී වාට්ටු අංක 2හි රඳවා සිටි රඳවියන් අතර ගැටුමක් හටගෙන ඇති බවත්, එහිදී බන්ධනාගාර නිලධාරීන් හට සහය දක්වන රඳවියන් හට වෙනත් රඳවියන් පිරිසක් විසින් පහර දී ඇති බවත්, ඉන් පසුව වාට්ටු අංක 2හි රඳවියන් පමණක් නොව අනෙකුත් වාට්ටු වල රඳවියන් ද මෙම ගැටුමට සම්බන්ධ වී ඇති බවත් ය. එහිදී බන්ධනාගාර නිලධාරීන් හට පරිපාලන කටයුතු සඳහා සහය දක්වන රඳවියන් සොය සොයා අනෙක් රඳවියන් විසින් පහර දී ඇති බවත්, ඒ තුළින් විශාල ගැටුම්කාරී තත්ත්වයක් බන්ධනාගාරය තුළ නිර්මාණය වී ඇති බවත් අනාවරණය වී ඇත. 2026.07.05 වන දින ඇති එකී සිදුවීම හේතුවෙන් **ඩබ්. නිලංක දුල්ෂාන් (සිර/සැක අංක 4644)** සහ **ගනේගොඩ ආරච්චිගේ ගයාන් සම්පත් (සිර/සැක අංක 1632)** යන රඳවියන් දෙදෙනා මියගොස් ඇති අතර, තවත් රඳවියන් තුවාල ලබා මීගමුව දිස්ත්‍රික් රෝහල වෙත ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ඇත.

මෙහිදී අදාළ ගැටුම හටගෙන ඇත්තේ බන්ධනාගාර නිලධාරීන් හට පරිපාලන කටයුතු සඳහා සහාය දක්වන රඳවියන් හට අනෙක් රඳවියන් විසින් පහර දීම හේතුවෙනි. මෙලෙස බන්ධනාගාර නිලධාරීන් හට පරිපාලන කටයුතු සඳහා සහාය දක්වන රඳවියන්, බන්ධනාගාරය තුළ හඳුන්වනු ලබන්නේ ‘පාටි’ යනුවෙන් බව ද අනාවරණය වේ. බන්ධනාගාරයේ සිටින රඳවියන් අතරින් යහපත් හැසිරීම් රටාවක් සහිත, නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකි රඳවියන්, ‘පාටි’ ලෙස තෝරාගෙන පරිපාලන කටයුතු වලදී ඔවුන්ගේ සහය ලබාගන්නා බවත්, මෙලෙස යොදා ගැනීමට හේතුවක් වී ඇත්තේ බන්ධනාගාර තුළ සිටින නිලධාරීන් සංඛ්‍යාව අදාළ පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම බවත් කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ. මෙය මීගමුව බන්ධනාගාරයට පමණක් අදාළ වූවක් නොවන අතර, සෑම බන්ධනාගාරයකම ‘පාටි’ ලෙස තෝරාගෙන රඳවියන්ගේ සහය ලබා ගැනීම සිදුවන බව ද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. ඒ අනුව මේ වන විට බන්ධනාගාර තුළ ඒවායෙහි ධාරිතාවය ඉක්මවා රඳවියන් රඳවා සිටීමත්, ඊට සාපේක්ෂව සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් ‘පාටි’ යනුවෙන් නම් කරනු ලැබූ රඳවියන්ගේ සහය ලබාගැනීම සහ බන්ධනාගාර තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා පිළිබඳ තොරතුරු ඔවුන් විසින් ලබාදීම තුළින් රඳවියන් අතර, නිලධාරීන් හට සහය දක්වන සහ එලෙස සහය නොදක්වන රඳවියන් ලෙස විභේදනයක් හටගෙන ඇති බවත්, එකී තත්ත්වය ඉහත කී ගැටුමට මුල් වී ඇති බවත් නිරීක්ෂණය වේ. එබැවින් බන්ධනාගාරය තුළ ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් සේවයේ යොදවන්නේ නම් එකී නිලධාරීන් හට රඳවියන්ගේ සහය ලබාගැනීමට අවශ්‍ය නොවන අතර, එසේ වූ විට රඳවියන් අතර එවැනි භේදයක් ඇති වීමට ඇති ඉඩකඩ අවම වන බවත් නිරීක්ෂණය වේ.

එසේම, 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ රඳවියන් අතර ඇති වූ ඉහත කී ගැටුම අතරතුර රඳවියන් විසින් බන්ධනාගාරයේ පවතින ගොඩනැගිලි වලට හානි සිදු කර ඇති බව පැහැදිලි වන අතර, රඳවියන් පරීක්ෂා කිරීමේදී නිලධාරීන් විසින් සොයා ගනු ලබන මත්ද්‍රව්‍ය බන්ධනාගාරයේ විනය අංශය තුළ ගබඩා කර තබා ඇති බවත්, ගැටුම අතරතුර රඳවියන් විසින් එකී විනය අංශය කඩා බිඳ දමා එහි තිබූ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවත් අනාවරණය වී ඇත. එසේම, බන්ධනාගාර රෝහලේ ඖෂධ

ගබඩාව ද කඩා බිඳ දමා එහි තිබූ ඖෂධ රැඳවියන් විසින් අධිමාත්‍රාවන්ගෙන් පානය කර ඇති බව ද අනාවරණය වී ඇත. මෙලෙස මත්ද්‍රව්‍ය සහ ඖෂධ පානය කිරීම හේතුවෙන් රැඳවියන් ප්‍රකෘති සිහියෙන් නොසිටි බවත්, ඔවුන් තමන් කරන කියන දේ පිළිබඳව මනා අවබෝධයකින් තොරව මත්ව සිටි බවත්, මෙවැනි විශාල ගැටුමක් නිර්මාණය වීමට මූලික හේතුව එලෙස මත් වී සිටීම බවද නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ. මෙහිදී විනය අංශය, ඖෂධ ගබඩාව වැනි ඒකක බන්ධනාගාර පරිශ්‍රය තුළ රැඳවියන් හට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානවල පිහිටා තිබීම හේතුවෙන් ඔවුන් ඒවාට පිවිස ඇති බව පෙනී යන අතර, ඒ අනුව එකී අංශ ස්ථාපිත කිරීමේදී ඒවයෙහි ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් සැලකිලිමත් විය යුතු බව ද පෙනෙයි.

එසේම, 2026.07.05 වන දින ප.ව. 5ට පමණ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ) ඇතුළු උසස් නිලධාරීන් මීගමුව බන්ධනාගාරය වෙත පැමිණ රැඳවියන් සමඟ සාකච්ඡා කර ඇති බවද, එහිදී රැඳවියන් විසින් විවිධ ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, කෙසේවෙතත් එකී සාකච්ඡාවන් සාර්ථක වී නොමැති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ) ඇතුළු නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ. රැඳවියන් විසින් බන්ධනාගාර පරිශ්‍රය තුළ යකඩ ගේට්ටුවෙන් ඇතුලත තිබූ ගොඩනැගිලි වලට හානි කර තිබූ බව ද, එසේ හෙයින් බන්ධනාගාරයට ප්‍රවේශ වන ලී දොර සහ යකඩ ගේට්ටුව අතර ස්ථාපිතව තිබූ අවි ගබඩාවේ ආරක්ෂාව සඳහා එහි තිබූ සියලුම අවි වැඩබලන ප්‍රධාන ජේලර් ඒ.ඩී.සී. පෙරේරා මහතාගේ උපදෙස් මත අවි ගබඩාවෙන් ඉවත් කර නිලධාරී විවේකාගාරයට රැගෙන ගිය බව ද අනාවරණය වන අතර, අවි ගබඩාවේ ටී-58 තුවක්කු 16ක්, මිලිමීටර් 9 පිස්තෝල 6ක්, මිලිමීටර් 3.8 පිස්තෝලයක්, රිපීටර් ගිනි අවියක්, රබර් උණ්ඩ අවි 2ක් සහ උණ්ඩ 955ක් තිබූ බවත්, තවත් ටී-56 ගිනි අවි 4ක් අවි අට්ටාලවලට නිකුත් කර තිබූ බවත්, ටී-56 ගිනි අවියකට මැගසින් දෙකකට උණ්ඩ 60ක් සහ ටී-58 ගිනි අවියකට උණ්ඩ 28 බැගින් නිකුත් කර තිබූ බවත් 2026.07.05 වන දින අවි ගබඩාව භාරව කටයුතු කළ ජේලර් ඔස්කාර් මහතා ප්‍රකාශ කර ඇත. එලෙස දෛනික භාවිතය සඳහා යොදාගන්නා අවි සියල්ල ඉවත් කරගනු ලැබූ බවත්, අවි ගබඩා තුළ තවත් පැරණි පෙට්ටි සහ කබඩ් තිබූ බවත්, ඒවා ප්‍රධාන ජෙලර්වරයා භාරයේ පවතින බවත්, ඒවායෙහි පැරණි අවි තිබී ඇති බව පසුව දැනගත් බවත් අදාළ නිලධාරීන් විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

තවද, 2026.07.05 වන දින ඇති වූ සිදුවීමෙන් පසුව මීගමුව බන්ධනාගාරයේ ආරක්ෂාව සඳහා වෙනත් බන්ධනාගාරවල නිලධාරීන්, මීගමුව කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතාගේ මෙහෙයවීම යටතේ එම කොට්ඨාශයේ පොලිස් ස්ථාන 12ක පොලිස් නිලධාරීන්, කැරලි මර්ධන ඒකක නිලධාරීන්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සහ බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් කැඳවා ඇති බවත්, ඔවුන් 2026.07.05 වන දින දහවල් කාලයේ සිට බන්ධනාගාරයෙන් පිටත රැඳී සිට ඇති බවත් කොමිෂන් සභාව සිදු කළ විමර්ශනයේ දී අනාවරණය වී ඇත.

ඉහත කී ලෙස 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් ඉහත කී ආකාරයේ ගැටුමක් නිර්මාණය වී ඔවුන් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණ ද 2026.07.06 වන දින උදෑසන මීගමුව බන්ධනාගාරයේ සාමකාමී වාතාවරණයක් පැවති බව බන්ධනාගාර, ශ්‍රී ලංකා පොලිස් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගෙන් සහ රැඳවියන් ගෙන් කොමිෂන් සභාව විසින් සටහන් කරගෙන ඇති ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව නිලධාරීන් විසින් රැඳවියන් හට උදෑසන ආහාරපාන ලබාදී ඔවුන්ව වාට්ටු තුළට යැවීමට කටයුතු කර ඇති නමුත්, එකී වාට්ටුවල අගුලු පෙර දින රැඳවියන් විසින් කඩා දමා තිබූ බැවින් වාට්ටු අගුලු දැමීමට හැකියාවක් නොතිබූ බව ද එකී ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත. මෙලෙස නිලධාරීන් විසින් උදෑසන ආහාරය බෙදාදෙන අතරතුර එදින එනම්, 2026.07.06 වන දින 9.30ට පමණ නැවතත් බන්ධනාගාරය තුළ කලබලකාරී වාතාවරණයක් උද්ගත වී ඇත. එම අවස්ථාවේ බන්ධනාගාරය තුළ රැදී සිට ඇති නිලධාරීන්ගේ ප්‍රකාශ අනුව රැඳවියන් විසින් පහර දීම හේතුවෙන් රුධිරය ගලමින් සිටි රැඳවියෙකු බන්ධනාගාර නිලධාරීන් දෙදෙනෙකු විසින් බේරාගෙන රැගෙනවිත් ඇති අතර, ඒ පිටුපසින් රැඳවියන් විශාල පිරිසක් පොලු, ගල් ආදිය රැගෙන පැමිණ ඇති අතර, එලෙස පැමිණි රැඳවියන් විශාල පිරිසක් පොලු, ගල් ආදිය රැගෙනවිත් නිලධාරීන් හට පහර දී ඇත. කෙසේවෙතත් ඇතැම් රැඳවියන් විසින් සඳහන් කර ඇත්තේ, 2026.07.06 වන දින උදෑසන මීගමුව බන්ධනාගාරය වෙත පැමිණි බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් රැඳවියන් හට පහර දුන් බවත්, ඒ අවස්ථාවේදී රැඳවියන් විසින් ද නිලධාරීන් හට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් විශාල ගැටුමක් නිර්මාණය වූ බවත් ය. ඒ අනුව එකිනෙක වෙනස් කරුණු ඉදිරිපත් වී ඇති නමුත්, 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරය තුළ නැවත ගැටුමක් නිර්මාණය වීමට හේතුව කුමක්ද යන්න තහවුරු වන ආකාරයේ නිශ්චිත සාක්ෂි ඉදිරිපත් වී නොමැත.

2026.07.06 වන දින උදෑසන 9.30ට පමණ මීගමුව බන්ධනාගාරය තුළ නැවත කලහකාරී වාතාවරණයක් උද්ගත වී ඇති බවත්, එහිදී නිලධාරීන් හා රැඳවියන් අතරත්, රැඳවියන් හා රැඳවියන් අතරත් පහර දීම් සිදුව ඇති බවත් අනාවරණය වේ. 2026.07.05 වන දින රැඳවියන් මීගමුව බන්ධනාගාරයේ යකඩ ගේට්ටුව අසලට පමණක් පැමිණ තිබුණ ද, 2026.07.06 වන දින යකඩ ගේට්ටුව කඩා දමා ඊට ඉදිරියෙන් ඇති ලී දොර දක්වා රැඳවියන් පැමිණ නිලධාරීන්ට පහර දී ඇති බව අනාවරණය වන අතර, මේ හේතුවෙන් බන්ධනාගාරය තුළ සිටි නිලධාරීන් බොහෝ දෙනෙක් ආරක්ෂාව සඳහා ලී දොරෙන් පිටතට ගොස් ඇති බව ද පෙනී යයි. එසේවුවද, නිලධාරීන් පිරිසක් බන්ධනාගාරය තුළ සිර වී සිට ඇති බවද අනාවරණය වේ.

මීගමුව බන්ධනාගාරයේ ලී දොර දක්වා පැමිණි රැඳවියන් ලී දොරට පහර දී එය කඩා පිටතට පැමිණීමට උත්සාහ කර ඇති අතර, ලී දොරෙහි ඇති කවුළුවෙන් බටයක් පිටතට දමා දුමක් පිටතට නිකුත් කර ඇති බවත්, ඉන්පසුව ටී 56 ගිනි අවියක හිසක් එම කවුළුවෙන් පිටතට යොමු කර ඇති බවත් නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව අනාවරණය වේ. තවද, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ වීඩියෝ දර්ශන වලින් ද එය නිරීක්ෂණය වේ. එලෙස ටී 56 ගිනි අවියක හිසක් යොමු කිරීමත් සමඟ පිටත රැඳී සිටි නිලධාරීන් හට වෙඩි වැදීමේ අවදානමක් මතු වීම

හේතුවෙන් බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් මුලින් අහසට වෙඩි තබා අනතුරු ඇඟවීම් සිදු කර ඇති අතර, පසුව ලී දොර දෙසටත් ඉන් අනතුරුව ලී දොරෙහි කවුළුවෙන් ඇතුළට ඔහුගේ ගිනි අවිය යොමු කර ඇතුළත බිත්තියෙහි පහළටත් වෙඩි තැබූ බව බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එසේ වෙඩි තැබීමත් සමඟ රැඳවියන් බන්ධනාගාරය තුළට දිව ගොස් ඇති අතර, ලී දොර සහ යකඩ ගේට්ටුව අතර කොටසේ සිටි රැඳවියන් පසුපසට දිව ගිය බව ලී දොරෙහි කවුළුවෙන් පෙනී ගිය බැවින්, පිටත රැඳී සිටි බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන්, විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගොස් ඇති බවත්, ඒ සමඟ බොහෝ රැඳවියන් වාට්ටු තුළට ගොස් ඇති බවත්, තුවාල ලබා සිටි නිලධාරීන් සහ රැඳවියන් රෝහල්ගත කිරීමට නිලධාරීන් කටයුතු කර ඇති බවත් අනාවරණය වේ.

මෙලෙස බන්ධනාගාරය තුළට ගිය විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් රැඳවියන් හට වෙඩි තැබූ බව ඇතැම් රැඳවියන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව පෙනී යයි. එහෙත් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළ සහකාර පොලිස් අධිකාරී නලීන් පෙරේරා මහතා විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ, 2026.07.05 වන දින සහ 2026.07.06 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් පිළිවෙළින් 156 දෙනෙකු සහ 356 දෙනෙකු රාජකාරියට යොදවා තිබුණද ඔවුන් කිසිවෙකු කිසිදු වෙඩි තැබීමක් සිදු කර නොමැති බවත්, මේ වන විට ඔවුන්ගේ සියලුම ගිනි අවි රජයේ රස පරීක්ෂක වෙත යවා ඇති බවත් ය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිමල් පෙරේරා මහතා විසින් ද කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ, කිසිදු පොලිස් නිලධාරියෙකු හෝ කැරලි මර්ධන නිලධාරියෙකු විසින් ද වෙඩි තැබීමක් සිදු කර නොමැති බවයි. මියගිය සහ තුවාල ලැබූ නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ අධිකරණ වෛද්‍ය වාර්තා මෙතෙක් කොමිෂන් සභාව වෙත ලැබී නොමැති බැවින් මරණ සහ තුවාල සිදුව ඇත්තේ කුමන ආකාරයෙන්ද යන්න සහ වෙඩි තැබීම් හේතුවෙන් සිදු වූ මරණ සහ තුවාල තිබේද යන්න නිශ්චිතව තහවුරු කිරීමේ හැකියාවක් නොපවතී.

රැඳවියන් සතුව ගිනි අවි තිබූ බව කොමිෂන් සභාව වෙත ප්‍රකාශ ලබා දුන් ඇතැම් නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත. 2026.07.06 වන දින රැඳවියන් විසින් මීගමුව බන්ධනාගාරයේ අවි ගබඩාවට හානි සිදු කර තිබූ බව අනාවරණය වී ඇත. බන්ධනාගාරයේ දෛනික භාවිතය සඳහා යොදාගන්නා අවි සහ උණ්ඩ සියල්ල 2026.07.05 වන දින සවස අවි ගබඩාවෙන් ඉවත් කර නිල විවේකාගාරය වෙත ගෙන ගිය ද, අවි ගබඩාව තුළ තිබූ එදිනෙදා භාවිතයට නොගන්නා අවි ඉවත් කරගෙන නොමැති බව මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත. කෙසේවෙතත් අවි ගබඩාවේ තිබූ උණ්ඩ සියල්ල 2026.07.05 වන දින ඉවත් කරගෙන තිබූ බව ද මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් සඳහන් කර ඇත. ඒ අනුව සියලුම උණ්ඩ ඉවත් කරගෙන තිබියදී රැඳවියන් හට උණ්ඩ ලබාගත හැකි ක්‍රමවේදයක් පැවතුණේ ද යන්න සම්බන්ධයෙන් සිදු කළ විමසීමේ දී මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර් ජයන්ත කුමාර මහතා විසින් ප්‍රකාශ කර ඇත්තේ, ප්‍රධාන මුර අට්ටාලයේ සිටි නිලධාරීන් දෙදෙනා විසින් ඔවුන් භාරයේ

පැවති ජීව උණ්ඩ පිරවූ මැගසින් දෙක එම අට්ටාලයේ අතහැර පැමිණ ඇති බව පසුව දැනගත් බවයි. ඒ බව මුර අට්ටාලයේ රාජකාරී කළ නිලධාරීන් විසින් ද කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එහෙත් වෙඩි තැබීම් සිදු වී ඇත්තේ කුමන අවි වලින් ද යන්න නිශ්චිතව ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොමැත.

2026.07.06 වන දින උදෑසන මීගමුව බන්ධනාගාරය තුළ ගැටුම්කාරී තත්ත්වය උද්ගත වීමට පෙර බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගොස් ඇත. එකී බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන්ගේ ප්‍රකාශ අනුව ඔවුන් බන්ධනාගාරය තුළට ගොස් ඇත්තේ, 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරය තුළ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් සිදු වූ හානිය තක්සේරු කිරීමේ කටයුතු සඳහා පැමිණි කාන්තාවක් ඇතුළු නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා ය. එකී කාන්තා නිලධාරිනිය ඇදගෙන යාමට රැඳවියන් උත්සාහ කළ බවත්, මහත් පරිශ්‍රමයක් දරා ඇයව බන්ධනාගාරයෙන් පිටතට ගත් බවත් දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්.එම්.ඊ.එම්. රත්නායක නිලධාරියා කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. මෙහිදී 2026.07.05 වන දින රැඳවියන් විසින් බන්ධනාගාරයේ ගොඩනැගිලි වලට හානි කර තිබූ බැවින් එකී හානිය තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් 2026.07.06 වන දින උදෑසන බන්ධනාගාරය තුළ සාමකාමී වාතාවරණයක් පැවතුන බව සඳහන් වුවද රැඳවියන් එහා මෙහා ඇවිදිමින් සිට ඇති අතර, ඔවුන්ව වාට්ටු වලට යොමු කළද ඒවා වසා දැමීමට ඇඟුළු තිබී නැත. එසේම, මත්ද්‍රව්‍ය සහ ඖෂධ වර්ග අධි මාත්‍රාවන්ගෙන් පානය කළ රැඳවියන් සිහිමදභාවයෙන් තැනින් තැන සිටි බව ද ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව බන්ධනාගාරය තුළ අන් දිනවලට වඩා වෙනස් වාතාවරණයක් පැවතී ඇති බව ප්‍රකාශ මගින් පැහැදිලි වන බැවින් නිලධාරීන් බන්ධනාගාරය තුළට යැවීමට පෙර එහි ඇතුළත තත්ත්වය සම්බන්ධයෙන් තවදුරටත් නිරීක්ෂණය කර අවබෝධයක් ලබාගත හැකිව තිබූ බව පෙනී යයි.

එසේම, එකී නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා බන්ධනාගාරය තුළට ගිය බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් ආරක්ෂක හිස් වැසුම් පැළඳ සිට ඇති අතර, ඔවුන් අත තිබී ඇත්තේ බැටන් පොලු සහ පලිහන් පමණි. බන්ධනාගාරය තුළට යන විට අවි ආයුධ රැගෙන යා නොහැකි බැවින් එලෙස ගොස් ඇති බව අනාවරණය වේ. එහෙත් බන්ධනාගාරයේ රැඳවියන් ප්‍රමාණය ධාරිතාවය ඉක්මවා සිටියදී සහ නිලධාරීන් ඉතාමත් අවම ප්‍රමාණයක් සිටියදී මෙවැනි හදිසි කලහකාරී තත්වයක් ඇති වූ අවස්ථාවකදී සියලු දෙනාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තවදුරටත් සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය වන බව නිරීක්ෂණය වේ. එසේම, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් බන්ධනාගාරය තුළට ගොස් ඇත්තේ බන්ධනාගාරයේ රැඳවියන්ගේ තත්තවය නිසි අයුරින් අවබෝධ කරගැනීමකින් තොරව ද යන ගැටලුව කොමිෂන් සභාව වෙත මතු වේ.

2026.07.06 වන දින සිදුවීමෙන් පසුව බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් දස දෙනෙකු මිය ගොස් ඇත. මෙම සිදුවීමෙන් මිය ගිය සියලුම නිලධාරීන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර

උපක්‍රමික බලකායට අනුයුක්ත නිලධාරීන් වන අතර, පහත නම් සඳහන් නිලධාරීන් හට එලෙස දිවි අහිමි වී ඇත.

1. පළමු පෙළ ජේලර් එස්.එච්.ජී. චන්ද්‍රවංශ
2. සැරයන් ඩී.ඩබ්. පුෂ්පකුමාර
3. සැරයන් ආර්.පී.ආර්. සංජීව
4. සැරයන් ටී.එන්.ආර්. තිලකසිරි
5. සැරයන් එස්.ඩී.එස්. අබේවර්ධන
6. සැරයන් බී.එන්.එන්. තරංග
7. සැරයන් ඒ.ඩී. තරංග
8. සැරයන් එම්. ගමගේ උපාලි
9. සැරයන් ආර්.පී. මධුසර
10. සැරයන් පී.ඩී.එස්.එල්. ගුණවර්ධන

මීට අමතරව බන්ධනාගාර නිලධාරීන් තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇත. එම නිලධාරීන් අතර බන්ධනාගාර මූලස්ථානයේ නිලධාරීන් 12 දෙනෙකු ද, මීගමුව බන්ධනාගාරයේ නිලධාරීන් 5 දෙනෙකු ද, වාරියපොළ බන්ධනාගාරයේ එක් නිලධාරියෙකු ද, දළුපොත බන්ධනාගාරයේ එක් නිලධාරියෙකු වශයෙන් නිලධාරීන් 17 දෙනෙකු සිටින බව පෙනී යයි. වාරියපොළ බන්ධනාගාරයේ දෙවන පෙළ ජෙලර් ජේ. ජී. අමුණුගම, දළුපොත බන්ධනාගාරයේ පළමු පෙළ ජේලර් ආර්.එම්.ට්.එම්. රත්නායක සහ මීගමුව බන්ධනාගාරයේ නියාමක ජේ. ඩී. සම්පත් ද සිල්වා යන නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව ඔවුන් රැඳවියන්ගේ පහරදීම් වලට ලක්ව ඇති බවත්, එම ස්ථානයේ සිටි ඔවුන්ව හඳුනන රැඳවියන් විසින් ඔවුන්ව පහරදීම් වලින් බේරාගෙන ලී දොරෙන් පිටතට යැවූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව සිදුවීම වූ අවස්ථාවේදී නිලධාරීන් හට පහර දුන් රැඳවියන් සේම දිවි බේරාගැනීමට සහය දැක්වූ රැඳවියන් ද සිට ඇති බව පෙනී යයි.

2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ පහත නම් සඳහන් රැඳවියන් විසිදෙදෙනෙකු ද මියගොස් ඇති බව ලේඛන අනුව නිරීක්ෂණය වේ.

1. සිර/සැක අංකය 4644 - ඩබ්.නිලංක දුල්ෂාන්
2. සිර/සැක අංකය 1632 - ගනේගොඩ ආරච්චිගේ ගයාන් සම්පත්
3. සිර/සැක අංකය 7450 - මොහොමඩ් නිසාම් මොහොමඩ් පස්ලාම්
4. සිර/සැක අංකය 3851- එම්.එම්. ඉෂාර කසුන් කුමාර
5. සිර/සැක අංකය 5128 - ජේ.ඩබ්. එස්. කුමාර වික්‍රමරත්න
6. සිර/සැක අංකය 4294 - එම්.එල්.මොහොමඩ් උස්මාන්
7. සිර/සැක අංකය 2596 - ඩබ්.බී.සඳුන් ලසන්ත
8. සිර/සැක අංකය 1084 - එම්.ජනිත් හංසක ප්‍රනාන්දු

9. සිර/සැක අංකය 2019 - ඒ. එම්. සංජීව මධුසංක
10. සිර/සැක අංකය 2594 - ආර්.විරාජ් ප්‍රසන්න
11. සිර/සැක අංකය 3057 - පී. ඉසුරු දිල්ෂාන්
12. සිර/සැක අංකය 3329 - එස්. සුරේෂ් ජයලත් සිල්වා
13. සිර/සැක අංකය 508 - ජී.ගයාන් මධුසංක සිල්වා
14. සිර/සැක අංකය 6495 - ඒ.ඩබ්.සමන් සංජීව
15. සිර/සැක අංකය 1377 - උන්නිතන් සරත් චන්ද්‍රන් (ඉන්දියානු ජාතිකයෙකි)
16. සිර/සැක අංකය 3609 - මල්ලව ආරච්චිගේ සුරේෂ් හේමන්ත
17. සිර/සැක අංකය 1563 - එස්.එම්.තුසිත සූරියබණ්ඩාර
18. සිර/සැක අංකය 3662 - එම්.ගයාන් මදුසංක
19. සිර/සැක අංකය 8274 - මංගමුනිගේ සම්පත් පුෂ්පකුමාර
20. සිර/සැක අංකය 3485 - එස්.ඩී ධනිදු අශ්මික
21. සිර/සැක අංකය 5622 - ටී. හර්ෂ ප්‍රියංකර
22. සිර/සැක අංකය 4563 - මිහිඳුකුලසූරිය සංජු දිල්රුක්

මීට අමතරව මීගමුව බන්ධනාගාරයේ සිට බූස්ස බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන් අතරින් 2026.07.07 වන දින පෙ.ව. 4.30ට පමණ බූස්ස බන්ධනාගාරය වෙත පැමිණි ජයසූරිය කරුණාගේ නිශාන් බුද්ධික පෙරේරා (සැක අංක 3470) යන රැඳවියා බූස්ස බන්ධනාගාරයේ E2 වාට්ටුවට ඇතුළත් කර ඇත. එදින එනම්, 2026.07.07 වන දින ප.ව. 6.30ට පමණ වාට්ටු වැසීමෙන් පසුව එකී රැඳවියා හට ඇති වූ අසනීප තත්ත්වයක් හේතුවෙන් ඔහුව එදිනම එනම්, 2026.07.07 වන දින ප.ව. 8.10ට පමණ ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ගෙන ගොස් ඇති බව බන්ධනාගාර වාර්තා අනුව පෙනී යයි. රෝහලෙහි ප්‍රතිකාර ලබමින් සිටියදී ඔහු එදිනම එනම්, 2026.07.07 වන දින ප.ව. 8.40ට පමණ මිය ගොස් ඇති බවත්, ඔහුගේ ශරීර සාම්පල රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඇති බවත්, පටක සාම්පල ද පරීක්ෂා කිරීම සඳහා ලබාගෙන ඇති බවත්, මරණයට හේතුව විමර්ශන මට්ටමේ පවතින බවත් 2026.07.09 වන දින මූලික පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන ලද අධිකරණ වෛද්‍යවරිය විසින් සිය වාර්තාවෙහි සඳහන් කර ඇත. එසේම, මෙම රැඳවියාගේ මරණය සම්බන්ධයෙන් රත්ගම පොලිස් ස්ථානය මගින් අංක 15197/26 යටතේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

එසේම, මීගමුව බන්ධනාගාරයේ සිට අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියන් අතරින් උඩවල හේවගේ සඳුන් චතුරංග (සැක අංක 4008) යන රැඳවියා 2026.07.07 වන දින අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත පැමිණ ඇති අතර, ඔහු අසනීප තත්ත්වයෙන් පසුවීම හේතුවෙන් එදිනම එනම්, 2026.07.07 වන දින රාත්‍රියේ අඟුණකොළපැලැස්ස රෝහලට ඇතුළත් කර ඇත. එදින රාත්‍රී 10.30ට ඔහු රෝහලේ දී මිය ගොස් ඇති අතර, තංගල්ල මූලික රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් 2026.07.09 වන දින ඔහුව පරීක්ෂා කර ඇති බවත්, ශරීර සාම්පල පරීක්ෂාවන්

සඳහා ලබාගෙන ඇති බවත්, මරණයට හේතුව විමර්ශන මට්ටමේ පවතින බවත්, මියගිය පුද්ගලයාගේ ශරීරයේ බහුවිධ තුවාල පවතින බවත්, එකී සියලු තුවාල මොට ආයුධවලින් ඇති වූ ඒවා බවත්, වෙඩි වැදීම්, කැපීම්, පිහි ඇනුම් හෝ අස්ථි බිඳීම් වැනි තුවාල දක්නට නොමැති බවත් 2026.07.09 වන දින මරණ පරීක්ෂණය සිදු කරන ලද අධිකරණ වෛද්‍යවරයා විසින් සිය සඳහන් කර ඇත. එසේම, මෙම රැඳවියාගේ මරණය සම්බන්ධයෙන් නඩු අංක බී ආර් 20514/26 යටතේ අඟුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

ඒ අනුව ඉහතින් සඳහන් කරන ලද රැඳවියන් විසිදෙදෙනාට අමතරව, 2026.07.07 වන දින මීගමුව බන්ධනාගාරයෙන් බූස්ස බන්ධනාගාරය වෙත යොමු කරන ලද **ජයසූරිය කරුණාගේ නිශාන් බුද්ධික පෙරේරා (සැක අංක 3470)** සහ අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත යොමු කරන ලද **උඩවල හේවගේ සඳුන් චතුරංග (සැක අංක 4008)** යන රැඳවියන් දෙදෙනා ද 2026.07.07 වන දින රාත්‍රී කාලයේ දී මියගොස් ඇති බව නිරීක්ෂණය වේ.

මීට අමතරව මීගමුව බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කර එවන ලද රැඳවියෙකු 2026.07.07 දින ප.ව. 9.55ට අයි (I) වාට්ටුවේ පිටුපස ප්‍රදේශයේ ගෙල වැළලා ගැනීමෙන් මියගිය බවත්, එසේ මිය ගියේ සිර අංක 52690 දරන රත්නවේලු අවිෂ්ක ගයාන් නමැති රැඳවියා බවත්, ඔහු 2026.07.01 දින විනය හේතු මත මීගමුව බන්ධනාගාරයෙන් වැලිකඩ බන්ධනාගාරයට මාරු කර තිබූ බවත් වැලිකඩ බන්ධනාගාර අධිකාරි සමන්ත මහානාම මහතා විසින් සඳහන් කර ඇත. ඒ අනුව එකී රැඳවියා 2026.07.05 සහ 06 දිනවල මීගමුව බන්ධනාගාරයේ සිදු වූ සිදුවීමට පෙර වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කරන ලද රැඳවියෙකු වන බවට කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

2026.07.05 වන දින සහ 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් බන්ධනගාර පරිශ්‍රයේ තිබූ ගොඩනැගිලි වලට හානි සිදු වී ඇත. ඒ අනුව 2026.07.10 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් මීගමුව බන්ධනාගාරය වෙත ගොස් සිදු කළ ස්ථානීය පරීක්ෂාවේ දී බන්ධනාගාර රෝහල, බෙහෙත් ගබඩාව, නිලධාරී කාර්යාල, මූලික ගබඩාව, බන්ධනාගාර අධිකාරී කාර්යාලය, ප්‍රධාන ජේලර්වරයාගේ කාර්යාලය, ජේලර්වරුන්ගේ විවේකාගාරය, සළාක කාමරය, දුරකථන ක්‍රියාකරු කාමරය, බන්ධනාගාරයේ රූපවාහිනි සහ සීසීටීවී පද්ධති, ස්කෑනර් යන්ත්‍රය වැනි ස්ථාන සහ අත්‍යවශ්‍ය සම්පූර්ණයෙන්ම පාහේ විනාශ කර ඇති බව නිරීක්ෂණය වී ඇත. එසේම, රැඳවියන් රඳවා සිටින වාට්ටුවල වහලවල් සහ දොරගුළු ද රැඳවියන් විසින් කඩා දමා ඇති බව රැඳවියන් සහ නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත.

මීගමුව බන්ධනාගාරයේ පිරිමි අංශයේ හටගත් ගැටුම් හේතුවෙන් එම අංශයේ රැඳවියන්ගේ කෑකෝ ගැසීම් ඇසී කාන්තා අංශයේ රැඳවියන් ද බන්ධනාගාරයේ වහලට නැඟ කලහකාරී ලෙස හැසිරී ඇති බව පෙනී යයි. කාන්තා අංශයේ සිටින ඇතැම් රැඳවියන්ගේ ඥාතීන් පිරිමි අංශයේ සිටින බැවින් එකී පිරිමි රැඳවියන් හට පීඩාවන් සිදුවන බවට පවසමින් කාන්තා රැඳවියන් විසින් කෑගසමින්, ඔවුන් නැඟ

සිටි වහලේ උළු කැට ගලවා නිලධාරිණියන් හට පහර දෙමින් ගල් සහ පොලු ප්‍රහාර ද එල්ල කරමින් කලහකාරී ගෙස හැසිරුණු බව කාන්තා අංශයේ නිලධාරිණියන්ගේ සහ රැඳවියන්ගේ ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත. එබැවින් බන්ධනාගාරයේ කාන්තා අංශයේ ගේට්ටුව වසා සියලු නිලධාරීන් බන්ධනාගායෙන් පිටතට පැමිණි බවත් මීගමුව බන්ධනාගාරයේ කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී මිය විසින් ප්‍රකාශ කර ඇත. කාන්තා රැඳවියන් විසින් කාන්තා අංශයේ ගොඩනැගිලි වලට හානි කර ඇති අතර, ප්‍රධාන ගේට්ටුවේ අඟුල, අමුත්තන් පෙන්වන ස්ථානයේ වහල සහ දැල් ආවරණය, භාණ්ඩ ගබඩා කර තිබූ ස්ථානය, ජේලර් කාමාරය සහ ඒවායෙහි තිබූ භාණ්ඩ ආදිය විනාශ කර තිබූ බව ද මීගමුව බන්ධනාගාරයේ කාන්තා සැරයන් දේවිකා නිරෝෂණී මිය විසින් සඳහන් කර ඇත.

තවද, 2026.07.06 වන දින ඇති වූ සිදුවීමෙන් පසුව මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව පහත පරිදි මීගමුව බන්ධනාගාරයේ සිටි පිරිමි සහ කාන්තා රැඳවියන් වෙනත් බන්ධනාගාර වෙත යොමු කර ඇත.

1. දුම්බර බන්ධනාගාරය - රැඳවියන් 401
2. අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය - රැඳවියන් 290
3. කුරුවිට බන්ධනාගාරය - රැඳවියන් 188
4. වැලිකඩ බන්ධනාගාරය - රැඳවියන් 160
5. වාරියපොළ බන්ධනාගාරය - රැඳවියන් 143
6. බූස්ස බන්ධනාගාරය - රැඳවියන් 127
7. අනුරාධපුර බන්ධනාගාරය - රැඳවියන් 119
8. පොළොන්නරුව බන්ධනාගාරය - රැඳවියන් 60
9. යාපනය බන්ධනාගාරය - රැඳවියන් 60
10. මඩකලපුව බන්ධනාගාරය - රැඳවියන් 60
11. මොණරාගල බන්ධනාගාරය - රැඳවියන් 40
12. කළුතර බන්ධනාගාරය - රැඳවියන් 10
13. පල්ලන්සේන බන්ධනාගාරය - රැඳවියන් 61

කෙසේවෙතත් 2026.07.05 වන දින ඇති වූ සිදුවීමෙන් පසුව ඊට අදාළව කිසිදු රැඳවියෙකු එලෙස මාරු කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. 2026.07.05 වන දින ද රැඳවියන් දෙදෙනෙකු මිය ගොස් තවත් රැඳවියන් පිරිසක් තුවාල ලබා ඇති අතර, බන්ධනාගාරයේ ගොඩනැගිලි වලටද විශාල හානියක් සිදුව තිබියදී එකී ගැටුමට මුල් වූ රැඳවියන් හඳුනාගෙන වෙනත් ස්ථානයකට මාරු කිරීමට බන්ධනාගාරයේ පාලනාධිකාරිය විසින් පියවරක් ගෙන නොමැති බව ද නිරීක්ෂණය වේ.

# 12. නීතිමය විශ්ලේෂණය

## 12.1 වධහිංසා පැමිණවීම සහ අවම බලය

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අදාළ වන ප්‍රධාන නීතිමය රාමුව 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත මගින් ස්ථාපිත කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දණ්ඩ නීති සංග්‍රහය, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමකට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය පනත, බන්ධනාගාර නීති හා රෙගුලාසි සහ බන්ධනාගාර ස්ථාවර නියෝග ද අදාළ වේ.

බන්ධනාගාර ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ බන්ධනාගාර නිලධාරීන් විසින් බන්ධනාගාරය තුළ සාමය, විනය සහ යහපත් පාලනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර, නීත්‍යානුකූල නියෝගයකට අනුකූල වීමට පුද්ගලයෙකුට බල කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන බල ප්‍රමාණය භාවිත කළ හැකිය. ඒ අනුව, බන්ධනාගාර නිලධාරියෙකුට බලය භාවිත කිරීමේ අවස්ථාවක් පැවතිය ද, එම බලය අසීමිත බලයක් නොවන අතර, එය සාධාරණ ලෙස අවශ්‍ය වන ප්‍රමාණයට පමණක් සීමා විය යුතුය. “බලය යෙදවීම” යන්නෙහි ප්‍රමාණය නීතියෙන් නිසි ලෙස විස්තර කර නැත. සියලුම ආකාරයේ වධහිංසා හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට ලක් කිරීම නීතියෙන් තහනම් කර ඇති නිසා බලය යෙදවීමේදී එය වධහිංසා හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලක් නැතහොත් දඬුවමක් නොවිය යුතු ය. <u>**සමන්**</u> **එදිරිව** <u>**ලීලදාස සහ අනෙකුත් අය**</u> [(1989) 1 Sri LR 1] යන ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවේදී ප්‍රනාන්දු විනිසුරුවරයා විසින් බන්ධනාගාර ආඥා පනත ප්‍රකාරව බලය යෙදවීමේදී අනුගමනය කළ යුතු සීමා පිළිබඳව පහත පරිදි දක්වා ඇත.

“බන්ධනාගාර ආඥා පනතේ 132 වන විධිවිධානයට අනුව සෑම බන්ධනාගාර නිලධාරිකුම රැඳවියන්ට මානුෂීය ලෙස සහ කරුණාවෙන් සැලකිය යුතු ය. විනය ක්‍රියාත්මක කිරීමේදී ඇතැම් අවස්ථාවලදී පමණක් යම් බලයක් යෙදවීම අනුමත කළ හැකි අතර, යම් තත්ත්වයන්හිදී බලය භාවිත කිරීම අධික ද යන්න තීරණය කිරීම සඳහා විවිධ ප්‍රමිතීන් අනුගමනය කළ හැකි ය. අනපේක්ෂිත අවස්ථාවකදී බලය යෙදවීමේදී ක්‍රියාව සහ ප්‍රතික්‍රියාව කලාතුරකින් ඉතා හොඳින් සමබර කළ හැකි අතර, 132 වන විධිවිධානය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සෑම අවස්ථාවකදීම ප්‍රායෝගිකව කළ නොහැකි ය. බැටන් පොල්ලකින් කරන එක් පහරදීමක් නීත්‍යානුකූල විය හැකි අතර එහෙත් තර්කානුකූලව ගැනීමේදී කලාතුරකින් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලක් නැතහොත් දඬුවමක් විය හැකිය. නමුත් මෙම නඩුවේදී මෙන් පයින් ගැසීමෙන් පහරදීමෙන් ආරම්භ වී පෙත්සම්කරු නියෝගයට කීකරු වීමෙන් පසුව ද දරුණු ලෙස නොනවත්වා බැටන් පොල්ලකින් නැවත නැවත පහර දීම කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලක් නැතහොත් දඬුවමක් ලෙස සැලකිය හැකි බව දක්වා ඇත.”

වධදීම සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුතිය ක්‍රියාත්මක කරන 1994 අංක 22 දරන වධදීම සහ අනිකුත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුති පනත මගින් වධහිංසා පැමිණ වීම වරදක් ලෙස දක්වා ඇත. එම පනතේ 12 වන වගන්තියට අනුව, වෙනත් තැනැත්තෙකු හෝ තුන්වන තැනැත්තෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූද, එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තා බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා වෙනත් යම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනාවක් ගෙන දෙන්නා වූ ද ක්‍රියාවක් 'වධදීම' යන්නෙන් අදහස් වේ.

තවද, රැඳවියන්ට පහර දීමෙන් වළකින ලෙසට සහ රැඳවියන් සමඟ කටයුතු කිරීමේදී බන්ධනාගාර නිලධාරීන් කිසිදු පහර දීමේ ක්‍රියාවකට සම්බන්ධ නොවන බවට වගබලාගන්නා ලෙස 2018.07.30 දින නිකුත් කරන ලද අංක 10/2018 දරණ බන්ධනාගාර චක්‍රලේඛය මඟින් සියලුම බන්ධනාගාර අධිකාරිවරුන්ට බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් විසින් නියෝග කර තිබෙන අතර ශ්‍රී ලංකා ජනරජයේ දණ්ඩ නීති සංග්‍රහයේ 310 වගන්තිය යටතේ ඕනෑම පුද්ගලයෙකුට හානියක් සිදු කිරීම වරදක් බව අවධාරණය කර ඇත.

<u>අමල් සුදත් සිල්වා</u> එදිරිව <u>කොඩිතුවක්කු</u> [(1987) 2 Sri LR 119] නඩු තීන්දුවේදී අතුකෝරාල විනිසුරුවරයා ප්‍රකාශ කර ඇත්තේ "පෙත්සම්කරු කිසිදු අනුකම්පාවක් හිමි විය නොවිය යුතු ගණයේ දරුණු අපරාධකරුවෙකු වුවත්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති අයිතීන් ප්‍රජාතාන්ත්‍රික රාමුවක් තුළ ආරක්ෂා කිරීමට නම්, එවැනි දරුණු අපරාධකරුවෙකුට වුවද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති ආරක්ෂාවන් සැලසිය යුතුය" යනුවෙනි. ඒ හා සමානවම, **<u>සෙන්තිල්නායගම්</u> එදිරිව <u>සෙනෙවිරත්න</u>** [(1981) 2 Sri L R 187] නඩු තීන්දුවේ කොලින් තෝම් විනිසුරුවරයාගේ අදහස් උපුටා දක්වමින් **<u>ඩිල්ෂාන් තිලකරත්න සහ කුමාරිහාමි</u> එදිරිව <u>සැරයන් ඩග්ලස් ඇල්ලේපොළ සහ අනෙකුත් අය</u>** (SC FR 578/2011) යන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙහි අවධාරණය කරනු ලැබුවේ 'ප්‍රශංසනීය වාර්තා' නොමැති පුද්ගලයන්ට ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර ඇති අයිතීන් වන පෞද්ගලික නිදහස සහ ආරක්ෂාව භුක්ති විඳීමට ඉඩ සලසා දිය යුතු අතර, 'කුප්‍රකට' හෝ 'දරුණු ගණයේ' අපරාධකරුවෙක් වුවද වධහිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලුම පුරවැසියන් සඳහා ඔවුන්ගේ සමාජ පසුබිම හෝ ජීවන තත්ත්වය කුමක් වුවත් අදාළ වන අතර එබැවින් සිරකරුවන් වූ පමණින් අධික හා අනවශ්‍ය ලෙස බලය යෙදීම සාධාරණීකරණය කළ නොහැකි බව පැහැදිලි වේ.

ඉහත කී නෛතික රාමුව තුළ මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී, 2026.07.05 වන දින ඇති වූ සිදු වීමෙන් පසුව 2026.07.06 වන දින උදෑසන මීගමුව බන්ධනාගාරය තුළ සාමකාමී වාතාවරණයක් පැවති බවත්, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික

බලකා නිලධාරීන් විසින් බන්ධනාගාරය තුළට ගොස් රැඳවියන් හට පහර දුන් බවත්, ඒ හේතුවෙන් රැඳවියන් විසින් පෙරලා එම නිලධාරීන් හට පහර දීමෙන් විශාල ගැටුමක් නිර්මාණය වූ බවත් ඇතැම් රැඳවියන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව අනාවරණය වී ඇත. යම් හෙයකින් එවැනි පහරදීම් සිදු වී ඇත්නම් එලෙස පහරදීමට හේතු වූ කරුණු මොනවාද යන්න සහ පහරදීම් සිදු කර ඇත්තේ කෙසේද යන්න පිළිබඳව විමර්ශනය කර එකී පහරදීම් සිදු කර ඇත්තේ රැඳවියන් පාලනය කිරීම සඳහා අවශ්‍ය බලය යෙදවීමක් ලෙස ද යන්න තහවුරු කර ගත යුතු ය. බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් එවැනි පහරදීම් සිදු කර ඇත්තේ අධික ලෙස බලය භාවිත කරමින් රැඳවියන් පීඩාවට පත්වන අයුරින් නම් එකී පහරදීම් බන්ධනාගාර ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ බන්ධනාගාර නිලධාරීන් හට පවරා ඇති බලය ඉක්මවා යාමක් වන අතර, ඒ තුළින් රැඳවියන් වධහිංසාවට ලක්වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කිසිම තැනැත්තෙකු කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට ලක් නොකළ යුතුය යන රැඳවියන්ගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය වීමක් ද සිදු වේ. කෙසේවෙතත් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් විසින් එවැනි පහරදීම් සිදු කළ බවට තහවුරු වන ආකාරයේ නිශ්චිත සාක්ෂි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී නොමැත.

තවද, 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමෙන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් දසදෙනකුට දිවි අහිමි වී ඇති අතර, තවත් නිලධාරීන් පිරිසක් තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇති බව අනාවරණය වී ඇත. එම නිලධාරීන්හට රැඳවියන් විසින් පහරදීම් සිදු කළ බවට නිලධාරීන් සහ රැඳවියන් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. එලෙස රැඳවියන්ගේ පහරදීම් හේතුවෙන් නිලධාරීන් මරණයට පත්වීම සහ තුවාල ලැබීම සිදු වී ඇත්නම් එකී රැඳවියන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ නීති ප්‍රතිපාදන ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. කෙසේවෙතත් ඒ පිළිබඳව තවදුරටත් විමර්ශනය කර වගකිව යුතු පිරිස හඳුනාගත යුතුව ඇත.

මීට අමතරව මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් වෙනත් බන්ධනාගාරවලට මාරු කර යැවීමෙන් පසුව වැලිකඩ, අඟුණකොළපැලැස්ස, බූස්ස සහ මොණරාගල යන බන්ධනාගාර වෙත මාරු කර යවන ලද රැඳවියන් හට එම බන්ධනාගාරවල සිටි නිලධාරීන් විසින් පහරදීම් සිදු කළ බවට කොමිෂන් සභාව වෙත තොරතුරු ලැබී ඇත. මෙවැනි පහරදීම් සම්බන්ධයෙන් අදාළ වන වැදගත්ම සාක්ෂිය වන්නේ අධිකරණ වෛද්‍ය වාර්තාවන් ය. එහෙත් එකී රැඳවියන්ගේ අධිකරණ වෛද්‍ය වාර්තා මෙතෙක් කොමිෂන් සභාව වෙත ලැබී නොමැත. එසේම, එවැනි පහරදීම් සිදු වූ බවට තහවුරු කරගත හැකි වන ආකාරයේ වෙනත් සාක්ෂි ද ලැබී නොමැත. යම්හෙයකින් එලෙස බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවියන් හට පහරදීම් සිදු කර ඇත්නම්, ඒ තුළින් රැඳවියන් වධහිංසාවට ලක්වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කිසිම තැනැත්තෙකු කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට ලක් නොකළ යුතුය යන රැඳවියන්ගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය වීමක් සිදු වේ. එසේහෙයින් ඒ පිළිබඳව තවදුරටත්

විමර්ශනය කර එවැනි පහරදීම් සිදුව තිබේ ද යන්න සහ එසේනම් ඒවාට වගකිව යුතු පිරිස අනාවරණය කරගත යුතුව ඇත.

බන්ධනාගාර ආඥාපනතේ 77 වන වගන්තිය මගින් බන්ධනාගාර නිලධාරීන් විසින් අවි භාවිත කිරීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන සලසා ඇත. සිරකරුවෙකු පලා යාමට හෝ පලා යාමට උත්සාහ කිරීම, සිරකරුවන්ගේ සාමූහික කැරැල්ලක් හෝ කැළඹීමක් ඇතිවීම, හෝ සිරකරුවන් විසින් බන්ධනාගාරයේ දොරටු, ගේට්ටු හෝ බිත්ති බලහත්කාරයෙන් විවෘත කිරීමට හෝ කඩා දැමීමට උත්සාහ කිරීම වැනි නිශ්චිත අවස්ථාවලදී නීතියෙන් නියම කර ඇති සීමාවන්ට යටත්ව අවි භාවිත කළ හැකිය. එම වගන්තිය යටතේ අවි භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී අනතුරු ඇඟවීමක් කිරීම ඇතුළු ආරක්ෂණ විධිවිධාන ද පවතී. විශේෂයෙන්ම බන්ධනාගාර ආඥාපනතේ 77(4) වන වගන්තිය අනුව, අවි භාවිත කිරීමේදී හැකිතාක් දුරට එම භාවිතය මරණය සිදු කිරීම වෙනුවට පුද්ගලයා අක්‍රීය කිරීමේ අරමුණින් සිදු කළ යුතු බවට සඳහන් කර ඇත.

ඒ අනුව බන්ධනාගාරයක ඇතිවන කැරැල්ලක් හෝ ප්‍රචණ්ඩ තත්ත්වයක් පාලනය කිරීමේදී අවි භාවිත කිරීමේ නීත්‍යානුකූල බලය පැවතිය ද, එම බලය භාවිත කිරීමේ ආකාරය, අවශ්‍යතාවය සහ ප්‍රමාණාත්මකභාවය වෙන වෙනම සලකා බැලිය යුතු වේ. 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමේ දී රැඳවියන් මීගමුව බන්ධනාගාරයේ යකඩ ගේට්ටුව ද කඩා බිඳ ලී දොර දක්වා පැමිණ එය ද කඩා පිටතට පැමිණීමට උත්සාහ කළ බවට නිලධාරීන්ගේ මෙන්ම රැඳවියන්ගේ ප්‍රකාශ මගින් අනාවරණය වී ඇත. එසේම, මාධ්‍ය මගින් ප්‍රචාරය වූ වීඩියෝ දර්ශන සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ වීඩියෝ දර්ශන වලින් ද ඒ බව අනාවරණය වී ඇත. ඒ අවස්ථාවේදී බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් ලී දොර දෙසට සහ ලී දොරෙහි කවුළුවෙන් ඇතුළට වෙඩි තබා ඇත. ලී දොර ආසන්නයේ ඇති බිත්තියෙහි වෙඩි වැදීමෙන් ඇති වූ සලකුණු ඇති බවට කොමිෂන් සභාවේ නිලධාරීන් මීගමුව බන්ධනාගාරය වෙත ගිය අවස්ථාවේ දී නිරීක්ෂණය වී ඇත. ඒ අනුව බන්ධනාගාර නියාමක වේරකේ නිලධාරියා විසින් අදාළ වෙඩි තැබීම සිදු කර ඇත්තේ රැඳවියන් විසින් මීගමුව බන්ධනාගාරයේ ලී දොරටුව කඩා පිටතට පැමිණීමට උත්සාහ කළ අවස්ථාවේදී වන බැවින් ඉහත කී බන්ධනාගාර ආඥාපනතේ 77 වන වගන්තිය ප්‍රකාරව ඒ සඳහා බලය හිමිවන බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් එම වෙඩි තැබීම සිදු කර ඇති ආකාරය සහ ඒ තුළින් යම් හානියක් සිදුව ඇත්නම් එම හානි එකී වගන්තිය මගින් ලබා දී ඇති බලසීමාව යටතේ සලකා බැලිය හැකි ද යන්න තවදුරටත් විමර්ශනය කළ යුතු ය.

### 12.2 නෛතික බලය ක්‍රියාත්මක කිරීම

බන්ධනාගාර ආඥාපනතේ 78 වන වගන්තිය මගින් බන්ධනාගාර විනයට පටහැණිව රැඳවියෙකු විසින් සිදුකරන ලද ක්‍රියාවන් වරදක් වන ආකාරය පිළිබඳව දක්වා ඇත. ඒ අනුව, වෙනත් රැඳවියෙකුට හානි සිදුකිරීම, වෙනත් රැඳවියෙකුව හානි සිදුකිරීමට පෙළඹවීම, බන්ධනාගාර අධිකාරීවරයාගේ හෝ බන්ධනාගාර නිලධාරීන්ගේ නීත්‍යානුකූල නියෝග වලට කීකරු නොවීම, කලබලකාරී තත්ත්වයක්

ඇති කිරීම සහ කැළඹිලිකාරී ලෙස හැසිරීම බන්ධනාගාර ආඥාපනත යටතේ වැරදි ලෙස හැඳින්වේ. බන්ධනාගාර ආඥාපනතේ 79 වන වගන්තිය මගින් එවැනි වරදකරුවන්ට බන්ධනාගාර ආඥාපනත යටතේ දඬුවම් කිරීමට බන්ධනාගාර අධිකාරීවරයාට බලය ලබා දේ. ආඥා පනතේ 81 (1) (ආ) වගන්තියට අනුව, යම් රැඳවියෙකු බන්ධනාගාර විනයට පටහැණිව කටයුතු කර ඇති බවට චෝදනා ලබා ඇත්නම් සහ ආඥා පනතේ 79 වන වගන්තිය ප්‍රකාරව අදාල වැරදිකරුට නිසි ලෙස දඬුවම් කළ නොහැකි බවට බන්ධනාගාර අධිකාරීවරයා තීරණය කරන්නේ නම්, අදාල වැරදිකරුව බන්ධනාගාර අධිකාරීවරයා විසින් බන්ධනාගාර විනිශ්වය සභාවක් හමුවට ඉදිරිපත් කළ හැකිය. 81 (1) (ආ) වගන්තිය මගින් කස පහර හෝ වේවැල් පහර විසි හතරකට නොවැඩි ප්‍රමාණයකින් අදාළ වැරදිකරුට ශාරීරික දඬුවම් ලබාදීමට බන්ධනාගාර විනිශ්චය සභාවට බලය ලබා දී ඇත. කෙසේවෙතත් 2005 අංක 23 දරණ ශාරීරික දඬුවම් පිලිබඳ (අහෝසි කරන ලද) පනත මගින් ශාරීරික දඬුවම් ලබාදීම අවලංගු කර ඇත.

ඒ අනුව 2026.07.05 වන දින මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් පිරිසක් විසින් වාට්ටු වලට ගොස් බන්ධනාගාරයේ පරිපාලන කටයුතු සඳහා නිලධාරීන් හට සහය දක්වන 'පාට්' ලෙස හඳුන්වන රැඳවියන් සොයමින් ඔවුන් හට පහර දීම ඉහත කී 78 වගන්තිය ප්‍රකාරව රැඳවියන් විසින් සිදු කරන ලද වරදක් ලෙස සැලකිය හැකි බව තහවුරු වේ. එසේම, එකී වගන්තිය අනුව එවැනි වැරදි සිදු කරනු ලබන රැඳවියන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බන්ධනාගාර අධිකාරිවරයා වෙත බලය පැවරී ඇත. එසේවුවද එකී ගැටුම ඇති කළ රැඳවියන් හඳුනාගෙන ඔවුන්හට දඬුවම් ලබා දීමට හෝ අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට මීගමුව බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින් කටයුතු කර ඇති බව මේ වන තෙක් අනාවරණය නොවේ.

## 13. නිගමනය

ඉහත කරුණු සමස්තයක් ලෙස සලකා බැලීමේදී, 2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් හුදෙක් එක් අවස්ථාවකදී ඇති වූ රැඳවියන් අතර ගැටුමකට පමණක් සීමා වූ සිදුවීමක් නොවන අතර, බන්ධනාගාරයේ පවතින රැඳවියන්ගේ අධික තදබදය, නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, 'පාට්' යනුවෙන් හඳුන්වමින් රැඳවියන්ගේ සහය ලබාගැනීම, බන්ධනාගාරයේ ආරක්ෂක හා පරිපාලන පද්ධතියේ පවතින දුර්වලතා, මත්ද්‍රව්‍යහා ඖෂධ වෙත රැඳවියන්ට ප්‍රවේශ වීමට හැකි වීම සහ හදිසි තත්ත්වයකදී ගත යුතු ආරක්ෂක පියවර සම්බන්ධයෙන් පැවති අඩුපාඩු යනාදී සාධක ගණනාවක එකතුවක ප්‍රතිඵලයක් ලෙස එය වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ.

විශේෂයෙන්ම, බන්ධනාගාර නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා රැඳවියන් යොදාගැනීම මඟින් රැඳවියන් අතර නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන සහ එසේ නොකරන පිරිස ලෙස භේදයක් නිර්මාණය වී ඇති අතර, එම තත්ත්වය 2026.07.05 දින ඇති වූ ගැටුම තීව්‍ර වීමට බලපෑ සාධකයක් ලෙස පෙනී යයි. එබැවින් බන්ධනාගාර පද්ධතිය තුළ පරිපාලන කටයුතු සඳහා

රැඳවියන්ගේ සහය ලබා ගැනීම වෙනුවට පුහුණුව ලැබූ ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් යෙදවීම අත්‍යාවශ්‍ය බව පැහැදිලි වේ.

එසේම, 2026.07.05 දින සිදුවීමෙන් පසුවද බන්ධනාගාරයේ ආරක්ෂක තත්ත්වය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත්ව නොතිබූ බවත්, වාට්ටුවල දොරගුළු විනාශ වී තිබීම, රැඳවියන් මත්ද්‍රව්‍යහා ඖෂධ භාවිත කර තිබීම සහ රැඳවියන්ගේ හැසිරීම අන් දිනවලට වඩා වෙනස්ව පැවති බවත් නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ ප්‍රකාශ මඟින් අනාවරණය වේ. එවැනි පසුබිමක 2026.07.06 දින නිරායුධ බන්ධනාගාර නිලධාරීන් සහ තක්සේරු කටයුතු සඳහා පැමිණි රජයේ නිලධාරීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකර බන්ධනාගාරය තුළට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ එම අවස්ථාවේ පැවති ආරක්ෂක සැලසුම් ප්‍රමාණවත්ද යන්න පිළිබඳව ගැටලු මතු වේ.

2026.07.06 දින සිදුවීම සම්බන්ධයෙන් රැඳවියන් සහ නිලධාරීන් විසින් එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කර ඇති බැවින්, එදින ගැටුම ආරම්භ වූ ආකාරය සහ ඉන් අනතුරුව සිදු වූ වෙඩි තැබීම්, මරණ හා තුවාල සම්බන්ධයෙන් මේ වන විට නිශ්චිත නිගමනයකට පැමිණීම අපහසු වේ. විශේෂයෙන්ම පශ්චාත් මරණ පරීක්ෂණ හා අධිකරණ වෛද්‍යවාර්තා සහ අනෙකුත් විද්‍යාත්මක සාක්ෂි සම්පූර්ණයෙන් ලැබෙන තෙක් මරණ හා තුවාලවල නිශ්චිත හේතුව තීරණය කිරීම සුදුසු නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. කෙසේවෙතත්, එදින සිදු වූ සිදුවීමෙන් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් දස දෙනෙකු සහ රැඳවියන් විසිදෙදෙනෙකු මියයාමත්, නිලධාරීන් සහ රැඳවියන් විශාල පිරිසක් තුවාල ලැබීමත් මඟින් තත්ත්වයේ බරපතලභාවය පැහැදිලි වේ.

තවද, 2026.07.05 දින සිදුවීමෙන් පසුව ගැටුමට සම්බන්ධ වූ හෝ එය මෙහෙයවූ රැඳවියන් හඳුනාගෙන ඔවුන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීම හෝ තත්ත්වය පාලනය කිරීම සඳහා කඩිනම් පියවර නොගැනීම, 2026.07.06 දින තත්ත්වය නැවත උග්‍ර වීමට බලපෑ හේතුවක් වූවා විය හැකිය. මෙම සිදුවීමේදී රැඳවියන් විසින් සිදු කළ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වගකීම පැවරීම මෙන්ම, එවැනි තත්ත්වයක් ඇතිවීමට හා වර්ධනය වීමට ඉඩ සැලසූ ආයතනික, පරිපාලන හා ආරක්ෂක අඩුපාඩු සම්බන්ධයෙන්ද වගකීම තීරණය කිරීම අවශ්‍ය වේ.

තවද, මෙම සිදුවීමෙන් බන්ධනාගාර නිලධාරීන්ගේ සහ රැඳවියන්ගේ ජීවිත අහිමි වීම, බන්ධනාගාර නිලධාරීන් සහ රැඳවියන් විශාල පිරිසක් තුවාල ලැබීම සහ බන්ධනාගාරයේ අත්‍යාවශ්‍ය පරිපාලන හා ආරක්ෂක පහසුකම් විශාල වශයෙන් විනාශ වීම සැලකිල්ලට ගනිමින්, මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා වගකිව යුතු සියලු පාර්ශ්වයන්ගේ ක්‍රියාකාරීත්වය හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය බව කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

## 14. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ

2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයේ දී අනාවරණය වී ඇති කරුණු අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

1. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේදී බන්ධනාගාර හා රැඳවුම් මධ්‍යස්ථාන විස්සක් උපයෝගී කරගනිමින් පුළුල් අධ්‍යයනයක් සිදුකර 2020.11.05 වන දින එහි නිර්දේශ නිකුත් කර ඇත. එසේම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වරින්වර බන්ධනාගාර පාලනාධිකාරිය සමඟ සාකච්ඡා කර එකී නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට දැනුම්වත් කර ඇත. එකී නිර්දේශ (උදා: රැඳවියන් වෙන් කර තැබීම, බන්ධනාගාර වල ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා සිටින බැවින් ඔවුන්හට ප්‍රමාණවත් පහසුකම් සැලසීම, රැඳවියන් හට සිය ගැටලු ඉදිරිපත් කළ හැකි අයුරින් අභ්‍යන්තර සහ බාහිර දුක්ගැනවිලි යාන්ත්‍රණයක් ඇති කිරීම, සුදුසුකම් ලත් නිලධාරීන් බන්ධනාගාරයන්හි සේවය සඳහා බඳවා ගැනීම, නිලධාරීන් හට රැඳවියන් සමඟ කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුහුණුවීම් ලබා දීම) ක්‍රියාත්මක කළේ වී නම්, මෙවැනි ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් වළක්වා ගත හැකිව තිබූ බව කොමිෂන් සභාවේ අදහස යි. එසේහෙයින් 2020 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් බන්ධනාගාර වල භෞතික තත්ත්වයන් සහ පරිපාලනය වැඩි දියුණු කිරීම, සිරකරුවන්ගෙන් සුභසාධනය ඉහළ නැංවීම සහ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය කිරීම යන තේමාවන් යටතේ නිකුත් කරන ලද නිර්දේශ ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2. 2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමේ දී රැඳවියන් අතර, ඇති වූ ගැටුම්කාරී තත්ත්වය මැඩපැවැත්වීමට සහ ඊට නිසි විසඳුම් ලබාදීමට බන්ධනාගාර පාලනාධිකාරිය අපොහොසත් වී ඇති බැවින්, නැවත එවැනි සිදුවීම් ඇති වීම වැළැක්වීම සඳහා විශේෂ කමිටුවක් පත් කර අධ්‍යයනයක් සිදු කර එකී කමිටුවේ නිර්දේශ මත සුදුසු පියවර ගැනීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

3. 2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය මත බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් දසදෙනෙකු සහ රැඳවියන් විසිදෙදෙනෙකු මියගොස් ඇති බවට වාර්තා වී ඇත. එසේම, තවත් බන්ධනාගාර නිලධාරීන් දාහත්දෙනෙකු තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇති බව ද වාර්තා වී ඇත. මෙහිදී බන්ධනාගාර නිලධාරීන් මියයාමට සහ තුවාල ලැබීමට හේතු වී ඇත්තේ රැඳවියන්

විසින් අමානුෂික ලෙස පහරදීම නිසා බව නිරීක්ෂණය වේ. ඒ අනුව රාජකාරී කාලය තුළ එසේ මිය යාමට සිදුවීම සම්බන්ධයෙන් රජය විසින් ඔවුන්ට (පවුල වෙත හෝ ඥාතීන් වෙත) චක්‍රලේඛ ප්‍රකාරව අදාළ වන්දි මුදල් සහ දීමනා ගෙවීමට කටයුතු කළ යුතු ය. එසේම, මෙම සිදුවීමේ දී තුවාල ලබා ප්‍රතිකාර ලබාගත් නිලධාරීන්ට සහ තවදුරටත් ප්‍රතිකාර අවශ්‍ය නිලධාරීන්ට ද ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

4. මෙම සිද්ධියට සම්බන්ධයක් නොමැති සමහර රැඳවියන් මරණයට පත්වීම හෝ තුවාල ලබා තිබීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වන්දි ගෙවීම හා වෙනත් පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

5. 2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය හමුවේ රැඳවියන් මිය ගියේ කෙසේ ද යන්න පිළිබඳව මෙතෙක් නිශ්චිත නිගමනයකට එළඹී නොමැති අතර, ඊට අදාළ නඩු කටයුතු අධිකරණයේ විභාග වෙමින් පවතින බැවින් එකී නඩු තීන්දු වලින් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට නීතිමය පියවර ගැනීමට හැකියාව පවතින බව පෙනී යයි. එබැවින් මේ අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා දීමට කොමිෂන් සභාව කටයුතු නොකරන අතර, එකී අධිකරණ ක්‍රියාවලියෙන් පසුව යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ වෙනත් තැනැත්තෙකු වගකීමෙන් බැඳේ නම් ඊට අදාළ නීතිමය පියවර අදාළ පාර්ශවයන් විසින් ගත යුතු ය.

6. 2026.07.06 වන දින මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමේ දී බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් ද එම ගැටුම පාලනයට අවි සහිතව සහ රහිතව යොදවා ඇති බවට මෙම විමර්ශනයේ දී කරුණු අනාවරණය වී ඇත. එම නිලධාරීන් විසින් මෙම ගැටුම වළක්වාලීමට සමානුපාතිකව අවශ්‍ය බලයට වඩා බලය ඉක්මවා කටයුතු කර තිබේද යන්න මෙම විමර්ශනයේ දී සලකා බලන ලද අතර, මෙම සිදුවීමේ දී සිදු කර ඇති වෙඩි තැබීම් පිළිබඳව ද විමර්ශනය කරන ලදී. එකී විමර්ශනයේ දී බන්ධනාගාර නිලධාරීන් මෙම ගැටුම වැළැක්වීමට වෙඩි තැබූ බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. නිලධාරීන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ අනුව ද එය තහවුරු වේ. එහෙත් පොලිස් සහ විශේෂ කාර්ය බලකා නිලධාරීන් අවි සහිතව සිටියද ඔවුන් වෙඩි තැබීම් සිදු නොකළ බව කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එසේවුවද ඇතැම් රැඳවියන්ගේ ප්‍රකාශ අනුව විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් වෙඩි තැබීම් සිදුකළ බවට කරුණු ඉදිරිපත් වී ඇත. කෙසේවෙතත් ඒ පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් වී නැත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඒ සම්බන්ධයෙන් සිදු කරන විමර්ශනයේ දී ඒ පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කළ යුතු ය.

7. 2026.07.05 සහ 2026.07.06 යන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය හමුවේ මීගමුව බන්ධනාගාරයේ සිටි රැඳවියන් වැලිකඩ, අඟුණුකොළපැලැස්ස, බූස්ස, දුම්බර, වාරියපොළ, කුරුවිට, යාපනය, මඩකලපුව, මොණරාගල, අනුරාධපුර සහ පොළොන්නරුව යන බන්ධනාගාර වෙත මාරු කර යවා ඇත. එකී බන්ධනාගාරවලට මාරු කර යැවීමෙන් පසුව ඒවායෙහි සිටින නිලධාරීන් විසින් එම රැඳවියන් හට පහරදෙන බවට මාධ්‍ය මගින් සහ යම් යම් පාර්ශව මගින් කරුණු ඉදිරිපත් වීමෙන් පසු ඒ පිළිබඳව අදාළ බන්ධනාගාර වෙත ගොස් අදාළ රැඳවියන් පරීක්ෂා කර ප්‍රකාශ ලබා ගැනීම කොමිෂන් සභාව විසින් සිදු කර ඇත. එම ප්‍රකාශ අනුව රැඳවියන් හට නිලධාරීන් විසින් පහරදීම් සිදු කර ඇති බවට කරුණු ඉදිරිපත්ව ඇත. ඒ අනුව අදාළ රැඳවියන් අධිකරණ වෛද්‍යවරුන් වෙත ඉදිරිපත් කිරීමටත්, බන්ධනාගාර තුළ දී රැඳවියන් හට සිදුවන පහරදීම් සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා එය වැළැක්වීමට පියවර ගන්නා ලෙසට කොමිෂන් සභාව විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දී ඇත. ඒ සඳහා විශේෂ අභ්‍යන්තර කමිටුවක් පත් කර විමර්ශනයක් සිදු කරන බව බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව දැනුම්වත් කර ඇත. ඒ අනුව එකී විමර්ශන සිදු කර අදාළ වගඋත්තරකරුවන් හඳුනා ගැනීමටත් ඔවුන්ට එරෙහිව විනය පියවර ගැනීමටත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කළ යුතු ය.

8. මෙවැනි ගැටුම්කාරී වාතාවරණ හමුවේ රැඳවියන් පාලනය කිරීමට අදාළව මාර්ගෝපදේශ පද්ධතියක් සකස් කිරීම සිදු කළ යුතු අතර, ඒ සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ඇතුළු විද්වත් කමිටුවක් ඊට පත්කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2027. 01 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දී සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් අනෙක් පිටුවෙහි ඇත. ⟶

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

02. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

03. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

04. ලේකම්, - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

05. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
බන්ධනාගාර මූලස්ථානය,
150, බේස්ලයින් පාර, කොළඹ 09.